# THE WHITE HACKLE

## JOURNAL OF THE SRI LANKA LIGHT INFANTRY

## ශ්‍රී ලංකා පාබල හමුදා සඟරාව








April - 2004



# මේජර් ජනරාල් වීවීආර් ද සිල්වා ආරඩබ්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී ගේ

# රෙම ශ්‍රීලපහ සංචාරය 2004.01.29.



සම්මාන පෙළපාලියේ උත්තමාචාරයට සිය සමාචාරය.



ප්‍රධාන දෙරටුව අභියසදී මධ්‍යස්ථාන සේනාවිධායක විසින් පිළිගත් මොහොත.



සම්මාන මුරය පරීක්ෂා කිරීම.



සම්මාන පෙළපාලියේ උත්තමාචාරය.



වර්ණ ධ්වජයන්ට ආචාර කරමින්.



කණ්ඩුලට සෙනෙහසින්.



නිළධාරීන් සමග සුහද පිළිසඳරක.



ශ්‍රීලපාහ නිළධාරීන් සමග සමූහ ඡායාරූපයකට පෙනී සිටි අයුරු.

# THE WHITE HACKLE

APRIL 2004, VOLUME 11 NO. 01 40TH ISSUE

## Headlines



*5 (ස්වේ) ශ්‍රීලපාහ රණවිරු ස්මාරකය වෙත මිය ගිය අයවලුන්ගේ ඥාතින් මල් කළඹ තබමින්........*

*4 පිටුව*


★ 2004 වර්ෂයේ සිංහල හා හින්දු අළුත් අවුරුදු පණිවුඩය 3

★ මියගිය රණවිරුවන් සිහි කිරීම 4

★ ඉරට සැතැප්මයි 6

★ වයිට් හැකල් සහරාව මෙතෙක් ආ ගමන් මගට තුති මල් 9

★ රෙජ් පුහුණු පාසල ශ්‍රීලපාහ 11

★ හෙළයේ නැගීම සහ බැසීම 12

★ 7 ශ්‍රීලපාහ 11 වන සංවත්සරය 15

★ Farewell Speech 16

★ රෙජ්මුබ නව නිවහනකට පිවිසි වගයි 24

★ දසුනේ හසුන 29

★ තල් අරමේ සිට 32




*7 ශ්‍රීලපාහ අණ දෙන නිළධාරී තුමන් 11 වන සංවත්සරයේදී සියළු නිලයින් ඇමතීම.*

*15 පිටුව*

*රෙජිමේන්තු අධිපති තුමන් විසින් රෙජිමුබ ශ්‍රීලපාහ නව නිවහනට පිවිසීම වෙනුවෙන් සමරු ඵලකය නිරාවරණය කිරීම..*

24 පිටු



**කවරයේ කථාව :-**

මේජර් ජනරාල් ටීටීආර් ද සිල්වා ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී මේජර් ජනරාල් නිළයට උසස් වීමෙන් පසුව රෙම ශ්‍රීලපාහ කල සංචාරයේ විශේෂ අවස්ථා.

PRINT WELL - 244 DAM STREET, COLOMBO 12.

THE WHITE HACKLE

SRI LANKA
LIGHT INFANTRY MAGAZINE

Col of the Regt.
Maj Gen N. Mallawaarachchi RWP, USP, ndc, psc

Centre Commandant
Col. JS Masakkara, RSP

*The White Hackle*, Staff

| | |
|---|---|
| Editor-in Chief | - Brig. RMD Rathnayaka RWP, RSP, USP, psc |
| Assistant Editor | - Lt. Col C Wimalasiri SLLI |
| Associate Editors | - Lt Col J R Kulatunga, RSP psc SLLI<br>Lt Col SWMTB Hulugalle SLLI<br>Capt THS Aravinda, RWP, RSP SLLI |
| Chief Consultant | - Maj Gen N. Mallawaarachchi RWP, USP, ndc, psc |
| Honorary Consultants | - Maj Gen HV Athukorale VSV, psc, FBIM (Rtd), (Reg Force)<br>Brig AER Abeysinghe KSV (Rtd) (Vol Force) |
| Publisher | - Regimental Centre Sri Lanka Light Infantry. |

*The White Hackle* is published quarterly under the supervision of the Regimental Centre Commandant to provide the Regiment with information on people, policies, operations, technical developments, views, opinions and ideas about the Sri Lanka Light Infantry. •Manuscripts of interest to the Regiment are invited. • Direct Communication is authorized to Editor, or Asst Editor, The White Hackle, Regimental Centre, Army Cantonment, Panagoda, Homagama. Phone 855204 or 855356 - 60 Extn. 7380 or 7404. • Individual paid subscriptions are available through the Regimental Adjutant, Sri Lanka Light Infantry. • Publication of this periodical is authorized by the Dte of PA, Army HQ CBO by letter No. A/275/27 of 16 Mar '94. • Use of funds for printing this publication has been approved by the Regimental Commander on 30th Aug 1993 at the Regimental Conference held at Welioya.

# Feedback

## අදහස් උදහස් හා විවේචන

# Readers Please Write in

The WHITE HACKLE, the Voice of the Sri Lanka Light Infantry Regiment is now firmly established. It has reached maturity. This is the 40th issue.

We should not rest on our laurels. Targets have to be set. Greater goals achieved. The success of WHITE HACKLE depends on combined efforts. Everyone has his contribution to make, and every contribution is most welcome. What is valued is our making the attempt, then we can surely do our bit. Express your thoughts, ideas, opinions, and criticisms, hopes and fears through 'THE WHITE HACKLE' the journal of the oldest and proudest Regiment of them all. If you have much to say about your Battalion's experience go ahead and write in to the 'WHITE HACKLE'. We are willing to accept and use what is of a standard, like sketches, stories and poems, whatever comes from your thoughts and your pen.

Our Motto is "Ich Dien" "I Serve". Let 'WHITE HACKLE' be a way to serve each other, our regiment and our country with our banner flying high as it always will.

Wishing you all the very best.

*Editor in Chief*

## හිතවත් පාඨකය. කරුණාකර ඔබගේ අදහස් අප වෙත එවන්න

ශ්‍රී ලංකා පාබල හමුදාවේ හඬ ඉතා උසස් ලෙස නංවන 'වයිට් හැකල්' සඟරාවේ හතළිස් වන කලාපයත් සමග එහි ළදරු අවධිය අවසන්කල අප ඉතා විශ්වාස වන්තව ඉදිරියට පිය ඔසවමින් පරිනත භාවයට පත් වෙමින් සිටින්නෙමු. රෝම අධිරාජ්‍යය ඉතා කෙටි කලකින් ගොඩ නැගුවක් නොවන අතර අපි ද පියවරින් පියවර ඉතා විශ්වාසවන්තව ස්ථිර අඩිතාලමක් සඳහා ඉදිරියට ගමන් කරමින් සිටින්නෙමු.

එනමුත් අප දැනට ලබා ඇති ප්‍රගතියෙන් සෑහීමකට පත්විය නොහැක. තව ඉදිරියට යා යුතු මග බොහෝ ය. එය දුෂ්කර ද නැතහොත් බාධාවකින් තොර වන්නේ දැයි තීරණය වන්නේ ඔබගෙන් ලැබෙන මහඟු සහයෝගය මතය. 'වයිට් හැකල්' සඟරාවේ ප්‍රගතිය සඳහා අප සියලු දෙනාටම ඉටු කිරීමට ඇති කාර්යභාරය ඉමහත් ය. ඔබගෙන් සුළුවෙන් හෝ අප වෙත ලැබෙන සහයෝගය සෑම අවස්ථාවකම අපි අගයමු. අවශ්‍ය වන්නේ ඔබගේ උත්සාහයයි. එයින් අප වඩාත් ධෛර්යමත් වන අතර අපගේ කාර්යය නිසි අයුරු ඉටු කිරීමට අවශ්‍ය පන්නරය ලබන්නෙමු.

මෙම සඟරාව පිළිබඳ හා එහි ලිපි රචනා පිළිබඳ ඔබගේ අවංක අදහස් හා විවේචන අප වෙත එවන්න. එය වයිට් හැකල් සඟරාවේ ඉදිරි ගමනට මහඟු අත්වැලකි. 'වයිට් හැකල් සඟරාව' ශ්‍රී ලංකා යුධ හමුදාවේ අභිමානවත් ඉතිහාසයට හිමිකම් කියන පෞඪතම රෙජිමේන්තුවක් වන ශ්‍රී ලංකා පාබල හමුදාව මගින් ත්‍රෛයි මාසිකව පල කරනු ලබයි.

මෙම පෞඪ රෙජිමේන්තුවේ සාමාජිකයෙකු වී සිටීම ගැන ඔබ ඔබ ගැනම ආඩම්බර විය යුතු ය. මෙම රෙජිමේන්තුව අනාදිමත් කලක් රැකගත් විලසට අප විසින් එය ඉදිරියට ද සුරැකිය යුතුය.

ඔබ බලඇණිවල යම් විශේෂ සිදුවීම් හා අවස්ථා පිළිබඳ ඔබ හට පැවසීමට ඇත්නම් 'වයිට් හැකල්' සඟරාව වෙත ලියන්න. ඔබගේ ලිපි ඉතා උසස් තත්වයක ඇතැයි අප විශ්වාස කරන අතර එම ලිපි 'වයිට් හැකල්' සඟරාවේ පල කිරීමට අප පුල පුලා බලා සිටින්නෙමු. එමෙන්ම ඔබගේ උසස් කවි සංකල්පනා හා සිතුවම් සඳහා ද මෙම සඟරාවේ ඉඩ ප්‍රස්ථාව ඇත.

අපගේ ආදර්ශ පාඨය වන 'සේවය කරමි' මත පිහිටා අප එකිනෙකාට, රෙජිමේන්තුවට, හමුදාවට හා රටට සේවය කරමු. අපගේ පාබල හමුදා ධජය ඉතා විශ්වාසවන්තව, අභිමානයෙන්, ඉතා ඉහලින් ලෙලදුන් විලසටම, තව දුරටත් ලෙලදීමට අවස්ථාව උදා කර දෙමු.

ප්‍රධාන කර්තෘ

THE WHITE HACKLE is for Members of the SLLI, their families, Ex-Servicemen of SLLI and as a whole for the entire Army. It will be extended even to all Sri Lankans.

We invite readers' views. Under 150 words; A post card will do - and include your name, rank and address. We will withhold your name if you so desire and may condense your views because of space. We cannot publish or answer every one, but we will use representative views. Send your letters to:

Feedback,
The White Hackle,
RHQ SLLI, Army Cantonment,
Panagoda, Homagama.

රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් එන් මල්ලවආරච්චි ආර්ඩබ්පි යූඑස්පී එන්ඩීසී පීඑස්සී විසින් නිකුත් කරනු ලබන

# 2004 වර්ෂයේ සිංහල සහ හින්දු අළුත් අවුරුදු පණිවුඩය

වර්ෂ 2004 ක් වූ බක් මස 13 වන දිනට යෙදෙන සිංහල සහ හින්දු අළුත් අවුරුද්ද වෙනුවෙන් ඔබ සැම වෙත අළුත් අවුරුදු සුභ පැතුම් පණිවුඩයක් නිකුත් කිරීමට ලැබීම සතුටට කරුණකි.

සූර්ය වර්ෂයක අවසානයත් සමග උදා වන අළුත් අවුරුදු සංක්‍රාන්තිය චිරාගත සම්ප්‍රදායානුකූල චාරිත්‍ර විදි වලට මුල් තැන දෙමින් ප්‍රීතිමත් ලෙස සැමරීම ලක් වැසි බහුතරයක් ජනතාවගේ ප්‍රාර්ථනාවයි.

පෞඩ ඉතිහාසයකට හිමිකම් කියන අප රෙජිමේන්තුවේ උදාරත්වය සුරකිමින් ඔබ මෙතෙක් ඉටු කල වගකීම් සහ රාජකාර්‍යයන් නොපිරිහෙලා තවදුරටත් කරගෙන යාමට මෙම උතුම් අළුත් අවුරුදු වකවානුවේදි අධිෂ්ඨාන කර ගත යුතු වේ.

අපට පැවරී ඇති කාර්‍යය මත අප රෙජිමේන්තුවේ බොහෝ නිළයින්ට තම පවුල් වල සාමාජිකයින් සහ නෑදෑ හිතවතුන් සමග එක්වී මෙම වැදගත් උත්සවය සැමරීමට අවස්ථාවක් නොලැබෙන බව මම හොඳින් දනිමි. එහෙත් ඔබ විසින් ඉටු කරනු ලැබූ රාජකාරිය හේතු කොට ගෙන ලක් වැසි අනික් සැම දෙනාගේම පවුල්වල සමාජිකයින්ට එක්ව අළුත් අවුරුද්ද සැමරීමට හැකි වාතාවරනයක් උදා වී ඇත.

මෙම උත්කර්ෂවත් අවස්ථාවේදී මහත් කැපවීමකින් හා අධිෂ්ඨානයෙන් යුතුව ක්‍රියාන්විත රාජකාරිය ඉටු කරනු ලබන අතර මව් බිම වෙනුවෙන් දිවි පුදා අප අතරින් වෙන්වූ සියලුම නිළධාරින් සහ සෙසු නිළයින් කෘතවේදීව මෙම අවස්ථාවේදී සිහිපත් කරන අතර අබාධිත තත්ත්වයට පත්වූ අයවලුන්ට කඩිනම් සුවය ප්‍රාර්ථනා කරමි.

අවසාන වශයෙන් අප මව් බිමේ අභිවෘද්ධිය වෙනුවෙන් ඇප කැපවී ක්‍රියාන්විත රාජකාරියේ යෙදී සිටින සියලුම නිළයින්ටත් ඔවුන්ගේ පවුල්වල සියලුම සාමාජිකයින්ටත් අබාධිත තතත්වයට පත්වූ අයවලුන්ටත් ඔවුන්ගේ පවුල් වල සියලුම සාමාජිකයින්ටත් මියගිය සහ අතුරුදහන් වූ අයවලුන්ගේ පවුල් වල සියළුම සාමාජිකයින්ටත් අප සමග සැමදා එක්ව රාජකාරි කරන සිවිල් සේවක මහතුන්ටත් ඔවුන්ගේ පවුල් වල සියළුම සාමාජිකයින්ටත් සෞභාග්‍යමත් අළුත් අවුරුද්දක් වේවා යායි ප්‍රාර්ථනා කරමි.

## ""ඔබ සැමට සුභ අළුත් අවුරුද්දක් වේවා"" ........

එන් මල්ලවආරච්චි ආර්ඩබ්පි යූඑස්පී එන්ඩීසී පීඑස්සී
මේජර් ජෙනරාල්
රෙජි අධිපති ශ්‍රීලපාහ

# මියගිය විරුවන් සිහිකිරීම වස් 5 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදවේ රණවිරු ස්මාරකය විවෘත කල වගයි.

ශ්‍රී ලංකා පාබල හමුද රෙජිමේන්තුව තුල 5 ශ්‍රීලපාහ ඒකකයට 2003.08 16 වන දිනට 16 වසරක් සම්පූර්ණ වුවත්, ශ්‍රී ලංකා යුධ හමුද ස්වේච්ඡා බළසේනාව තුල එහි ඉතිහාසය අවුරුදු 40ක් තරම් වූ ඉතා ඈත කාලයකට දිවයයි.

2 වන (සෙව්) ගගන නාශක රෙජිමේන්තුව
2 වන (සෙව්) සංඥා බළකාය
2 වන (සෙව්) ඉංජිනේරු රෙජිමේන්තුව

1979 වර්ෂයේදී 1 වන ජාතික ආරක්ෂක බළමුලුව විසුරුවා හැර 2 වන විමර්ශන රෙජිමේන්තුව සෙව් ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බළකාය ආරම්භ කර ඇත. මේ අවධියේදී එහි මූලස්ථානය ගනේමුල්ලේ සිට මහනුවර පල්ලේකැලේ දක්වා ගෙන එන ලදි. 1983 පසුව අප ඒකක හටපිරිස් උතුරු ප්‍රදේශයේ ස්ථානගත විය. 1987 අගෝස්තු මස 15 වන දින 2 වන විමර්ශන රෙජිමේන්තුව විසුරුවා හැර ශ්‍රී ලංකා පාබල හමුද රෙජිමේන්තුව තුල 5 වන බළඇණිය සෙව් නමින් නව ඒකකයක් වශයෙන් එදිනම සිට ක්‍රියාත්මක විය.

1989.05.05 වන දින උතුරු ප්‍රදේශයෙන් ඉවත් වූ අතර ඒකක හටපිරිස් කෑගල්ල, රත්නපුර, මාතර හා මහනුවර යන දිස්ත්‍රික්කවල ස්ථානගත වන ලදි. 1990.05.19 වන දින නැවතත් අප බළඇණිය ත්‍රිකුණාමලය ප්‍රදේශයේ ක්‍රියාන්විත රාජකාරීන් සඳහා ස්ථානගත විය. 1999.11.09 වන දින වන විට වැලිඔය ඇතාවැටුණුවැව ප්‍රදේශයට පැමිණ ස්ථානගත වන ලදි.




එද මෙද තුර කාලසීමාව තුලදී උපන් දේශයේ ගෞරවමික අඛණ්ඩතාවයත්, ආරක්ෂාවත් අරභයා කරනු ලැබූ අනගිභවනීය සේවය අති මහත්ය. දිවයින පුරා මෙම සේවාව ඉටු කිරීමේ රාජකාරීන් හි නියැලී සිට අප ඒකක නිළධාරි 07ක් සෙසුනිළයින් 198 ක් තම මවු බිම වෙනුවෙන් දිවි පුද ඇත.



මෙම මියගිය රණවිරුවන් සදනුස්මරණීය අන්දමින් සිහි කිරීම වස් ඒකක පසු මූලස්ථානය පල්ලේකැලේ කඳවුරු භූමියේ රණවිරු ස්මාරකයක් ගොඩනැගීමේ උදර චේතනාව වත්මන් අණදෙන නිළධාරී මේජර් ආර්ඩීපී රන්වල, ශ්‍රීලපාහ හට ඇති වීමෙන් පසු එතුමා එකී කාර්‍යය උදෙසා සිය බුද්ධිය හා ඥාණ ශක්තිය මෙහෙයවා රණවිරු ස්මාරකයක් ඉදි කිරීමට අනුමැතිය 1998 ජූලි මස 04 වන දින ශ්‍රීලංයුධහසෙව්බමු වෙත ලිපියක් යවමින් ඉල්ලා සිටිනු ලැබිය.

ශ්‍රීලංයුහසෙව්බමු අනුමැතියෙන් පසු මෙකී රණවිරු ස්මාරකය අප ඒකක පසු මූලස්ථානය පල්ලේකැලේ කඳවුරු භූමිය තුල ඉදි කිරීමේ කටයුතු ආරම්භ වූ අතර, ස්මාරකය ඉදි කිරීම සඳහා අනුමත මුදල රුපියල් 1,10,000.00 ක් විය. එහි ඉදි කිරීමේ කටයුතු සිදුකර ගෙන යාමේදි මෙම මුදල් කිසිසේත්ම ප්‍රමාණවත් නොවූ අතර, ඊට අමතරව වරින් වර ශ්‍රීලංයුහසෙව්බමු අනුමැතිය මත රු.94,855.00ක මුදලක් මේ සඳහා ඒකක අරමුදලින් ලබා ගන්නා ලදි. එනමුත් අණදෙන නිළධාරිගේ උත්සාහය මත පසු මූලස්ථාන නිළධාරී හා අනෙකුත් සියලුම නිළධාරී සෙසු නිළයින්ගේ මහත් වූ උනන්දුව හා කැප වීම මත සිය දහදිය මහන්සිය හෙලා අපගේ රණවිරුවන් උදෙසා වන ස්මාරකය ඉතා දර්ශණීය අන්දමින් ගොඩ නැගීමට හැකි





විය. මෙම ස්මාරකය ගොඩ නැගීමේ මහා කර්තව්‍යය පිටුපස සිටි පසු මූලස්ථාන නිලධාරී අණදෙන මේජර් කේආර්එස්පීකේ කහගල්ල, ශ්‍රීලපාහ යන නිළධාරීගේ කැපවීම, උත්සාහය, උනන්දුව කිසි විටකත් අමතක කළ නොහැකිය. රණවිරු ස්මාරකයේ ග්‍රැනයිට් පතුරුවල අකුරු කෙටීම හා එහි සියලුම කලා නිර්මාණයන් හැරුණු විට අනෙකුත් සියලු කාර්යයන් අප ඒකක භටපිරිස් විසින් සිදු කිරීමද මෙහිදී ගෞරවයෙන් යුතුව සිහි කළ යුතුව ඇත.

මෙකී සත් කාර්‍යය ඉටු කිරීමේදී ශ්‍රීලංයුහසෙව්බමුහි සේනාවිධායක තුමා නියෝජ්‍ය සේනාවිධායක තුමා, ශ්‍රී ලංකා පාබල හමුද රෙජිමේන්තු අධිපති තුමා, සේනාවිධායක තුමා, ප්‍රමුඛ මහනුවර ආඥාපති තුමා, 223 බළසේනාධිපති තුමා, විසින් ලබා දුන් සහායෝගය හා දිරි ගැන්වීම ඉතා ගෞරව පූර්වකව මෙහිදි සටහන් කළ යුතුව ඇත.

1998 ජූලි 15 වන දින සිට අප රණවිරු ස්මාරකය ඉදි කිරීමේ කටයුතු ඉතා සෙමෙන් එහෙත් අලංකාරව හා ක්‍රමානුකූලව සිදු කරනු ලැබීය. 2003 අගෝස්තු මස 15 වන දිනට යෙදී තිබූ අප ඒකක 16 වන සංවත්සර දිනයේදි එය විවෘත කිරීමේ කටයුතු අණදෙන නිළධාරී තුමා විසින් සැලසුම් කරනු ලැබීය. ඒකකයේ මියගිය සියලූ නිළධාරී/සෙසු නිළයිනගේ දෙමාපියන්,බිරින්දෑවරුන් හා දූ දරුවන් හටද, යුධ හමුදවේ ජ්‍යෂ්ඨ නිළධාරීන් රැසකට හා මෙතෙක් ඒකකයට අණදීම සිදුකරන ලද සියලුම අණදෙන නිළධාරින්,රණවිරු ස්මාකරය ඉදි කිරිමට අතහිත දුන් සියලුම සිවිල් පුද්ගලයින්, ඒකකයෙන් පිටත යා කර සිටින නිළධාරී,සෙසුනිළයින්,විශ්‍රාමිකව සිටින නිළධාරී,සෙසුනිළයින් සහ අබාධිත හේතුන් මත අස් වී ගිය සියලුම සෙනින් හට ආරාධනා පත් යවමින් මෙකී උත්සවයට සහභාගි වන ලෙස ඇරයුම් කරනු ලැබීය.

වර්ෂ 2003.08.15 වන දින මෙම ඒකක පසු මූලස්ථානය ස්මාරකය විවෘත කිරිමට සූදනම් කර තිබුණි. එදින පස්වරු16.17 පැයට ශ්‍රී ලංකා යුධ හමුද සෙවේච්ජා බළසේනාවේ සේනාවිධායක මේජර් ජනරාල් එස්එච්එස් කෝට්ටේගොඩ ඩබ්ඩබ්වී, ආර්ඩබ්පී, ආර්එස්පී, යූඑස්පී, එන්ඩීසී තුමා විසින් විවෘත කිරීමේ සමරු පලකය නිළ වශයෙන් නිරාවරණය කරමින් රණවිරු ස්මාරකය විවෘත කරනු ලැබීය. ඉන් අනතුරුව සර්ව ආගමික වතාවත් සිදුකර මියගිය රණවිරුන් හට පිං අනුමෝදම් කරනු ලැබීය. ආගමික වතාවත් වලින් පසුව ස්මාරකය වෙත පලමු මල් කලඹ සේනාවිධායක තුමා විසින් තැන්පත් කරනු ලැබූ අතර, අනෙකුත් ජ්‍යෂ්ඨ නිළධාරීන් හා ඒකකයෙ මියගිය රණවිරුවනගේ ලගම ඥාතීන් විසින් රණවිරු ස්මාරකයට මල් කලඹ තබා තම ආචාරය පුද කිරිම ආරම්භ කරනු ලැබීය.



මල හිරු බැස යන සැන්දෑ යාමේ සිහින් වැසි පොදක් පතිත වෙමින් තිබූ එම අවස්ථාව ඉතා හැගීම් බර එකක් විය. උපන් දේශය වෙනුවෙන් දිවි පිදූ අප ඒකක රණවිරුවන් සිහි කිරිම් වස් ගොඩ නැගූ මෙකී ස්මාරකය ඉදිකර ඇති දර්ශනීය භූමියේ පසෙක සිට රෙජිමේන්තු තූර්ය වාදක කණ්ඩායම ඉතා ලගන්නා සුලු හඩින් දේශානුරාගී ගිත වාදනය කරමින් එම සුවිශේෂ සන්ධ්‍යාව වඩාත් ගාම්භිර කරනු ලැබිය. මිය ගිය රණවිරුවනගේ ඥාතීන් සුදු වතින් සැරසී තම මිය ගිය සහෘදයා වෙනුවෙන් මල් කළඹ තැබීමට අවස්ථාව එන තෙක් කදුලු පිස දමමින් ඉතා සෙමෙන් ගමන් ගන්නා දසුන මහත් හැගීම් බර දසුනක් විය.

විඑම්ර්ආර්කේ තෙන්නකෝන්
කපිතන් - ශ්‍රීලපාහ
විධායක අධිකාරි.

# ඉරට සැතැප්මයි

'සිරිපාල අ අ අ අ අ ------ මාස්ටර් හැන්ඩ් ඒ කවුද ඔය අතික් අය --------- ගේ ---හොර ------ගැ අරන් යනවා වගේ අරන් යන්නේ ඩවුන් ඩවුන් ඩිප්ස් 200 යි'

සැබැවින්ම මෙය අපලංශ කථාවක් හෝ සිහිනයක් හෝ නොව සැබවින්ම දින 52 ක් පුරා මාදුරුඔය පුහුණු පාසලේ පුහුණුව ලද කාලයට නැවතත් මනසින් යෑමකි. එය සැබැවින්ම දැන්නම් ගැඹුරු හිත්දේ දුටු අතිශය සුන්දර සිහිනයක් බදුයි.

**ජයසිකුරු ක්‍රියාන්විතයෙන් පසු යුධ හමුදව තුල සිදුකල සංශෝධනවල ප්‍රතිඵලයක් ලෙස 10 ශ්‍රීලපාභ අනතුන් සහෝදර බළඇණි අතර බෙදී විසිරී ගියා. පසුව මේජර් එච්එච්ජේඑස් ගුණරත්න ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී ශ්‍රීලපාභ ගේ නායකත්වය යටතේ 2001 මැයි මස 05 වන දින සිට නව උද්දමයකින් පිබිදෙන්නට වූ 10 ශ්‍රීලපාභ, 563 බළසේනා මූලස්ථානය යටතේ වන්නියේ තම රාජකාරිය නොපිරිහෙලා ඉටුකළා. සාම කාලය උදා වන තෙක් අපි අපේ රාජකාරිය හොඳටම කලා. ආරක්ෂක වළල්ලෙන් ඉදිරියට තිබිල්ලා සතුරට පහරදීලා ඉලක්ක ලබා ගත් අවස්ථා බොහෝමයි. කෙසේ වෙතත් මේ සටහනේ අරමුණ යටගිය ජයග්‍රහණ ගැන අටුවාටීකා 'දෙඩවීම නම් නොවේ. එහෙත් මා උත්සාහ ගන්නේ ඉරට සැතැප්මයි යන අනුවර්ථන නාමයෙන් පිදුම් ලැබ තිබෙන මාදුරුඔය යුධ හමුද පුහුණු පාසැලේ අප බළඇණි පුහුණුවීම් කළ කාලය තුල අප ලද අත්දැකීම් ඔබ වෙත ගෙන හැර දැක්වීමයි.**

බළඇණි පුහුණුවීම් මාර්තු මස 17 දින සිට මැයි 08 වන දින දක්වා මාදුරුඔය පුහුණු පාසැලේ දී පැවැත් වුනා. 'බළඇණි පුහුණු වලට පෙර බළඇණි සංස්කරණ පාඨමාලාව මාර්තු 01 දින සිට ඉදිරියට දින 14ක් තුල කරන්න' ඒ ඉහල මූලස්ථාන වලින් අප ලද උපදෙසයි. ඇත්තෙන්ම එතෙක් බළඇණියක් වශයෙන් සමූහ පුහුණුවීම් වල යෙදෙන්නට අවස්ථාවක් නොලැබ තිබුනත් සෑම සොල්දාදුවෙක්ම සෑම නිළධාරියෙක්ම විවිධ පාඨමාලාවන් හදරා තිබුණා. බළඇණි නායකත්වය මනා සැලැස්මකට අනුව බළඇණියේ පාලනය සිදු කරගෙන ගිය නිසා පුහුණුවීම් සඳහා අප ධෛර්‍යයමත්ව ජව සම්පන්නව නොබියව ඉදිරිපත් වුනා.

ඉදිරි ආරක්ෂක වලල්ලේ රාජකාරි වලින් පෙබරවාරි 28 වන දින මුදවා ඒ බී ඩී හා විශේෂ ක්‍රියාත්විත බණ්ඩය කෝක්එලිය පුහුණු පැසලේදි ද සී කණ්ඩායම 56 සේමු හි දිද ආධාරක කණ්ඩායම තාණ්ඩිකුලම් හමුද කදවුරේදි ද ස්ථානගත වී පුහුණුවීම් ආරම්භ කරන්නට අප සූදනම් වුනා. සංස්කරණ පාඨමාලාව ආරම්භ කරමින් 2003 මාර්තු මස 03 වන දින උදෑසන 0800 ට පමණ අණදෙන නිළධාරි විසින් ආරම්භක දේශණය පැවැත්වුවා

එහිදී අපි කවුද යන වග, පුහුණුවේ ඇති අවශ්‍යතාවය, පුහුණු විය යුතු ආකාරය, අපේ අරමුණ, යුධ හමුද රාජකාරි ස්වභාවය යනාදි විවිධ කරුණු යටතේ බළඇණි පුහුණුවක අවශ්‍යතාවය මැනවින් විස්තර කර දුන්නා. අනි විසින් වැඩි දුරටත් හටපිරිස් අමතමින් පුහුණුවට අකමැති යමෙක් වේ නම් නිනොසේනො නොවන ලෙසත් ඒ අවස්ථාවේදී ම ඉදිරිපත් වන ලෙසත් දැනුම් දුන්නා. පුහුණුව තුල දී නිනොසේනො වන්නේ නම් හෝ පැනයන්නෙකු වේ නම් ඔහු නියත වශයෙන්ම යුධ හමුදවෙන් අස් කරන බවත් එසේ කරනු ලබන්නේ පොදුවේ නුපුහුණු සොල්දාදුවෙකු ගෙන් විය හැකි ව්‍යසනයන් වලක්වා ලීම සඳහා බවත් නිදර්ශන ආශ්‍රයෙන් තව දුරටත් පහද දුන්නා.

මේ අවස්ථාවේ සොල්දාදුවන්ගේ හැසිරීම විලාසයෙන් හා ගැඹුරු බැල්මෙන්ම කිසිවෙක් පුහුණුවට බය බව නම් පෙනෙන්නට තිබුනේ නැහැ. ආඩම්බරයකි, පුහුණුවට අකමැති කිසිවෙකු නොමැත. ඉන්පසුව 563 බළසේනාධිපති ද හටපිරිස් අමතා පුහුණුවීම් වල වැදගත්කම අරඹයා වැදගත් කරුණු රාශියක් අප වෙත කියා දෙනු ලැබුවා. අණදෙන නිළධාරි ඇතුලු සියලු නිළධාරින්ද, රෙසැමේ ඇතුලු සියලු නිලයින්ද කඩිසරව පුහුණුවීම් වල යෙදෙනවා අප දුටුවා. 563 බළසේනාධිපති තුමා ද විශේෂ දේශණ කිහිපයක් පත්වන්නට යෙදුනා. බළඇණි පුහුණුවීම් ආරම්භ කිරීමට මාදුරුඔය වෙත අප යාමට සූදනම් වුනේ 14 වෙනිද. මෙහිදී ආධාරක කණ්ඩායම 08 වන දින මින්නේරිය වෙත ගොස් මාර්තු 10 වන දින සිට තම පුහුණුවීම් ආරම්භ කරන්නට වුනා. ඒ කෙසේ වෙතත් ප්‍රවාහන පහසුකම් වල හිගතාවය මත බළඇනියක් ගමන් කිරීමට අපවෙත ලැබුනේ බස් රථ දෙකක්, ලොරියක් හා ට්‍රක් රථයක් පමණක් බැවින් සියලු බඩු සමග මුලු බළඇණියම මාදුරුඔය වෙත ප්‍රවාහනය කිරීමට අපට දින 06 ක් එනම් 10 වන දින සිට 16 වන දින දක්වා ගතවුනා.

ලස්සනට ඉර මුදුන් වෙලා දීප්තිමත් දවසක් තමයි මාර්තු 17 වෙනිද. එදින පළමුවෙන්ම බී සහ ඩී කණ්ඩායම් ශාරීරික අභ්‍යාස පරීක්ෂනයෙන් පුහුණුවීම් ආරම්භ කලා. එදිනම 0800 පැයට පමණ සේනාවිධායක තුමා ආරම්භක දේශණය පැවැත්වුවා. පුහුණුව පිළිබදව කරුණු ගෙනහැර පාමින් එදමෙද තුර 10 ශ්‍රීලපාභ වික්‍රමයන් පිළිබද එතුමා දන්නා බවත්, ජයසිකුරු ක්‍රියාත්විතයේදී එකට වැඩකළ බවත් හට පිරිස්වල හැකියාවන් දන්නා බවත්, පවසා පුහුණුව සාර්ථකව කරන ලෙස දැනුම් දෙමින් සුභ පතමින් කථාව අවසන් කළා. ඉන් පසුව පුහුණු පාසලේ අණදෙන නිළධාරි අප බළඇණියේ නිළධාරීන් අමතා පුහුණුවේ අන්තර්ගතය, එය කරන ආකාරය, ඇගයීම හා විශ්ලේෂණය පිළිබද විස්තරාත්මක ඉදිරිපත් කිරීමක් කරනු ලැබුවා.

එදින 1800 පැයට සම්බන්ධීකරණ සාකච්ඡාවක් පැවැත්වේ' තවත් කැටයක් තමයි කියලා හිතුනා. ක්‍රියා සහ පුහුණු අතිරේක ක්‍රියා සහ පුහුණු, රෙසැමේ, රෙදපාසැමේ, කසැමේ මෙයට සහභාගි වුනා. එය මෙහෙයවන්නට යෙදුන සම්බන්ධීකරණ නිළධාරි මේජර් ජයවීර මේ වන විටත් පුහුණු අවශ්‍යතා පිළිබදව අප දැණුවත් කරමින් පුහුණු කටයුතු මනා ලෙස සම්බන්ධීකරණය කර තිබුණා. ඇත්තෙන්ම එවැනි සම්බන්ධීකරණ උපදෙස් නොමැතිව කොහොම කරන්න ද, කැටයක් ලෙස සිතුනත් කැටයක් නොව කළ යුතුම වැඩක්. පුහුණුවීම් මනා ලෙස සම්බන්ධීකරණය වුනා. අවශ්‍ය හැම දේම තියෙනවා. ඒ හැම තැනකම නම් සදහන් කරලා තියෙනවා, හැමදේම සැලසුම සහගතයි, හමුදවේ පුහුණු පාසල පිළිබදව නොසිතුව දේවල් ද නෙන්නට වුනා. අපේ සුභසාධනයට අවශ්‍ය හැම දේම තියෙනවා. අප යනවිටත් 1 ගැහේබ,හා 10 ගරෙ ද පුහුණුව සදහා පැමිණ සිටියා. 1500ක විතර හටපිරිසක්, විකක් හිතලා බලන්න, 1500 කට ඉන්න හිටින්න තැන්, නාන්න, වැසිකිලි පහසුකම්, පුහුණු ප්‍රදේශ, පුහුණුව එකකට එකක් ගැටෙන්නැති වෙන්න සම්බන්ධීකරණය කිරීම, ඒ අතර තුර තරුණ නිළධාරි පාඨමාලාවක්, තව නොයෙක් සම්බන්ධීකරණ කටයුතු, ඇත්තටම යුධ හමුදවේ හරිම කාර්‍යය බහුල තැනක්. පුදුමයි කිසි කෙනෙක් කලබල නැහැ, පුහුණුව හොඳට වෙනවා, පාලන කටයුතු ඒවත් එහෙමයි, ඒත් කිසිම දෙයක් නිකන් නම්

වෙන්නේ නැහැ, මේ හැම දේම නියමිත සැලැස්මකට, ප්‍රතිපත්තියකට ක්‍රමයකට, කාල සටහනකට අනුව සිදුවන නිසයි මේතරම් සරලව මේවා වෙන්නේ. සති පතා අනිගේ හෝ ජ්‍යෙෂ්ඨ උපදේශකගේ ප්‍රධානත්වයෙන් ගෙවුනු සතියේ ප්‍රගතියත්, එළඹෙන සතියේ පුහුණුවත් විස්තරාත්මකව සාකච්ඡා කරනවා. ප්‍රශ්න, ගැටලු සහගත අවස්ථා එවලේම විසදනවා.

ඉතින්, මේ පුහුණු ආයතනය ගැන අපිට ආදරයක් ඇල්මක් නිබදවම ඇතිවුනා. මේ අපේ තැන, අපේ සොල්දදුවන්ගේ ජීවිත ආරක්‍ෂා කරන තැන, ඔවුන්ගේ සුභසාධනය බලන තැනක් නේද කියලා අපට හිතුනා.

කොහොම හරි දවස් 10 කුත් ඉවරයි. අපේ පුහුණුවේ තරම, ප්‍රතිඵලය දැනගන්න කල් ඉවසිල්ලක් නැහැ. වෙඩි තැබීම් කොහොමද, නැවිගේෂන් කොහොමද, මේ අවස්ථාවේ අණදෙන නිළධාරී තුමා හට පිරිස් රැස් කරලා අපේ ප්‍රතිඵල ගැන අපිට දැනුම් දුන්නා. පළමු දින දහය තුල පුහුණු වූ පුද්ගලික හැකියාවන් විශිෂ්ඨ බව, ඒ විතරක් ද , එතෙක් පුහුණු වූ බළඇණි 18 කින් හොදම ප්‍රතිඵල මොකද අපි ගොඩක් මහන්සි වුනා. අපි කැප වුනා. අපිට හොද අධිෂ්ඨාන ශක්තියක් තිබුනා. ඇත්තෙන්ම මේ ගුණාංග අප තුල ඉහලම නායකත්වය විසින් ඇති කළා කිව්වොත් වඩාත් නිවැරදියි. අපේ දඩිය මහන්සියෙන් කැපවෙලා ගත්ත ජයක් ගැන උදම් වීම, ආඩම්බර වීම වැරැද්දක් නොවේ. වෙඩි තැබීම් මුලු බළඇණියෙන්ම තුන්දෙනෙක් පේල්. ඉතුරු සියල්ලම (99.78) සමත්. කාලෙකට පස්සේ මාදුරුඔය පාසලේ පිහිටවපු වාර්ථාවක් කියලයි අපට නම් දැණ ගන්න ලැබුනේ, මෙහිදී වඩාත් වැදගත් කරුණ වනුයේ අපගේ විශිෂ්ඨත්වය පසු පස ඇති බළවේගය කුමක්දැයි හදුනා ගැනීමයි.

2002 වර්ෂය තුල පමණක් නිළධාරී පාඨමාලා 28 කට හා සෙසුනිළයින් පාඨමාලා 280 කට සහභාගි කරවනු ලැබ තිබෙනවා. ඒ විතරක් ද කණ්ඩායම් දෙකක් බෝගොඩ පුහුණු පාසලේත් තවත් කණ්ඩායම් දෙකක් බළඇණියේත් සමූහ පුහුණුවීම් වුනා. ජ්‍යෙකොනොනි, කොනොනි සංස්කරණ පාඨමාලා, ආධුනික සෙනින් සංස්කරණ පාඨමාලා, විශේෂ ක්‍රියාන්විත බන්ඩ පාඨමාලා, ආධාරක අවි පාඨමාලා මේ සියලු පාඨමාලාවන් 2002 වර්ෂය තුලදී සාර්ථකව නිමා කලා. සතියේ දිනක් පුහුණු දිනක් ලෙස නම් කර සෑම සතියකම බළඇණිය පුහුණු වුනා. සෑම පුහුණුවකටම පෙර අණදෙන නිළධාරී පුහුණුවේ අරමුණ සාර්ථක කර ගැණීමට ගතයුතු ක්‍රියාමාර්ග, එහි වැදගත් කම හා පුහුණුව අවසානයේ ඒ පිළිබද නැවත පසු කථනය ද කරනු ලබනවා. ඒ විතරක් ද? අපගේ දුර්වල තැන් පෙන්වලා හද ගත යුතු ආකාරය කියලා දෙනවා. අනෙක් කාරණය මාදුරුඔය පුහුණු පාසලේ සේනාවිධායක, අණදෙන නිළධාරී, ජ්‍යෙෂ්ඨ උපදේශක, ප්‍රධාන උපදේශක, සම්බන්ධීකරණ නිළධාරී, උපදේශක නිළධාරීන් හා සෙසු නිළයින්ගේ උපදේශක හැකියාවද, ක්ෂේත්‍ර පළපුරුද්ද ඉතා ඉහලයි. ඒ අතින් පාබල අපි සතුව උසස් මට්ටමේ උපදේශකයින් සිටිනා වග වැටහුනා. උපදේශක නිළධාරීන් හා සෙසුනිළයින් දැඩි කැපවීමෙන් අප බළඇණිය පුහුණු කළා කිව්වොත් අප නිවැරදියි. සිරිපාලලා පුහුණුව හොදටම කරලා තිබුනා. විපුල එල නෙලා ගෙන තිබුනා.

පසුව එළඹුනේ සාමූහික පුහුණු පෙළක් බන්ඩයක්, කණ්ඩායකමක් හා බළඇණියක් ආදි වශයෙන් අප පුහුණු විය යුතු සටන් ක්‍රම, තාක්‍ෂණික ක්‍රම සහ විධි පුහුණු ආරම්භ කළා. ප්‍රථම වතාවට මෙවර අපෙන් වන අභ්‍යාසය වෙනත් ආකාරයකින් ක්‍රියාවට නංවලා තිබුනා. මුලු බළඇණියම මෙම අභ්‍යාසය සදහා සහභාගි වූ අතර දින 04ක් රාත්‍රි 03 ක් තුල කිමි 40-50 ක් අතර දුර පරාසයක් තුල විවිධ සරඹයන් විවිධ අභ්‍යාසයන් ප්‍රගුණ කලා. ඇත්තටම ඇඟටනම් ටිකක් තදින් දැණුනා. අඩු කාලයකින් වැඩ ගොඩක්, ඒ තුලින් යුදමය අවස්ථාවක මුහුණ දෙන තරම් ප්‍රබල පීඩනයක් ගෙන දීම වෙන්නැති එහි අරමුණ. ඒ පීඩනය නම් වන අභ්‍යාසය පුරාවටම අපිට දැනුනා. මෙය ආරම්භ කලේ අනිගේ නියෝග, බුද්ධි අංශය නිර්මානය කල වැලි ආකෘතිය ආශ්‍රයෙන් නිකුත් කිරීමෙන් පසුවයි. මේ ආකෘතිය ගැන කථා කරන විට එය ඉතාමත් ආකර්ශනීය, එම ප්‍රදේශයට ජීවයක් ලබා දුන් ආකෘතියක් මෙන් දිස් වූ බව නොකිවමනාය. පුහුණු පැසලේ අනි නියෝග වලට සහභාගි වෙමින් මේ ආකෘතිය සහ අණදෙන නිළධාරීගේ නියෝග අගයමින් ප්‍රසංශා කරමින් සියල්ලන්ගේම උනන්දුව කැපවීමට ස්තුති කරමින් අපේ එහි අඩුපාඩුද පෙන්වා දෙනු ලැබුවා. පසුව පිළිවෙලින් තිඃ වරුන්ද නියෝග නිකුත් කිරීමෙන් අනතුරුව වන අභ්‍යාසය,මහියංගනය,දඹානකැලෑ දෙපාර්තමේන්තු කාර්යාල අසලින් වනය තුලට පා ගමන් අරඹමින් 'ටයිගර් හන්ට්' වන අභ්‍යාසය ආරම්භ කලා.

වන අභ්‍යාසය තුලින් අපි ඉගෙන ගත් දේවල් බොහෝමය. පසුදින අභ්‍යාසය පිළිබද නැවත කථනයේදී වන අභ්‍යාසය ඉතා සාර්ථකව නිමා කළ බව ප්‍රධාන උපදේශක හා අනෙක් උපදේශකවරු පවසා සිටියා. එපමනක් නොව අපෙන් වැරදීම් වුනා ඒවා ගැනත් ඒවා හද ගත යුතු ආකාරයත් කථා කලා. අභ්‍යාසයට සහභාගි වූ උපදේශකවරු අපේ වැරදි පෙන්වලා දුන්නා. අපි ඒක අගය කල යුතුමය. මන්ද යුද්ධයේදි සුලු වැරදීමක් යනු ජීවිතය අහිමි වීමයි. අපි වැරදි හදගෙන ඊලග අභ්‍යාසයට මුහුණ දෙන බවට දැඩිව අධිෂ්ඨාන කර ගත්තා. ශාරීරිකව හෙම්බත් වෙලා දුර්වල වෙලා ඉන්න වෙලාවට දැඩි අධිෂ්ඨානයෙන් නැගි සිට අභියෝගයට මුහුණ දීලා සටනක් ජය ගන්නේ කොහොමද කියලා අපි ඉගෙන ගත්තා.

අවසාන ශාරීරික අභ්‍යාස පරීක්‍ෂනයට අපි හොදින් මුහුණ දුන්නා. මුලු බළඇණියම පාස්. අපි මාදුරුඔයට ගිහිල්ලා ආරම්භක දේශණයට සහභාගි වනවිට අපි දුටුවා බිත්තියේ විශාල දැන්වීම් පුවරුවක 3 ශ්‍රීලපාහ සෙනියෙක් සැතපුම් නවය දිවීම වාර්ථාවක් තියලා තියෙනවා. හැමෝම කිවුවා මෙම වාර්ථාව නම් අපි කඩනවා කියලා. ඒ වගේම ඩී කණ්ඩායමේ සෙ/316284 සාසෙ උදයංග එස්එම්එස් පැය 1 යි විනාඩි 18 කින් එය නිම කර නව වාර්තාවක් තැබුවා. එපමණක් නොව තවත් තිදෙනෙක් පෙර පැවති වාර්ථාව බිද හෙලූ අතර මුලු බළඇණියට සැතපුම් නවය දිවීමට සමත් වෙමින් පුහුණු පාසලේ තවත් නව වාර්ථාවක් පිහිටවනු ලැබුවා.

අවසාන ජීව අභ්‍යාසය (රොලින් තන්ඩර) ක්ෂේත්‍ර වෙඩි පිටියෙහි දින 04 ක් රාත්‍රි 03 ක් පැවැත්වූ අභ්‍යාසය ද ඉතාම සාර්ථකව නිමා කලා. ඒ සදහා නිර්මාණය කළ වැලි ආකෘතියේ වර්ණවත් බව ජීවි බව සඳහන් කිරිම අතිශෝක්තියක් නම් නොවේ. එදා මෙද තුර නිර්මාණය කල හොදම ආකෘතිය ඒ බවයි අපිට නම් දැණ ගන්න ලැබුනේ. අණදෙන නිළධාරි ඇතුලු නිළධාරීන්ගේ නියෝග ආකෘතිය පිළිබදව ප්‍රසංශා මුඛයෙන් සේනාධිපතිතුමා කථා කලා. එහි පැවති සුලු සුලු අඩුපාඩුද නිවැරදි කලා.

2003 මැයි 07 දින රාත්‍රිය ජීවිතයට තවත් අමතක නොවන රාත්‍රියක්. අපි ලබපු පුහුණුව අපටත් නොදැණීම මතකයට නැගුණා. අපි ආව දවස, පුහුණු වුන දේවල්, අපි කොච්චර ශක්තිමත්ද කියලා හිතුනා. පසුදින උදෑසන සාර්ථකව නිමා කළ ජීව අභ්‍යාසයෙන් අපේ බළඇණි පුහුණු අවසන් වුනා.

අවසානයේ එහි පැමිණ සිටි මේජර් ජනරාල් ජී හෙට්ටිආරච්චි ඩබ්ඩබ්ඩබ්වී ආර්ඩබ්පී

ආර්එස්පී පීඑස්සී අප අමතමින් විවිධ වැදගත් කරුණු රාශියක් කියලා දුන්නා. ඒ අතරතුර ප්‍රශ්න කිහිපයකුත් ඇසුවා ඒ අතරින්:

"ඔබගේ බළඇණියේ කී දෙනෙක් පැන ගියාද "? කිසිකෙනෙක් නැත.

පුහුණුව එහෙම කොහොමද? සේනාවිධායක පිළිතුරු දෙමින් "වෙඩි තැබීම, නැවිගේෂන්, ශාරීරික යෝග්‍යතාවය යටතේ ගැනෙන පුද්ගලික හැකියාවන් විශිෂ්ඨයි. සමූහ පුහුණුවීම් සාමාන්‍යට ඉහලයි" යනුවෙන් පැවසුවා.

මේ පිළිබඳව පුදුමය දනවමින් මෙතරම් ජයග්‍රහණයක් ලැබීමට හේතු කවරේද යන්න ද විමසනු ලැබුවා. පසුව පුහුණුවීම් ගැන රටේ වත්මන් තත්වය ගැන කථාකරමින් බළඇණියට සුභ පතමින් නික්ම ගියා.

මෙහිදී අප බළඇණි ආධාරක කණ්ඩායම පුහුණු වූ මින්නේරි පාබල නිවහන ගැනද ලිවීමට ඇත්තේ ඉහත සදහන් කරුණුමය. එහි පුහුණු උපදේශක වරුන් පුහුණු සැලසුම් පරිපාලන කටයුතු ඉතා ඉහලයි. සේනාවිධායක ප්‍රධාන උපදේශක ඇතුලු බළඇණි ආධාරක අවි පුහුණු අංශයේ සියලුම උපදේශකයින් කැප වීමෙන් උනන්දුවෙන් අවංකව අප ආධාරක කණ්ඩායම පුහුණුකර ලැබ තිබෙනවා. එම පාබල නිවහන හා මාදුරුඔය පුහුණු පාසල අපගේ ගෞරවයට ලක් විය යුතු, අප ඇගයිය යුතු, රැකගත යුතු යුධ හමුදව සතු වත්කමක් කියලයි අපට නම් හැගෙන්නේ. අප අණදෙන නිළධාරිතුමා, නිළධාරින්, රෙසැමේ, ජ්‍යෙකොනොනින්, හටපිරිස් දිරි ගන්වමින් දින පතා කථා කරමින් මානසික මට්ටම උච්චම ස්ථානයක තබා ගත්තා අපට පොරොන්දු වුනා පුහුණු අවසන් දින 10 ක සමූහ නිවාඩු ලබාදෙන බවට. ඒවාගේම අපිට එය ලැබුණා. ඉතින් අපි මැයි 10 වෙනිද සිලු වැඩ අවසානයේ නිවෙස් බලා ඉගිල ගියා කිව්වොත් නිවැරදියි. මන්ද අප ඒතරම් වේගයෙන් ගියා. සියල්ල යහපත් විදිහට පොලොන්නරුවෙන් බස් කදවුර තුලටම ගෙන්වා දීමට සැලසුම් කරලා තිබුණා. ඉතින් අප නිවාඩු අවසන අපේ ආරක්ෂක වලල්ලේ නැවතත් ස්ථානගත වුනා.

ඩිවි. අංශය 10 ශ්‍රීලපාහ
යුධ හමුද කදවුර
ඊරනවිල - වව්නියාව

# රට රට වල ජාතික දිනයන්

| | | | |
|---|---|---|---|
| ඩෙන්මාර්කය | අප්‍රේ 16 | කොරියාව | අගෝ 15 |
| ඕස්ට්‍රේලියාව | ජන 26 | ලිබියාව | සැප් 01 |
| බංග්ලාදේශය | මාර්තු 26 | බුරුමය | ජන 04 |
| කැනඩාව | ජූලි 01 | මාලදිවයින | ජූලි 26 |
| චීනය | ඔක් 01 | මොරොක්කෝ | මාර්තු 03 |
| කියුබාව | ජන 01 | කොන්ගෝව | අගෝ 13 |
| චෙකොස්ලෝවැකියාව | මැයි 09 | නෝර්වේ | මැයි 17 |
| බ්‍රසීලය | සැප් 07 | නේපාලය | දෙසැ 28 |
| ජෝර්දානය | මැයි 25 | පකිස්තානය | මාර්තු 23 |
| වියට්නාමය | සැප් 02 | පිලිපීනය | ජුනි 12 |
| ප්‍රංශය | ජූලි 14 | සූඩානය | ජන 01 |
| ජර්මනිය | සැප් 26 | රුසියාව | නොවැ 07 |
| ඉන්දියාව | ජන 26 | ස්විඩනය | ජුනි 06 |
| ඉන්දුනීසියාව | අගෝ 17 | ස්විස්ටර්ලන්තය | අගෝ 01 |
| ඉරානය | පෙබ 11 | සැම්බියාව | පෙබ 18 |
| ඉරාකය | ජූලි 14 | තායිලන්තය | පෙබ 04 |
| ඉතාලිය | ජුනි 02 | ඇමරිකා එක්සත් ජනපදය | ජූලි 04 |
| ජපානය | අප්‍රේ 29 | පලස්තීනය | ජන 01 |
| යුගෝස්ලාවියාව | නොවැ 27 | ශ්‍රී ලංකාව | පෙබ 04 |

ඉහත සදහන් දත්තයන් නිශාන්ත වික්‍රමතිලක මහතා විසින් සම්පාදනය කරන ලද 'දනුම් සයුර' පොතෙන් උපුටා ගන්නා ලදී.

සෙ/12432 බනි 11 කරුණාරත්න ඩබ්ලිව්එස්අයි
(6 වන ශ්‍රී ලංකා පාබල හමුදව)
කොනොනි පුහුණු පාසැල - කාලාඔය.

# Mutual Understanding

A moment was taken to have lunch during operation Riviresa in the Jaffna peninsula, Soldiers in small groups scatterd in the battle field sat down to have their lunch.

One soldier sat under a tree to have his meals. He kept his weapon by the side of the tree. While he was having his meals, an Armed LTTE woman Cadre closed in on him. She then, having seen the soldier having his meals, withdrew without firing a single shot. The soldier who later realised what had happened, had an opportunity of getting at the women. The soldier refrained from doing so, having understood the woman's noble act.

**Sergeant Fernando SP,**
**6 SLLI - 51 Division**

## ප්‍රාර්ථනා

සිනිදු මල් පෙත්තක් වාගේ
හීන් සුලගේ පාවි පාවි
මගේ ලගට ඇවිත්
හිමිහිට ආදරෙයි කීවා

බැදුන ආදරේ දුර ඈත යන්න නොදී
හීන් සුලඟ අල්ල ගන්න හැදුවා
මුළු ලොවට හොරෙන්
බැදුන අපේ ආදරය
ජීවිතේ මිහිරියාව සනිටුහන් කළා

හි/65219
2/ලුතිනන් පීසීඩී ගමගේ
සී කණ්ඩායම - 6 ශ්‍රීලපාහ
නගර්කෝවිල් - යාපනය

# වයිට් හැකල් සගරාව මෙතෙක් ආ ගමන් මගට තුති මල් .........



**ශ්‍රී** ලංකා යුද හමුදවේ ආරම්භක ප්‍රථම රෙජිමේන්තුව වන පාබල හමුද රෙජිමේන්තුවේ විශේෂත්වයක් වන්නේ යුද හමුදවේ අද පවත්නා වත් පිළිවෙත් හා සබැඳි සාම්ප්‍රදයික සිරිත් විරිත් අප රෙජිමේන්තුව තුලින් දයාද කර දීමයි. ඒ අනුව අපට අපගේම අනන්‍යතාවයක් ඇත. ශ්‍රී ලංකා යුද හමුදවේ ව්‍යාප්තියත් සමගම බිහිවූ විවිධ රෙජිමේන්තු ස්ථාපිත කිරීමේදී ගුරු කොට ගනු ලබන්නේ අපගේ සම්ප්‍රදයන්ය. ඉදිරියටද එසේමය.

**වයිට් හැකල්** අපගේ ත්‍රෛයි මාසික සහරාව ගැනද සඳහන් කල යුත්තේ එයමය. මෙම සහරාව අපගේ අනන්‍යතාවය විදහා දක්වන කැඩපතක් බදුය. මෙය අද ඉතාමත් ජනප්‍රියත්වයට පත්ව තිබීම අතිශය සතුටට කරුණකි.

අද කවුරුත් වයිට් හැකල් නොහොත් පාබල හමුද සහරාව ගැන කතා කරයි. මා කවුරුත් කියා අදහස් කලේ මෙය යුද හමුදවේ අය පමණක් නොව සාමාන්‍ය සිවිල් ජනයා අතරද, එතෙර සිටින ප්‍රභූන් අතරද ජනප්‍රිය වී ඇති නිසායි. දන් මෙම සහරාවේ තොරතුරු පරිඝණක ජාලය (අන්තර් ජාලය) ඔස්සේද ලොව පුරා රැගෙන යන උසස් ගනයේ සහරාවකි.

1994 වර්ෂයේ ආරම්භයේදී මෙවන් සහරාවක් ආරම්භ කල යුතු බවට අප රෙජිමේන්තුවෙ නිළධාරින් ගෙන් මතුවී ආ අදහස **එවකට රෙජිමේන්තු අධිපතිව සිටි වත්මන් උතුරු / නැගෙනහිර ආණ්ඩුකාරවර තැන්පත් මේජර් ජනරාල් ඒකේ ජයවර්ධන ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී ආර්සීඩීඑස් පීඑස්සී (එවකට බ්‍රිගේඩියර්) මැතිතුමන් ප්‍රීතිය ප්‍රකාශ කරමින් ඉතාමත් ඉහලින් අනුමත කරන්නට යෙදුනි.** 1994 මාර්තු මස වන විට ශ්‍රීලපාහ රෙජිමේන්තු මධ්‍යස්ථානයේ සේනාවිධායක ලෙස මා පත් කෙරුනු අතර ,පාබල හමුද සහරාවේ ප්‍රධාන සංස්කාරක වශයෙන්ද වැඩ කටයුතු කිරීම මා හට පැවරුණි.

> **අද කවුරුත් වයිට් හැකල් නොහොත් පාබල හමුද සඟරාව ගැන කතා කරයි. මා කවුරුත් කියා අදහස් කලේ මෙය යුද හමුදවේ අය පමණක් නොව සාමාන්‍ය සිවිල් ජනයා අතරද, එතෙර සිටින ප්‍රභූන් අතරද ජනප්‍රිය වී ඇති නිසායි. දැන් මෙම සඟරාවේ තොරතුරු පරිඝණක ජාලය (අන්තර් ජාලය) ඔස්සේද ලොව පුරා රැගෙන යන උසස් ගනයේ සඟරාවකි.**

කුළුදුල් සහරාව කොතනින් පටන් ගන්නේදයි මා හට පැන නැගුන ලොකුම ගැටළුව විය. මෙවැනි කටයුතු වලට මා පාසැල් වියේ ලබා තිබූ අත්දැකීම් ද උපයෝගි කර ගනිමින් ශ්‍රීලපාහ බළ ඇණි වලට නිතර නිතර කතා කරමින් ලිපි, ගද්‍ය, පද්‍ය වැනි ද එකතු කර , ලැබුණ ලිපි/නිර්මාණ වලට ජීවයක් ලබා දී සුළු සුළු අඩුපාඩු මැද මංගල කලාපයක් එළි දක්වීමට අප සමත්විමූ. **මෙහිදී මට සහය වූ මේජර් ඩීයූ ලැනරොල් ආර්ඩබ්පී ආර්එස්පී ශ්‍රීලපාහ (මියගිය ලූතිනන් කර්නල්), කපිතන් (උපා) එච්ඩී දයානන්ද රංසි යූඑස්පී ශ්‍රීලපාහ (වත්මන් මේජර්(උපා) සහ, ලූතිනන් ටීකේ ලන්ත්‍රා ශ්‍රීලපාහ (වත්මන් කපිතන්(උපා))** මේ අවස්ථාවේදී අනිවාර්යෙන්ම සිහිපත් කළ යුතුව ඇත.

**අසීරු ගමනක් ආ වයිට් හැකල් සගරාව අද හමුද මාධ්‍යය ක්ෂේත්‍රයේ ඉදිරියෙන්ම සිටී. නවීන අදහස්, විද්‍යාත්මක දැනුම, විශේෂ ඇගයීම්, සහ විවිධ ක්ෂේත්‍ර අද එතුලින් මනාව ගෙන හැර දැක්වෙන අයුරු අපූරුයි. 2004 ජුලි මාසයේ එළි දැක්වෙන වයිට් හැකල් සගරාවේ 41 වන කලාපයක් සමග මෙම සඟරාවේ 10 වන විය සපිරෙන බැවි වයිට් හැකල් සඟරාවේ ප්‍රථම ප්‍රධාන සංස්කාරක වශයෙන් මා සටහන් තබනුවේ ඉමහත් අභිමානයෙනි.**

***"වයිට් හැකල් සඟරාව සැමදා දිලේවා ! "........***

**වීවීආර්ද සිල්වා ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී**
මේජර් ජෙනරාල්
මෙහෙයුම් ආඥාපති - කොළඹ
(වයිට් හැකල් සගරාවේ ප්‍රථම ප්‍රධාන සංස්කාරක)

# මංගල සීනු.....





නි /63290 කපිතන් අයි.ඊ.ඩී.එස් ඉංදික ශ්‍රීලපාහ 2004.01.17 වන දින මීගමුව ශාන්ත මරියා දේවස්ථානයේදී ටී.එම්.එල්. එරන්ති පීරිස් මෙනෙවිය සමග විවාහ වන ලදී.



නි/4119 කපිතන් පී.එම්.එන් යසලාලක ශ්‍රීලපාහ 2003.10.23 වන දින අලුත්ගම මොරගල්ල ඊඩ්න්" හෝටලයේදී කේ. ඕල්ගා පෙරේරා මෙනෙවිය සමග විවාහ වන ලදී.



නි /62213 කපිතන් ඩබ්.එම්.පී.පී.එස් බංඩාර ආර්.එස්.පී ශ්‍රීලපාහ 2003 ඔක්තොම්බර් 22 වන දින වාද්දුව යුධ හමුද නිකේතනයේදී සයුරී රණවක මෙනෙවිය සමග විවාහ ගිවිස ගන්නා ලදී.



සෙ/311810 ලා/කො ලක්මාල් බී.පී.අයි 2003.08.24 දින ආර්.ඊ. ස්වර්ණා මෙනෙවිය සමග යටදෙල වත්ත විවාහ ලේකම් කාර්යාලයේදී විවාහ ගිවිස ගන්නා ලදී.



සෙ/305720 සා/සේ කුලේන්ද්‍ර ඊ.එස් 2003.09.01 දින එම්. චන්ද්‍රිකා මෙනෙවිය සමග මඩකලපුව විවාහ ලේකම් කාර්යාලයේදී විවාහ ගිවිස ගන්නා ලදී.



සෙ/308263 කෝප්‍රල් වීරසිංහ කේ.පී.ටී 2003.08. 29 වන දින අයි.පී ධම්මිකා මෙනෙවිය සමග මනාලියගේ නිවසේදී විවාහ ගිවිස ගන්නා ලදී.



සෙ/304353 කොප්‍රල් ජයරත්න ඊ.වී.ඊ.එන් 2004.01.05 වන දින අවිස්සාවේල්ල ගැටහැත්ත මනාලියගේ නිවසේදී කේ.පී නදිකා කාංචනා මෙනෙවිය සමග විවාහ වන ලදී.



සෙ/14 D00900 සා/සෙ උදය කුමාර පී.කේ 2003.07.21 වන දින බී.පී ඉන්දලතා මෙනෙවිය සමග බදුරලිය විවාහ ලේකම් කාර්යාලයේදී විවාහ ගිවිස ගන්නා ලදී.

# රෙජිමේන්තු පුහුණු පාසල ශ්‍රීලපාහ

බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන්ට යටත් විජිතයක්ව තිබූ ශ්‍රී ලංකාවේ ප්‍රථමයෙන් අධිරාජ්‍යවාදීන් යටතේ ආරම්භ කරන ලද රයිපල් බලකාය 1881 වර්ෂයේදී 2 වන (ස්වේ) ශ්‍රී ලංකා පාබල හමුදාව වශයෙන් පවත්වා ගෙන ගිය අතර, 1948 දී ශ්‍රී ලංකාවට නිදහස ලැබීමත් සමග 2 වන (ස්වේ) ශ්‍රී ලංකා පාබල හමුදාව පුරෝගාමීත්වයෙන් 1949 වර්ෂයේදී ශ්‍රී ලංකා යුද්ධ හමුදාව පිහිටුවන ලද අතර, යුධ හමුදාවේ මව් ඒකකය වශයෙන් 2 වන(ස්වේ) ශ්‍රී ලංකා පාබල හමුදාව හැඳින්විය හැක. කාලයාගේ ඇවෑමෙන් දෙමල ජනතාවගෙන් කොටසක් ශ්‍රී ලංකාවේ වෙනම රාජ්‍යයක් බලාපොරොත්තුව අවි අතට ගෙන සටන් කරන ලදි. එහිදී ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් සියලු උත්සාහයන් මැඩ පැවැත් වුවද, ඇතුලින් නගින්නා වූ ගින්දර වරින් වර ඉස්මතුවී සංවිධානයක් වශයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ යුද්ධ හමුදාව සමග සටන් කිරිමත් සමග යුද්ධ හමුදාවේද ව්‍යාප්තියක් සිදුවන ලදි. ඒ අනුව 1989 දී රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රීලපාහ ආරම්භ වූ අතර, ඒ යටතේ නිත්‍ය ඒකක 10 ක් හා ස්වේච්ඡා ඒකක 4 කින් යුක්තව රෙජිමේන්තුව යටතේ පාලනය වන ලදි. සාඩම්බර ඉතිහාසයක් ශ්‍රී ලංකා පාබල හමුදාව වෙත තබමින් 02 වන එලිසබත් මහ රැජින විසින් 1954 වර්ෂයේ 02 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාව(ස්වේ) වෙත රැජින වර්ණ ප්‍රදානය කරන ලදි. ඉන් අනතුරුව ජනාධිපති වර්ණ වලින් ද රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රීලපාහ වර්ණවත් වන ලදි. මෙතෙක් කිසිදු රෙජිමේන්තුවකට හිමිකම් කීමට නොහැකි වූ 'රැජින වර්ණ' ලබාගැනීමට වාසනාවන්ත වන ලදි. එයින් නොනැවතුන ශ්‍රී ලංකා පාබල හමුදාව නිත්‍ය සහ ස්වේච්ඡා ඒකකයන් වෙත අවශ්‍ය සෙබලුන් බඳවා ගැනීමේ කටයුතු සිදුකරන ලදි. එහෙත් රෙජිමේන්තු මධ්‍යස්ථානයට අඩුපාඩුවක්ව තිබූ පුහුණු අංශයක් යුද හමුද මුලස්ථානයේ අනුමැතිය මත 1989 වර්ෂයේ පනාගොඩ කඳවුරේ පිහිටුවන ලදි. පසුව පුහුණු කිරීම වස්, හටපිරිස් වැඩි වීමත් සමග එක්වර පාඨමාලා තී පයක්* පවත්වා ගෙන යාමේ අවශ්‍යතාවයක් මතුවන ලදි. ඒ අනුව 2000.11.05 දින රෙජිමේන්තු පුහුණු අංශය 'රෙජිමේන්තු පුහුණු පාසල ශ්‍රීලපාහ' වශයෙන් බූස්ස කඳවුරේ ස්ථාපනය කරන ලදි.

රෙජිමේන්තු පුහුණු පාසල ආරම්භයේ සිට මේ දක්වා පාඨමාලා 46 ක් සාර්ථකව නිමකර ඇති අතර, ඒ අතරට කමාන්ඩෝ රෙජිමේන්තුවට ඉදුරාම බඳවාගත් ආධුනිකයින් සහ රෙජිමේන්තු මධ්‍යස්ථානය විශේෂ බලකායට ඉදුරාම බඳවා ගන්නා ලද ආධුනික සෙබලුන් පුහුණුකර පිටත් හරින ලදි. එම විසිර ගොස් ඇති ආධුනික සෙබලුන් විසින් ඒ ඒ ඒකකයන් හි පෙන්වන ලද දක්ෂතාවයන් හේතුවෙන් එම රෙජිමේන්තු විසින් ඉදුරාම බඳවා ගන්නා ලද ආධුනික සෙනින් සඳහා මූලික යුධ පුහුණුව ලබාදීම වස් මෙම පුහුණු පාසල තෝරාගෙන ඇති බවත් ඒ අනුව මෙම පුහුණු පාසල කෙරෙහි මහත් විශ්වාසයක් තබා ඇති බැව් සාඩම්බරයෙන් යුතුව දන්වා සිටිමි. ඒ සඳහා රෙජිමේන්තු මධ්‍යස්ථානය මෙන්ම ප්‍රදේශ මූලස්ථානය ගාල්ල ද නොඅඩුව උපදෙස් සහ අවශ්‍යතාවයන් ලබාදී ම නිසා මෙම තත්වය උදාකර ගැනීමට හැකිවී ඇති අතර, ඒ සඳහා මෙම පුහුණු පාසැලේ කෘතඥතාවය පුදකර සිටින්නෙමු. සෑම ආධුනික පුහුණු පාඨමාලාවක් අවසානයේ උපදේශකයින් සඳහා පූණරීක්ෂණ පාඨමාලාවක් පවත්වා ඔවුන්ගේ දැනුම වර්ධනය කරනු ලබයි. එහෙයින් දක්ෂ උපදේශකයින්ගෙන් සැදුම් ලද පුහුණු පාසලක් බවත්, ඒ හා සමානව පාඨමාලාවන් 03 ක් එකවර පවත්වාගෙන යෑම සඳහා ඇති සීමිත පාලන හට පිරිස් ප්‍රමානයෙන් අසීමිත රාජකාරි ප්‍රමානයක් ඉටු කිරිම සඳහා මහත් කැපවීමකින් යුතුව රාජකාරි කරනු ලබන නිළධාරි/සෙසුනිලයින් කොටසකින් සැදුම් ලත් පුහුණු පාසලක් බැව් සතුටින් යුතුව දන්වමි. ඒ අතරට රෙජිමේන්තු මූලස්ථාන බළඇණිය වෙතින් ලබාදි ඇති ආබාධිත සෙබලුන්ගේ සුභසාධක කටයුතු ද කිරීමට සිදුව ඇතත් ඒ සියල්ල සතුටින් යුතුව ඉටු කරන ලදි.

දැනට ආධුණික පාඨමාලාවන් 03 ක් එකවර පවත්වාගෙන යනු ලබන අතර, ඒවාද සුපුරුදු පරිදි සති 16 ක කාලසටහනක් මත සිදුකරනු ලබන පුහුණු වීම් බවත්, එම පුහුණු වීම් දැනට උසස් මට්ටමකට පත්කර ඇති බැව් සැබවින්ම සතුටට කරුණකි. ඊට අමතරව සෑම පාඨමාලාවක් සඳහාම රෙජිමේන්තු සබුබ වෙතින් ඉදුරාම බඳවාගත් සෙබලුන්ද ඇතුලත් කර පුහුණුවීම් සිදුකරනු ලබයි.. මෙම පුහුණු පාසල රෙම වෛබ වෙත ඉදුරාම බඳවාගන්නා ලද සෙබළ/සෙබළියන් සඳහා ද විශාල පාඨමාලා ප්‍රමාණයක් සිදුකර සාර්ථක ප්‍රතිපල ලබාදි ඇති පුහුණු පාසලකි. රෙජිමේන්තු මධ්‍යස්ථානය සඳහා ඇති ප්‍රෞඪත්වය ඔපනංවමින් ඒ යටතේ සිට යුධ හමුදාව සඳහා දක්ෂ ආධුණිකයින් බිහි කිරීමට වෙර දරමින් සිටින මෙම පුංචි පුහුණු පාසල කෙරෙහි ලිවීමට/කීමට බොහෝ දේ ඇත. එහෙත් අනාගතය ගැන කීමට වඩා අතීතය ආවර්ජනය කිරීම සතුටකි.

මෙම පුහුණු පාසල මෙවන් ස්ථානයක් කරා රැගෙනයාමට උපදෙස් සහ සහයෝගය ලබාදුන් රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රී ලංකා පාබල හමුදාවටත් ප්‍රදේශ මූලස්ථාන - ගාල්ල වෙතත්, පුහුණු කිරීම් සබැඳිව උපදෙස් හා අවශ්‍යතාවයන් ලබාදුන් යුහමු පුහුණු අම වෙතත් මෙම පුහුණු පාසලේ හෘදයාංගම ස්තූතිය පුද කෙරේ.

**රෙජිමේන්තු පුහුණු පාසැල**
**ශ්‍රී ලංකා පාබල හමුදාව**
**-බූස්ස-**

## යුධ බිමේ මගේ හිමිට

වැලි කතරේ තල් අරනේ
නිදි නොමැති ගන අඳුරේ
බලා සිටින ඔය දසට
වඩිනු එපා නිදිදෙව් දූව

තරුමල් කැට එලිය වෙලා
වැහිපිණි මුතු කැට විලා
යනපාරේ බාධක බිඳ
සවිය දේවි හිත සපුරා

හෙට දිනයේ ලක් දෙරනේ
සාම ධජය නංවන්නට
දුටු ගැමුණුගේ යෝධ සවිය
ලැබේවා රන් කදට මගේ

**චන්ද අබේවර්ධන**
**7 ශ්‍රීලපාහ සෙ/314899 සාසෙ අබේවර්ධන**
**එච්එම්පීබී ගේ බිරිද**

# හෙළයේ නැගීම සහ බැසීම

ජාතිය විනාශ කර දැමූ විට ආගම රකින්නේ කවරහුද? ඉන් ආගමත් විනාශ වී ගොස් රටම විනාශ නොවන්නේද? අපේ කම අමතක කරන්නට සමත් වූ කලු සුද්දන් බිහි කරලීමට අධිරාජ්‍යය වාදීහු සමත් වූහ. ලංකාවේ පාරවල් හැදුවේ වැවිලි ටික පිට රටට ඇද ගන්නටය. ඒ රටවල් දියුණු වූයේ අප වැනි රටවල් කොල්ල කැමෙනි. අපේ සමහරු ලන්ඩන් යාමට හරි කැමතිය. එහෙ ගොස් මෙහාට ගරහති. ලංකාවට ඇවිදින් ලන්ඩන් හරිම ෂෝක් කියති. උන් එසේ වූයේ අපව කොල්ල කාගත් නිසා බව අපේ පණ්ඩිත රාලලාට අමතකය. සුද්ද බලලුන් ලවා කොස් ඇට බාගෙන මෙරටින් ගියහ. ඒ ගියෙත් නිකම්ම නොවේ. අදටත් ඔවුන්ගේ ඇඟිලි තුඩින් අපව පාලනය කරති. නිහීන සිංහලයෝ ඉන්නා තුරාවට මේවායේ කෙළවරක් නැත. ඔවුන්ගේ ඕනෑ එපාකම් සඳහා අප තරුණ පරපුර බිලි වෙති. අප එය නවතා දැමිය යුතුය. වැඩිහිටි අප ඒ ගැන මීට වඩා අවධානය යොමු කර අපගේ බාල පරපුර බේරා ගත යුතුය. 1847 දී ගන්නා ලද වැද්දෙකුගේ ජයාරූපයක් මට හමුවිය. එවැනි වැද්දෝ පිටකොටුවේ යන විට අදද අපට දැක ගත හැකිය. වෙනසකට ඇත්තේ දූන්නයි-ඊතලයයි නොමැති වීම පමණකි. කුමක්ද අප ලබා ඇති දියුණුව. අපේ ජාතියේ කරුමය නම් මොවුන් ටික දෙනෙකු නිසා මුලු මහත් සුචරිතවාදී සමාජයම විනාශ වී යාමයි. වෙනත් වචන වලින් කියනවානම් මෙවැනි සුළු පිරිසක් විසින් මුළු මහත් සමාජ ව්‍යුහයටම කරන බලපෑම සුළු පටු නොවන බවයි.

මීට වසර කීපයකට පෙර කොට්ටාවේ සිදුවූ සිද්ධියක් මගේ මතකයට නැගෙයි. ඒ තම ලෙයින් හැදුනු දියණිය දූෂණය කරන්නට හැදූ විට, එයට විරුද්ධ වූ තම මැණියන්ව දූෂණය කර මරා දැමීමේ සිද්ධියයි. මෙහි අපූරුම සිද්ධිය වන්නේ මව මිය යාමට පෙර පොලිසියට කර තිබූ ප්‍රකාශයයි. ඒ තමාව දූෂණය කලේ තම පුතා නොවන බවයි. වැදූ මවව දූෂණය කරන්නට තරම් පෙලඹුන මේ පුද්ගලයා ගැන මා පෞද්ගලිකවම කරුණු සොයා බැලීමි. කරුණු එකින් එක සොයා බලද්දී බේබදු කමට, සුදුවට ඇබ්බැහිවීම ඉන් ප්‍රධාන තැනක් ගත් කරුණු දෙක විය. ඊට අමතරව ලිංගික අපචරනයද හේතුවකි. ඔහු සිංහල-බෞද්ධයෙකි. සිංහල බෞද්ධ අපට අම්මා තරම් කෙනෙකු නැත. එහෙත් මේවා සිදුවන්නේ කුමක් නිසාදැයි අවධානයෙන් සිට ඊට එරෙහිව ක්‍රියා කල යුතුය. බුදු දහමේ පහස ලබන කිසිම පුද්ගලයෙකු මෙවැනි කුරිරු තත්ත්වයකට පත් නොවන බව අප කාගේත් හැඟීමයි. සුචරිතවත් මිනිසුන් රටක සිටිනා කළ එය දුෂ්චරිත මිනිසුනට හිසරදයකි. බුදු දහම මිනිසා සුචරිතවත් කරයි. එසේ නම් බුදු දහම විනාශ කල විට මිනිසුන් පහසුවෙන් දුෂ්චරිත වලට පෙලඹවිය හැකිය. දුෂ්චරිත ඇත්තවුන් රටකට බිහිවූ කළ මුළු සමාජයම කඩා වැටී යයි. මිනිසුන් ඉබේටම විකෘති මිනිසුන් බවට පත්වී යයි. විකෘති වූ මනස් ඇත්තවුන් පාලනය කිරීම ඉතාමත් පහසුය. **මිනිසුන් වශයෙන් අප කල යුත්තේ වුනු දේවල් ඔස්සේ නොදුවා සිහි බුද්ධියෙන් කටයුතු කිරීමයි. එසේ සිහි බුද්ධියෙන් කටයුතු කර මේ රට, ජාතිය, ආගම හා අපගේ වටිනා සංස්කෘතිය ආරක්‍ෂා කර ගත යුතුය. දරුවන්ට හොඳ අධ්‍යාපනයක් ලබාදී ජීවත් වීමට අපහසු රටක් ඔවුනට ඉතිරිකර දෙන්නේ නම් ඉන් ඵලක් නැත. අතීතයේ සිට මේ දක්වාම සිදුවූයේ සිංහලයාත්-බෞද්ධයාත් යන දෙකම විනාශ කරන්නට ඇටවූ මර උගුලය. ඒ සියල්ලමත් පසුකර අද අප ඇවිත් සිටින්නේ රටෙත් - ජාතියෙත් ඉතාම අභාග්‍යය සම්පන්න යුගයටයි. මේ අවස්ථාවේ අප සියල්ලෝම කල්පනාකාරී විය යුතුය. එසේ නොවන්නේ නම් ඒ රටේත් - ජාතියෙත් - ආගමෙත් විනාශය බව කාට නම් කිව නොහැකිද?** සියල්ලම නොපෙනෙන දෙවියන්ට බාර දී අහස් කුස දෙස බලා නොසිට, දැස් ඉදිරිපිට ඇති කඩතුරාව ඉවත් කර සිහි බුද්ධියෙන් සිදුවන්නේ කුමක්දැයි යන්න ගැන බැලීමට කාලයයි මේ.

**මිනිසුන් වශයෙන් අප කල යුත්තේ වුනු දේවල් ඔස්සේ නොදුවා සිහි බුද්ධියෙන් කටයුතු කිරීමයි. එසේ සිහි බුද්ධියෙන් කටයුතු කර මේ රට, ජාතිය, ආගම හා අපගේ වටිනා සංස්කෘතිය ආරක්‍ෂා කර ගත යුතුය. දරුවන්ට හොඳ අධ්‍යාපනයක් ලබාදී ජීවත් වීමට අපහසු රටක් ඔවුනට ඉතිරි කර දෙන්නේ නම් ඉන් ඵලක් නැත. අතීතයේ සිට මේ දක්වාම සිදුවූයේ සිංහලයාත්-බෞද්ධයාත් යන දෙකම විනාශ කරන්නට ඇටවූ මර උගුලය. ඒ සියල්ලමත් පසුකර අද අප ඇවිත් සිටින්නෙ රටෙත් ජාතියෙත් ඉතාම අභාග්‍යය සම්පන්න යුගයටයි. මේ අවස්ථාවේ අප සියල්ලෝම කල්පනාකාරී විය යුතුය. එසේ නොවන්නේ නම් රටේත් - ජාතියෙත් - ආගමෙත් විනාශය බව කාට නම් කිව නොහැකිද ?**

අද උපදින දරුවන්ගේ තත්ත්වය කුමක්ද? ඔවුන් උපන්ද සිටම යුද්ධය දකිති. ඔවුනට එය සාමාන්‍යය දෙයකි. ඒ නිසා එය නොකරම බැරි තත්ත්වයකට ඉදිරියේදී පත්වෙතැයි සිතිය හැකිය. යුද්ධය ආරම්භ කලෝ කවරහුද යන්න ගැන සොය සොයා කාලය ගත නොකර මීට ඉක්මන් පිලියම් සෙවිය යුතුය. යුද්ධයට අප රටේ නූපන් දරුවන් පලි නැත. ඔවුන් ඉපදුන විට වැඩිහිටි අපට ශාප කරන්නේය. අතීතයේ අප ජාතිය පරිහානියට ගියේත් අද අප ජාතිය පරිහානියට යන්නේත් බල අරගලය නිසායැයි කරුණු අධ්‍යනය කරීමේදී ඉතා පැහැදිලිව පෙනේ. සිංහලයා ජාතියක් ලෙස නැගී සිටීමට නම් විය යුත්තේ බෙදී ඇති අප එක් නායකත්වයක් යටතේ ඒක රාශිවීමයි. නමුත් ඒ නායකත්වය බෞද්ධ හා සුචරිත නායකයෙක් විය යුතුමය. සුචරිත නායකයෙක් බිහි වන තුරු මේ කිසිම ප්‍රශ්ණයකට නිසි පිලිතුරක් ලැබෙන්නේ නැත. අප ජාතිය භේද වූ අවස්ථාවල ඉන් නියම ප්‍රයෝජන ගත්තේ පිලිවෙලින් පෘතුගීසීන්, ලන්දේසීන් හා ඉංග්‍රීසීන්ය. ඔවුන් අප රටට රිංගා ගත්තා පමණක් නොව ඔවුනට ගැති වූ සමාජයක් මෙරට ඉදි කලේය. ඔවුන්ගේ අවජාතක පරම්පරාවක්ද බිහි කලේය. ජාතියක් ලෙස දුර්වල වූ සෑම අවස්ථාවකම පරදේසීන් ඉන් ඵල නෙලා ගත්හ. එසේ නම් ජාතියක් ලෙස බැඳී ක්‍රියා කිරීමේ ඇති වැදගත්කම අප මුලින්ම වටහා ගත යුතුය. බුදු දහමේ ඇසුරින් ඈත්වන පුද්ගලයා තමන්ගේ අරමුණුකරා හොඳින් හෝ නරකින් ලඟා වන්නට උත්සාහ දරති. මෙරට තුල සිදුවූ අවසාන කැරැල්ල 1848 දී ඇතිවිය. 1848 කැරැල්ල ජාතිය වෙනුවෙන් සිදුවූ අවසාන කැරැල්ලයි. ඉන් පසුවත් කැරලි ගැන නම් අසන්නට ලැබිණි. ඒ ජාතිය වෙනුවෙන් සිදුවූ කැරලි නොවෙති. ඒවා සියල්ල බලය සඳහා වූ කැරලිය. 1848 දී ඇති වූ කැරැල්ලේදී පුරන් අප්පුට ආධාර දෙන ලැදැයි යන චෝදනාවට වැරදිකරු වූ කුඩාපොල හාමුදුරුවෝ වෙඩි තබා ඝාතනය කරන ලදි. ඒ බෞද්ධ භික්‍ෂුවකට එරෙහිව සිදුවූ ප්‍රථම ඝාතනයද නොවෙති. මෑත කාලයේ භික්‍ෂූනට එරෙහිව එල්ල කල

දරුණුම ප්‍රහාරය නම් අරන්තලාවේදී සිදුවූ කුරිරු බෞද්ධ භික්ෂු ඝාතනයයි. මේ කිසිම දේකට උන්වහන්සේලා වගකිව යුතු නොවේ. බෞද්ධ භික්ෂූන්ගේ රට - ජාතිය - ආගම රැක ගැණීමට මීට වඩා වැඩි මෙහෙයක් සිදුවිය යුතුමය. සියලුම භික්ෂූන් අප ජාතිය ආරක්ෂා කර ගැණීමට මූලිකත්වය ගෙන කටයුතු කළ යුතුය. යුධ සෙබලාගේ බිරිඳ, දරුවන් තම පුතා, ස්වාමියා හා පියා රට - ජාතිය - ආගම වෙනුවෙන් පූජා කර හමාරය. අප අද නිදහසේ ජීවත් වන්නෙ ඔවුන්ගේ එම නිර්ලෝභී සත් ගුණවත් පූජාව නිසාම නොවේද?

අතීතයේත් අද මෙන්ම නැට්ට කපා දැමූ වඳුරන් සිටියහ. නගුට කපා දැමූවත් පුරුද්ද නම් අමතක කළ නොහැකි විය. අද ඉතිරිව ඇති නගුට කපා දැමූ වඳුරන් ටික දෙනා සෑම දෙයක් ගැනම සාධාරණය කථා කරති. මතට හුරුවූ ගත ඉන් ඈත් කිරීමට අපහසුය යන කථාව බොරුය. ඒ ඔවුන්ගේ පුරුද්ද දිගටම කරගෙන යාමට සාදගත් උපායශිලී කථාවකි. ජාතියේ සලකුන පසුපසින් තබා ගෙන මත්ද්‍රව්‍යය බීමට අද මිනිසුනට වාසනාව ඇත. මත්ද්‍රව්‍යය පරම්පරාවම මන්දබුද්ධික කරයි. ජාතිය මන්දබුද්ධික වූ විට පාලකයාට පාලනය පහසු වන්නේ ප්‍රශ්ණ නැගීමට තරම් කෙනෙකු නොමැති වීමෙනි. මත්ද්‍රව්‍යය වලට පූජා කරන මුදල් නිසා පවුලේ ආර්ථික ගැටලු එකින් එක මෝදු වෙයි. එවිට පවුලේ අඬදබර ආදියද කෙලවරක් නැතිව ඉහල නගී. අද පටන් දුම්පානය හා මත් ද්‍රව්‍යය භාවිතය නතර කිරීමට තරයේ උත්සාහ ගන්න අමුතුම මානසික උන්මාදයක් ලෙස දුම්පානය හා බීර පානයන් හැඳින්විය හැක. බීර වලට පානය යන වචනය පවා භාවිතා කිරීම විශාල වරදක් යැයි මට සිතේ. වර්තමානයේ අප අතර සිටින්නාවූ ළමුන්ගෙන් 90% කට පමණ ඉතිහාසය වැනි කරුණු ගැන අවබෝධයක් නැත. එහෙත් මත්ද්‍රව්‍යය, දුම්පානය ගැන රූපවාහිනියෙන් ප්‍රචාරය වන දැන්වීම් වල ඇති ගීත කොටස් කට පාඩම්ය. ඉතිහාසය පෙල පොත් වලින් ඉවත් කිරීමෙන් ජාතිය මකා දැමීමේ කුමන්ත්‍රණයකි. අනාගත ළමුන් ලංකාවේ ඉතිහාසය ගැන මොනම කරුණක්වත් නොදන්නා පිරිසක් බවට පත්වෙති. ලංකාවේ ඇති බෞද්ධ සිද්ධස්ථාන ගැන පවා නොදන්නා අනන්තවත් ළමුන් මට මුණ ගැසී ඇත. තත්ත්වය ඉතා බරපතල බව මා ලද අත්දැකීම් කියා පායි. රූපවාහිණී නාලිකා ඔස්සේ ඉතිහාසය ගැන සකස්වුණ වැඩසටහන් අල්පය. ඉදහිට හෝ එවැනි වැඩසටහනක් ප්‍රචාරය වූවත් ඒ අතර තුර ප්‍රචාරය වන වෙළඳ දැන්වීම් වලින් කියන්නෙ බීර වල හා දුම්පානයේ ඇති සොඳුරු ආස්වාදයක් ගැනයි. අනේ මෙහෙමත් රටක්. ඕනෑ තරම් රටේ බුද්ධිමත්, උගත්, ප්‍රසිද්ධ පුද්ගලයෝ හිඳිති. ඔවුන් ගෙන් වැඩි දෙනා නිහඬය. සමහරක් අයව නිහඬකර ඇත. ඒ තාන්න මාන්න වල හාස්කම් නිසාය. පෞරාණික දේ කොල්ල කති. ඒවාට ඇති දඬුවම් අල්පය. ඒවාට ඇති දඬුවම් වැඩි කළ යුතුය. එහෙත් සිදුවන්නෙ වෙනත් දෙයකි. වගකිව යුත්තෝ නිදි වැදී සිටිති. අපේ ජාතියේ කරුමය ගැන මීට වඩා කුමක් කියන්නද? වගකිව යුත්තෝ ඔවුන්ගේ පැවැත්ම වෙනුවෙන් නිහඬව සිටිති. රූපවාහිණියෙන් ලඟදී ප්‍රචාරය වූ ප්‍රශ්ණ වැඩසටහනකට දිවයිනේ සුප්‍රසිද්ධ පාසැල් 2ක් සහභාගී විය. අහම්බෙන් මෙන් මටද එය නැරඹීමට අවස්ථාවක් ලැබිණි. ඉතිහාසය පිළිබඳ වටය එළැඹිණි. ඒ පිළිබඳ මගේ ඇති උනන්දුව නිසා වාඩිවී සිටි පුටුවෙහි හරි බැරි ගැසී එය නැරඹීමට උනන්දු විය. ඉතිහාස ගැන ප්‍රශ්ණ 10 ක් ඇසිනි. සියල්ලටම ලැබුනේ හතර බීරී උත්තරය. ප්‍රශ්ණ අසා අවසානයේ ප්‍රශ්ණ විචාරක මහතා ඉතා වැදගත් දෙයක් කීය. එනම් තව ටික කලෙකින් ලංකා ඉතිහාසය, එනම් සිංහලයාගේ ඉතිහාසය වැලලී යන බව ඒකාන්ත බවය. ප්‍රශ්ණ සියල්ලටම ලැබුනේ වැරදි උත්තරයි. අද අපේ ළමුන්ගේ ඉතිහාස දැණුම ගැන ඉතාමත්ම කණගාටුදයකය. ළමා පරපුරට ඇසට දකින්නට ඇත්තේ කියවන්නට ඇත්තෙ විකාර දේවල්ය. සිංහල වැඩිහිටියන් ලෙස අප අප ගැනම කණගාටුවිය යුතුය. අපේ සමහරු හැන්දෙන් ගෑරුප්පුවෙන් බත් කති. ඒ සිතේ මවාගත් උසස් බව සමාජයේ අන් අයට ප්‍රදර්ශනය කිරීමටය. ගැට පොලොස් මාලුව හැන්දෙන් කති. පොලොස් මාලුව අතින් පොඩිකර කැවිට ඉතාමත් රස බව ඔවුන් දනිති. අතීත් කරුණු ගැනත් ඔවුන් දනිති. එහෙත් නොදන්නවා වාගේ හිඳින්නෙ තමන්ගේ පැවැත්ම වෙනුවෙනි.

**අප සියලු දෙනාම සමාජයේ පුරුක් වන නිසා පවුල නැමැති ඒකකය ශක්තිමත් ලෙස සකස් කරගත යුතුය. රටට කළ හැකි සේවය අපගේ පවුල නැමැති ඒකකය ශක්තිමත් කර ගැණීමයි. හැකි සෑම විටම ආගමික පරිසරයේ ඇසුර දරුවනට ලබා දිය යුතුය. ජාතිය, ආගම රැක ගැණීමේ ඇති වැදගත් කම ඔවුනට කුඩා කල සිටම කියාදිය යුතුය. සුදුව, ගණිකා ඇසුර, මත්ද්‍රව්‍යය, කාම චිත්‍රපට, වැනි දෑ රටින් තුරන් කළ යුතුය. කාම චිත්‍රපට නිපදවන්නෙ විදේශිය රටවලය. අප ඒවා මුදල් ගෙවා ලබා ගනිති. අපේ මුදල් පිටරටට ඇදී යයි. මුදල් දී මහා විනාශකාරී දෙයක් අප ලබා ගණී. ඒ මුදල් වලින් වටිනා පොතක් මිලදී ගත්තෙ නම් මොනතරම් වටිනේද? ටිකක් කල්පනා කර බලන්න.**

ලංකාව මුළු ලෝකයම දැණ හඳුනාගත්තේ 1996 දී අප දිනාගත් ලෝක කුසලාන ක්‍රිකට් ශූරතාවය නිසායැයි බොහෝ දෙනාගේ අදහස වූවත් සත්‍යය එය නොවේ. සත්‍යය ඇති එකම ආගම වන බුද්ධාගම රැ දී පවතින්නෙ ශ්‍රී ලංකාවාසීන් අතය. ලෝකයේ ප්‍රථම අගමැතිවරිය බිහිවූයේ ලංකාවෙනි. එපමණක්ද නොවේ. එක්සත් ජාතීන්ගේ සෞඛ්‍යය වාර්තාවේ සදහන් වන පරිදි ලෝකයේ ජනගහන ඝනත්වය අනුව බීමත්ම පුද්ගලයන් බහුල රට ලංකාවයි. ලෝකයේ වඳවී යන ජාතීන් අතර ලංකාවේ සිංහල ජාතිය දෙවැනි ඕස්ට්‍රේලියාවේ ඇබජිනියර්ස්ට හා දකුණු ඇමෙරිකාවේ රතු ඉන්දියානුවන්ට පමණි. අපි, අපි ගැන කරුණු නොදන්නවා වූවාට, ලෝකයම අපි ගැන දනිති. තව ඉදිරියේදී ලෝකයේ නිකරුනේ කාලය නාස්ති කරන පුද්ගලයින් බහුලම රට, ලෝකයේ කම්මැලිම ජාතිය වෙසෙන රට, ලෝකයේ රටවල් අතරින් බටහිරට වැඩියෙන්ම ගැති රට, ලෝකයේ ස්ත්‍රී දූෂණ හා ළමා අපචාර වැඩිම රට, තම නිෂ්පාදනයන් පාගා දමා පිටරට නිෂ්පාදනයන්ට මුල් තැන දෙන ප්‍රමුඛ රට, කෘෂිකාර්මික රටක් වූවත් හාල් කිලෝවක මිල වැඩිම රට ලංකාව ලෙසත් මෙකී නොකී සියලුම දේ වලින් ලංකාව ලෝකයේ ප්‍රමුඛතම රට ලෙසට වාර්තා පිට වාර්තා තබනු නිසැකය. සිංහල ජාතියේ අනන්‍යයතාවය දවසින් දවස විනාශ මුඛයට ඇදී යයි.

බලයට ඇති කෑදරකම නිසා රට විනාශ වී යයි. ඒ බවට අතීතයේ සිටම කරුණු ගෙන හැර දැක්විය හැක. ආගමික, සුචරිතවාදී නායකත්වයන් යටතේ මේ රටත්, සිංහල ජාතියත්, බෞද්ධාගමත් රැකගන්නට වාසනාව ලැබේවායි ප්‍රාර්ථනා කරමින්, ලංකාවාසි සැවොම සුචරිතවාදී මිනිසුන් වේවායි ප්‍රාර්ථනය කරමි. ජාතිය වැටී ඇති අගාධයෙන් බේරා ගනිව්. ඉතිහාසය වලලන්නට ගන්නා සියලු උත්සාහයන් වලකා ලව්.

අද සිංහල ජාතියත්, බෞද්ධාගමත් වැටී ඇති තත්ත්වයෙන් මුද ගැනීම පිණිස මහා සංඝරත්නයේ මූලිකත්වයෙන් රට පුරා විශාල වශයෙන් මිනිසුන් දැණුවත් කිරීමේ වැඩ පිළිවෙලක් දියත් කිරීමේ ඇති අවශ්‍යයතාවය මොනවට පැහැදිලි වේ.

මීට විශේෂ ලියුම්කරු
සී.අ.ර


# සිද්ධාර්ථ, යසෝධරා

# ශාක්‍ය පරපුර හා කෝලිය පරපුර ගැන දැනගනිමු


කිඹුල්වත් නුවර (කපිලවස්තුව) ශාක්‍යයන්ගේ ඉතිහාසයත් දෙව්දහ නුවර කෝලිය වංශිකයන්ගේ ඉතිහාසයත් එකට සම්බන්ධ වී පවතී. ඔවුනොවුන් ඥාති අවාහ විවාහ සිදු කරගෙන රාජ්‍ය දෙක පාලනය කර ඇති බව බෞද්ධ ග්‍රන්ථවල සඳහන් වේ. ප්‍රථමයෙන් කපිලවස්තු නුවර රාජ්‍යයට පත්ව ඇත්තේ ජයසේන නම් රජ කෙනෙකි. ඉන් පසුව ඔහු පුත් සිංහහනු කුමරා රාජ්‍යයට පත්ව ඇත. මේ සිංහහනු විවාහ වී ඇත්තේ කෝලිය වංශික දෙව්දහ රජුගේ දියණිය කච්චායන කුමරිය සමගය. ඇයට සිංහහනු නිසා සුද්ධෝදන, ධෝතෝදන, මිතෝධන, සුක්කෝදන, අමිතෝදන, යනුවෙන් පුතුන් පස් දෙනෙක්ද අමිතා, ප්‍රමිතා යනුවෙන් දියණියන් දෙදෙනෙක් වශයෙන් දරුවන් හත් දෙනෙක් ලැබී ඇත.

ශාක්‍ය වංශික ජයසේන රජුගේ දියණිය යසෝධරා කුමරිය සමග දෙව්දහ රජුගේ පුත් කුමරා වන අංජන විවාහ විය. ඇයට සුප්පබුද්ධ, දණ්ඩපානි, මහාමායා, ප්‍රජාපති ගෝතමී යනුවෙන් දරුවන් සිව් දෙනෙක් ලැබී ඇත. මහාමායා කුමරියත් ප්‍රජාපති ගෝතමී කුමරියත් ශාක්‍ය වංශික සුද්ධෝදන රජතුමා අවස්ථා දෙකකදී විවාහ කර ගත්තේය. එමෙන්ම සුප්පබුද්ධ රජු සුද්ධෝදන රජුගේ සොහොයුරිය වන ප්‍රමිතා කුමරිය සමග විවාහ විය. මහාමායා කුසින් සිද්ධාර්ථ කුමරා බිහිවූ අතර ප්‍රජාපති ගෝතමියට නන්ද කුමරාත්, සුන්දරී නන්දත් ලැබිණි. සුප්පබුද්ධ රජුගේ දේවිය වන ප්‍රමිතා දේවදත්ත, යසෝධරා යන දෙදරුවන් බිහිකලාය. යසෝදරා කුමරිය ශාක්‍ය වංශික සිදුහත් කුමරාගේ බිසව වූවාය. ඇයට රාහුල නමින් පුත් කුමරෙක් ලැබිණි. ශාක්‍ය කෝලිය වංශිකයන් අතර පමනක් මේ විවාහ ක්‍රමය සිදුවී ඇත. ඔවුන්ගේ කුල ප්‍රශ්නය හා මානයෙන් අධිකවීම නිසා මෙසේ ඔවුනොවුන් අතර පමනක් අවාහ විවාහ සිදුවන්නට ඇත. සිංහහනුගෙන් පසු සුද්ධෝදන කපිලවස්තුපුර රජවිය.

## ශාක්‍ය පරපුර




## කෝලිය පරපුර





සෙ/301701 කෝප්‍රල් ජයසූරිය එම්. ඩී.එස්
රෙජි මූඛ- ශ්‍රීලපාහ
පනාගොඩ.


([illegible] ගුණවංශ හිමි සංස්කරණය කරන ලද " කිඹුල්වත් පුවත " නම් වූ පොතෙහි තෙවන මුද්‍රණයෙන් උපුටා ගැනිනි.)

# 7 වන බලඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාව 11 වන සංවත්සරයට පා තබයි

වර්ෂ 1992 ක්වූ නොවැම්බර් මස 20 වන දින යාපනය අර්ධද්වීපයේ මන්ඩතිව් දූපතේ මෙම බළඇණිය නිළ වශයෙන් ස්ථාපිත කරන ලද අතර, එවකට අණදෙන නිළධාරීව කටයුතු කල ලුතිතන් කර්නල් ජී.එම් රොක්වුඩ් ආර්එස්පී පීඑස්සී ශ්‍රීලපාහ ගේ මග පෙන්වීම යටතේ ජ්‍යෙෂ්ඨ නිළධාරීන්ගේ ඉමහත් ප්‍රශංසාවන් මැද 7 බසේමූ යටතේ අලිමංකඩ ඉදිරි ආරක්ෂක වලල්ලේ ආරක්ෂාව තහවුරු කර ගැණීම ප්‍රථම අදියර ලෙස සඳහන් කල හැක.

බළඇණි පුහුණුවීම් වලින් ලද දැණුම සම්භාරය ප්‍රයෝජනයට ගනිමින් කෙමෙන් කෙමෙන් ක්‍රියාන්විතයන්ටද සහභාගි වෙමින් රටේ ජනතාවගේ ඒකායන පැතුම වන සාමය නමැති ඵලය නෙලා ගැණීමට එද මෙද තුර තම ජීවිතය පරදුවට තබා දේශය වෙනුවෙන් සටන් කල උදරතර රණවිරුවන් 7 වනබළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදවේ 11 වන සංවත්සරය වෙනුවෙන් ප්‍රථමයෙන් මෙසේ සිහිපත් කරන්නෙමු.

2003.11.20 වන දින විශේෂිත වූ දිනයක් බැව් අප කවුරුන් නොදන්නා තරම් වූ රහසකි. එනම් 7 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදවේ තවත් එක් කාල පරිච්ඡේදයක් නිමා කරමින් උදවුන 11 වන සංවත්සරය වෙනුවෙන් කෙටි සමාලෝචනයක් මෙසේ සටහන් කරමි.



බෙදුම්වාදී ත්‍රස්ථවාදීන්ගේ මිලේච්ච ක්‍රියා කලාපයන් හමුවේ නොපසුබට උත්සාහයෙන් හා දැඩි උනන්දුවෙන් කටයුතු කල මෙම බළඇණිය ක්‍රියාන්විතයන්ගෙන් තාවකාලිකව මිදීමත් සමගම සාමයේ අරුණළු සේයාවන් සැම සිතකම පැතුම් තංවන මෙවන් වකවානුවක් තුල යුද්ධයේ කටුක ඇත්දැකීම් සහ සටන් බිමේ නීරස අත්දැකීම් වලින් වෙහෙසට පත් සෙබළාගේ චිත්ත ධෛර්‍යය ඉතා උසස් මට්ටමකට ගෙන ඒමට ක්‍රියා කල අණදෙන නිළධාරී වන මේජර් ඊඑ්පී සුජීව ආර්එස්පී ශ්‍රීලපාහ විසින් 11 වන සංවත්සරය වෙනුවෙන් කැපකල මෙහෙය දිවි ඇති තුරාවට 7 වන බළඇණියේ සියලු සාමාජිකයින් හට අමතක නොවන සිහිවටනයක් වනවාට නොඅනුමානය.



අධික වර්ෂාපතනයක් වාර්ථා කරමින් ඇද හැලුනු දිය දහරාව පොලොව මත රුටා වැටෙමින් ගම් නියංගම් පිරී ඉතිරී ගිය මොහොතක් වන වර්ෂ 2003 ක්වූ නොවැම්බර් මස 19 වන දින ඒකක අණදෙන නිළධාරී තුමන් හට 11 වන සංවත්සරය වෙනුවෙන් උදෑසන 0900 පැයට පමණ සම්මාන මුරයක් පවත්වන ලද අතර, ලෝක ස්වභාව ධර්මයද වෙනස් කරමින් ඉතා පැහැබර රිදීවන් ආලෝකමත් නිල් අහසත් සමග එම සම්මාන මුර ඉතාමත් අනභිබවනීය අන්දමින් සිදු කිරීමට හැකිවූයේ 7 වන බළඇණිය වෙනුවෙන් මහගු සේවයක් කල අණදෙන නිළධාරි හා සෙබලුන් වෙත කෙරුනු දේව ආශිර්වාදයක් වශයෙනි. අනතුරුව අණදෙන නිළධාරි විසින් බළඇණියේ මියගිය නි/සෙසුනිළයින් හා තුවාල ලැබූ සියලු රණ විරුවන් සිහි කරමින් ඔවුන් කල උදර මෙහෙය අගය කරමින් දේශනයක් පවත්වන ලදි. අනතුරුව මෙම බළඇණියේ සෙබලුන් වෙත සාදයක් පැවැත්වින. එකම තීරණයක එල්බ සිටු මතකයන් විවිධත්වයකට භාජනය කිරීම වස් ඉදිරි අනාගතයක වගකීම්භාර දෙමින් ඒකකයේ සුදුසු සෙනින් වෙත නිළ උසස්වීම් ලබා දෙන ලදි. යුධ බිමේ වින්දනය මෙන්ම තම රට ජාතිය වෙනුවෙන් උදර මෙහෙයයන් සිදු කර දීමට වග බලා ගන්නා ලෙස දැනුම් දෙමින් පස්වරු 1700 පැයට පමණ සෙබළ සොයුරන්ගේ සාදය ආරම්භ කෙරුනි. 7 වන බළඇණියේ (Seven Hackle) වාදක මණ්ඩලය විසින් සත්සර මුසු කරමින් වර්ණවත් කල එම සාදය ඉතාමත් ප්‍රීතිජනක සාදයක් විය. 2003.11.23 වන දින කොනොනි සමාජ ශාලාව වෙතද, 2003.11.28 දින බනි/සැරයන් නිවස්නය වෙතද, එවැනිම වූ සාදයන් පිරිනැමීම මගින් නිළ ඇඳුම ගතට හිරවී ගිණි අවිය දෑතට රැගෙන සතුරාගේ බලාපොරොත්තුව පමණක් උරුම වූ සෙබලුන් වෙත මෙවන් දිනයක ඒ සියල්ල මොහොතකට අමතක කර දමා තම ආදරණීය තාරුණ්‍ය ප්‍රදර්ශනය කරමින් විනෝද වීමට ලැබීමත් එක්තරා අතකට 7 වන බළඇණියටම නොමැකෙන සටහනක් වනවාට නොඅනුමානය.

1992 නොවැම්බර් මස 20 දින සිට පුරා වසර 11 ක් සපිරෙන මේ මොහොත දෙස ආපසු හැරී බැලීමේදී අප ආ ගමන ඉමහත් දුෂ්කරවූ එකක් වන අතර රටේ ඒකියභාවය හා භෞමික අඛණ්ඩතාවය ස්වාධීනත්වය ආරක්ෂා කරගැනීම වස් 7 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදවේ කීර්තිය වෙනුවෙන් ඇප කැපවී කටයුතු කල අණදෙන නිළධාරීවරුන් සහ ඒකකයේ රාජකාරියේ නියැලෙමින් දේශයට 'සේවය කරමි' යන උඩෘත පාඨයට අනුව බළඇණියේ කීර්තිමත්භාවය රැද පැවැත්මට උරදුන් සියලු උදරතර සෙබලුන් හටද ගෞරවය හා කෘතඥතාවය පලකරමු.

බුද්ධි අංශය 7 ශ්‍රීලපාහ

# "It is a sad moment to be in , but ........."

**(Farewell speech given by Maj Gen D. Rathnasabapathe RWP RSP USP on 8th April 2004.)**

**Chief of Staff of the Army- Major General Kottegoda & Madam Kottegoda,**
**Colonel of the Regiment -Major General Mallawaarachchi & Madam Mallaawarachchi,**
**Senior Officers and their ladies,**
**Colonel Commandant,**
**Officers,**
**Ladies and Gentlemen**

At the outset, I take the opportunity to express my sincere thanks and deep gratitude to all of you present tonight, to bid farewell to me, on my retirement from the army, after accomplishing thirty one year of continued service.

I owe a special word of thanks to Colonel of the Regiment General Mallawaarachchi, for his untiring efforts , towards organising this farewell, amidst a series of commitments he has been saddled with, especially, during this period.

Ladies and Gentlemen , if you take your minds back, it was only a few weeks ago, that all of us, had the occasion to meet together, under similar circumstances,at the same Venue, to say good bye, to Major General Jayantha Ranaweera.

Then it is now my turn , Well ladies and gentlemen , that is a common phenomenon to all of us, serving the Army, in a way , it is a sad moment to be in but in a way, it is a moment , where you really feel relieved, especially , as an infantryman. We must accept the fact that all good things come to an end by passage of time.

At this point of time , with great pride,coupled with sentiments I wish to take my mind and memory back to, over three decades , where, I having completed my academic studies-and the sports career at National Level arrived at the worthy and firm decision , to pick up my profession and career, as an Officer in the Sri Lanka Army , which has been considered the most disciplined Service among the three services and contribute productively towards the national welfare and primarily be committed to safeguard the territorial intergrity and sovereignty of the motherland

I must say that, I was destined and fortunate enough, to merit consideration , to be enrolled ,as an Officer Cadet in the Army, and accordingly, had the opportunity to, most willingly, courageously and cheerfully,meet the challenge ahead, with utmost determination , and go through a comprehensive period of military training , including occasional bullying by Instructors at all levels and being addressed as Mr, Subjecting myself to occasional punishments, and receiving enough and more of Wam Dak ,Wam Dak and Double UP Orders as a part of game, before I was finally, Commissioned in the rank of Second Lieutenant , and posted to the most , prestigious,and oldest, CLI Regiment ,Renowned to follow, jealously Guarded customs and traditions, peculiar to our Regiment,with pride and honour.

After joining the Regiment I had the fortune of serving under several past most eminent Commanding Officers, possessing a wealth of knowledge and experience ,and learnt varied duties ,responsibilities ,and traditions,they tried me out on various appoiments, and finally , they groomed me, to be a professional Officer. Although none of them are in attendance tonight I would be failing in my duty and moral obligation ,if I do not , most respectfully express my deep gratitude to them, at this forum and perpetuate such memories. One may wonder ,as to why I have not, so far, paid a tribute to, the senior officers present here, for the guidance given to me, from time to time, in the discharge of my duties, on occasions, where,I have had the privilege of working together with them and elsewhere too. Sirs, I am not leaving you out, in this exercise I wish to most respectfully place on record that you have, not only,been extremely helpful to me, but also , have always served as a great strength , at the time of need, while most cordially ,associated me as brother officer,Sirs,I am very grateful to you,

On account of the unstinted support, guidance and cooperation, extended to me by my superiors, equals, and juniors at all levels, I was successful in meriting consideration to hold practically all command appointments ,such as, platoon Commander, Company Commander ,Battalion Commander, Brigade Commander ,Division Commander, and finally Deputy Security Force Commander, apart from the appointments held in the Regiment, and the Staff appointments, held in a several Higher Headquarters in the Army, I take the opportunity to express my deep gratitude to the Commander of the Army and relevant senior officer for affording me an opportunity to hold such responsible and coveted appointments in the Army especially at time when the territorial integrity and sovereignty of the motherland were threatened .Though in their absence,I consider it my inherent duty to express my deep gratitude for bestowing the trust and confidence in me.

While I was holding above appointments ,away from my dear home ,the commander at home ,was my dearest wife Dayani, who is with me tonight. She had the courage , determination utmost patience and tact in grooming the two sons of mine,and tolerating me and looking after the home front at the same time and also to cooperate with me and continue the subsistence of the wedlock for over two decades Ladies and gentlemen, I consider her as a great wife and affectionate mother to the children.Doesn't she deserve an applause from this audience at this stage, Dayani my sincere thanks and deep gratitude to you,

which I usually do not say .At the same time, I must take this opportunity to thank my two sons Ramesh and Sidesh for tolerating my absence and cooperating with the mother and sharing their affection with her most of the time.

Ladies and gentlemen it is needless to overemphasise the fact that we,the members of CLI have traditionally, lived like a family,always sharing the happiness and sorrow together. I am quite confident that this togetherness and oneness will continue thorough the years to come A series of ceremonies ,including a Guard Turn out, Guard of Honour and an All rank Address were afforded to me today under the auspices of Colonel Commandant. In my address as an outgoing Officer, who served with most of those who made their supreme sacrifice in the noble task of safeguarding the territorial intergrity and sovereignty of the motherland. I had the opportunity to pay my respects to them. I also had the opportunity to explain to the troops the importance of good discipline, value of training and military proficiency, essential to meet the future challenges as infantrymen. It is the same advice that I convey to the junior Officers, who are with me tonight.

During my long service of 31 years I might have taken disciplinary action on offenders, being harsh or offensive at times on my juniors .Please permit me to say that such actions, were devoid of malice and nothing personal. In addressing my seniors present tonight. I must confess that I might have made mistakes or had shortcomings, during the course of discharging my duties under your purview in my 31 years of service ,I am sure ,you did look after me in such instances. Erring is human and forgiving is divine. Caution ladies and gentlemen, this premise should not be applied for everything in life.Dayani and I enjoyed your warm hospitality. We greatly appreciate the kind sentiments expressed by Colonel of the Regiment. We greatly value your memorable moment to, which no doubt, will find a special place in my paradise. We most sincerely offer our best wishes to CLI Regiment, all members, their families and you all, who are the main custodians of the regiment,

*May the blessings of noble triple gem be with you...!*

# පුද්ගලික ආරක්ෂාවේ අයිතිය.

**(පසුගිය කලාපයෙන්..................)**

පසුගිය කලාපය තුලින් මා ඔබට විග්‍රහ කලා පුද්ගලික ආරක්ෂාවේ අයිතිය ප්‍රාග් ඓතිහාසයේ සිට ගොඩනැගී ඇති ආකාරයක් එසේම ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ පනවා ඇති නීතින් සහ සීමාවන් පුද්ගලික ආරක්ෂාවේ අයිතින් සදහා කොතෙක් දුරට බලපාන්නේද යන්නත්. තවද ල.ද.ස. 92 වගන්තියේ සීමා කිරීම් අනුව පුද්ගලික ආරක්ෂාවේ අයිතිය පුද්ගලයෙකුට බලපාන ආකාරයක් 90 වන වගන්තිය අනුව දේපල පිළිබදව පුද්ගලික ආරක්ෂාවේ අයිතිය ක්‍රියාත්මක කල හැකි සීමාවන් මොනවාද යන්නත් අපි ඉගෙන ගත්තා.

එසේ නම් අද අපි බලමු පුද්ගලික ආරක්ෂාවේ අයිතිය පිළිබදව සීමාවන් පැවතීම සදහා සම්පූර්ණ කල යුතු අවශ්‍යතාවන් මොනවාද යන්න.

අ. තමා රාජ්‍ය සේවකයකු බව.

ආ. තමාගේ නිළ නාමයෙන් සද්භාවයෙන් කිරීම හෝ තම නිළයේ නාමයෙන් කිරීම සදහා රජයේ සේවකයෙකු විසින් නියෝග කිරීම.

ඇ. තමාගේ ක්‍රියාවෙන් හෝ ක්‍රියා කිරීමට තැත් කිරීමෙන් මරණය හෝ බරපතල තුවාල කිරීමක් පිළිබද සාධාරණ බියක් ඇති වීම.

ඈ. එම ක්‍රියාව නියම ලෙසම නීත්‍යානුකූල වීම අවශ්‍ය නොවේ.

තමා රජයේ සේවකයෙකු බවට හේතු නොමැති නම් 92(1) හා 92(2) හි සදහන් පුද්ගලික ආරක්ෂාවේ අයිතියේ සීමාව ඉක්මවා ක්‍රියා කිරීමට අනෙක් පක්ෂයට අයිතියක් ඇති බව 92 වගන්තියේ (1) හා (11) පැහැදිලි කිරීම් මගින් පෙන්වා දී ඇත.

රජයේ සේවකයෙකු විසින් රජයේ සේවකයෙකු වශයෙන් කරන ලද හෝ කිරීමට තැත් කරන ලද ක්‍රියාවකදී ඒ ක්‍රියා කරන තැනැත්තා රජයේ සේවකයෙකු බව යම් කෙනෙක් නොදන්නේ නම් හෝ ඔහුට ඒ බව විශ්වාස කිරීමට හේතු නැත්නම් ඒ ක්‍රියාවට විරුද්ධව පුද්ගලික ආරක්ෂාවේ අයිතිය ඇත.92(1) පැහැදිලි කිරීම.

රජයේ සේවකයෙකුගේ නියමයෙන් කරන ලද හෝ කිරීමට තැත් කරන ලද ක්‍රියාවකදී ඒ ක්‍රියාව කරන තැනැත්තා රජයේ සේවකයෙකු නියමයක් මත ක්‍රියා කරන්නෙකු බව යම් කෙනෙක් නොදන්නේ නම් හෝ ඒ ක්‍රියාව කරන තැනැත්තා තමා ක්‍රියා කරන්නේ කාගේ බලයක් අනුවද යනු නොකියන්නේ නම් හෝ ඒ ක්‍රියාව කරන තැනැත්තා වෙත ලිපියකින් දෙන ලද බලයක් ඇති විටෙක එය ඉල්ලන ලද නමුදු ඔහු එය ඉදිරිපත් නොකරන්නේ නම් ඒ ක්‍රියාවට විරුද්ධව පුද්ගලික ආරක්ෂාවේ අයිතිය ඇත. 92(2) පැහැදිලි කිරීම.

මෙම (1) හා (2) පැහැදිලි කිරීම් මගින් පෙන්නුම් කරන්නේ 92(1)(2) වගන්ති වලට අනුව රජයේ සේවකයෙකු බව හෝ රජයේ සේවකයෙකු ගේ නියමය අනුව ක්‍රියා කරන බව ප්‍රථමයෙන් අනෙක් පක්ෂයට පෙන්නුම් කල යුතු අතර ඒ බව දන්වා සිටිය යුතුය. එසේ නොමැතිනම් අනෙක් පක්ෂයට තමා රජයේ සේවකයෙකු බව දැන ගැනීමට සැලැස්විය යුතුය.

යම් ක්‍රියාවක් කරන තැනැත්තාගේ තරුණ භාවය බුද්ධිය මේරීමේ අඩු කම සිහි විකල් බව හෝ මත්කම නිසා නැතහොත් කරුණු වරදවා තේරුම් ගැනීම නිසා කරන ලද ක්‍රියාවලදී එම ක්‍රියාවට එරෙහිව යම් අයෙකුට පුද්ගලික ආරක්ෂාවේ අයිතිය ක්‍රියාත්මක කල නොහැක.

පෙර සදහන් සීමා කිරීම් වලට යටත්ව සිටින අවස්ථා වලදී පමණක් පුද්ගලික ආරක්ෂාවේ අයිතියේ වාසිය ගත හැක. එහෙත් තම රක්ෂණය සත්‍ය බැව් ඔප්පු කිරීමේ භාරය රැදී පවතින්නේ සාක්ෂි ආඥා පනතේ 105 හා 103 වගන්ති අනුව චූදිත පක්ෂය මත බැව් රාජාධිකරණය තීරණය කර ඇත.

**සෙ/90817**
**මාණ්ඩලික සැරයන් ආරියසේන ඊඑම්එස්**
**විශේෂ විමර්ශණ ඒකකය ශ්‍රීලයුපොහේබ**
**නාරාහේන්පිට**

# කකුසඳ බුදුහිමි ගැන පුරා විද්‍යා මතයක්.

බෞද්ධ පොත පතේ සදහන් වන අන්දමට මෙම භද්‍ර කල්පයේදී බුදු වරු පස් දෙනෙක් පහල වෙති. එනම් කකුසඳ ,කෝනාගම, කාශ්‍යප ,ගෞතම හා මෛත්‍රී යන බුදු වරුය. මෙම භද්‍ර කල්පයේදී පළමු වරට පහල වූ

උන්වහන්සේගේ බෝධිය විය. අවුරුදු හතලිස් දහසක් ආයු වැළඳූ උන්වහන්සේ ඛේම නම් උයනේදීම පිරිනිවන් පෑහ.

කකුසඳ බුදු රජුන් සමයේ ලක් දිව ඔජදීප නමින් හැදින්වී ඇත. ඕජදීපයේ අග නුවර අභය නගරය විය.

සැතපුමක් නැගෙනහිරින් පිහිටි හර්ඩාවා (Bhardawa)නැමැති ගමේ දක්නට ලැබෙන චෛත්‍යය කකුසඳ බුදුහිමිට පියා හමුවූ තැන කරවන ලද ස්ථූපය වශයෙන් පුරා විද්‍යාඥා ආචාර්‍ය ඒ ෆ්‍යුරර් මහතා හදුන්වයි.

කකුසඳ බුදුරජාණන් වහන්සේගේ උප්පත්තිය සිදුවූ ඛේමවතී නගරයේ පිහිටියේ කපිලවස්තු පුරයට ලී 50 ක් (සැතපුම් 8 1/3) දකුණු දිගිණි. මේ පැරණි නගරයේ නෂ්ඨාවශේෂ දනට ලොරි-කී කුඩාන් සහ ගොටිහ්වා(Gotihva) යන ගම් දෙකෙ අතරේ ඇතැයි ආචාර්ය ෆ්‍යුරර් මහතා කියයි. කපිලවස්තු පුරයේ දකුණු දෙරටුව පිහිටියේ දනට ශ්‍රි නගර් හෙවත් සාගර්(Sri Nagar or Sagar)නමින් හැදින්වෙන ගමේය. කකුසඳ බුදුහිමිගේ උප්පත්තිය සිදුවූ තැන බුද්ධත්වයෙන් පසු පියා හමුවූ තැන හා උන් වහන්සේගේ ධාතු නිධන් කල තැන යන ස්ථාන යන්හී සූථූප තුන හා විහාරයන්හී නටඹුන්ද මේ දක්වා දක්නට හැකි බව ෆ්‍යුරර් මහතා කියයි. කකුසඳ බුදු හිමිගේ ශාරීරික ධාතු නිධන් කර තනන ලද ස්ථූපය ඛේමවති නගරයේ ඇත. ගොටිහ්වා නැමති ගම මැද පිහිටි අඩි 80 ක් උස චෛත්‍යය කකුසඳ බුදුහිමිගේ ධාතු නිධන් කල ථූපය වශයෙන් ෆ්‍යුරර් මහතා හදුන්වයි.

**කකුසඳ බුදු රජුන් සමයේ ලක් දිව ඔපදීජ නමින් හැදින්වී ඇත. ඕජදීපයේ අගනුවර අභය නගරය විය. එහි අභය නම් රජකු රජ කොට ඇත. එකල මහමෙව්නා උයන මහාතිත්ත නම් විය. කකුසඳ බුදු හිමි ලක්දිවට වැඩ ධර්ම දේශනා කර උන්වහන්සේගේ ධබරාව පූජනීය වස්තුවක් වශයෙන් ලක්වැසියන්ට දී ලක් වැසියන් කෙරෙහි අනුග්‍රහයෙන් භික්ෂු භික්ෂුණීයන් පිරිසක් ද නවත්වා ජම්බුද්වීපයට වැඩම කළ බවද පොත් පත දැක්වේ. උන්වහන්සේගේ අධිෂ්ඨානය පරිද් ශිරිෂ (මහරි) බෝධියෙන් ශාඛාවක් රුචානන්ද නම් මෙහෙණිය විසින් ගෙනෙනු**

කකුසඳ බුදු හිමි පිළිබඳ තොරතුරු බෞද්ධ පොත් පත් ,ඉන්දිය ඉතිහාසය ග්‍රන්ථ හා පුරා විද්‍යාඥයින්ගේ වාර්ථා ඇසුරින් සොයා ගත හැකිය.

භද්‍ර කල්පයේ බුදුවූ පළමු බුදුරජාණන් වහන්සේ කකුසඳය. උන්වහන්සේ කකුසන්ද , හා ක්‍රකුචන්ද්‍ර යන නම් වලින්ද හැදින්වේ. කකුසඳ බුදු හිමිගේ පියා ලෙසට බන පොත් වල සඳහන් වන්නේ ඛේමවතී නුවර ඛේමංකර රජුගේ පුරෝහිත අග්ගිදත්ත නම් බ්‍රාහ්මණයාය. මව විශාඛා නම් වූවාය. දේවිය විරෝචමානා නොහොත් රෝචනී වූ අතර පුත්‍රයා උත්තර නම් විය.

උන්වහන්සේගේ උප්පත්තිය සිදු වූයේ ඛේම නම් උයනේදීය. අවුරුදු හාර දහසක් ඇවෑමෙන් ගෘහස්ථ ජීවිතය අත් හැර මහාභිණිෂ්ක්‍රමණය කළ උන් වහන්සේ අට මසක් දුෂ්කර ක්‍රියා කොට බුදු වූහ.

වජිරින්ද නැමති බ්‍රාහ්මණයකුගේ දියණියක් එතුමාට කිරිපිඩු පිළිගැන්වූවාය. ශිරිෂ (මහරි) වෘක්ෂයක්

එහි අභය නම් රජකු රජ කොට ඇත. එකල මහමෙව්නා උයන මහාතිත්ත නම් විය. කකුසඳ බුදු හිමි ලක්දිවට වැඩ ධර්ම දේශනා කර උන්වහන්සේගේ ධබරාව පූජනීය වස්තුවක් වශයෙන් ලක්වැසියන්ට දී ලක් වැසියන් කෙරෙහි අනුග්‍රහයෙන් භික්ෂු භික්ෂුණීයන් පිරිසක් ද නවත්වා ජම්බුද්වීපයට වැඩම කළ බවද පොත් පත දක්වේ. උන්වහන්සේගේ අධිෂ්ඨානය පරිදි ශිරිෂ (මහරි) බෝධියෙන් ශාඛාවක් රුචානන්ද නම් මෙහෙණිය විසින් ගෙනෙනු ලැබ ලක් දිව රෝපණය කරන ලදී.

කකුසඳ බුදු හිමි බුද්ධත්වයෙන් පසු ජන්ම භූමිය කරා වඩින ගමනේදී සිය පියා හමුවූ තැන ගොඩනැංවූ ස්තූපයක්ද දක්නට ලැබේ. මුලින් සඳහන් කල පැරණි ඛේමවතී (ඛේමා) නගරයේ මේ ස්ථූපය විය.කකුසඳ බුදු හිමිගේ උප්පත්තිය සිදු වූ තැන කරවූ ස්ථූපයට නුදුරුව දකුණු දිගින් මේ ස්ථූපය පිහිටි බව හියුංසියැං නම් චීන දේශාටක භික්ෂුව සඳහන් කරයි. ලොරි-කී-කුඩාන් (Lori- Ki -Kudan) නමැති ගමට

*ලුතිනන් තරිඳු වීරසිංහ-2ශ්‍රිලපාහ*
*ආණ්ඩුකාර කාර්‍යාලය*
*උ/නැ පළාත් සභාව*
*ත්‍රිකුණාමලය.*

# නිසල කාලයකදී සසල කල මෙහෙවරකට තුති මල් පුදමු........

ශ්‍රී ලංකා පාබල හමුදවට ඇත්තේ පෞඩ ඉතිහාසයකි. එයට හිමිකම් කීමට අපට වරම් ඇත්තේ රෙජිමේන්තු වශයෙන් විකාශනය වී ඇති ශ්‍රී ලංකා යුධ හමුදව එද හැදින්වූයේ එකම එක නමකිනි. එනම් ශ්‍රී ලංකා පාබල හමුදව ලෙසිනි. එවිට ශ්‍රී ලංකා පාබල හමුදවට අයත්ව තිබූ ඉඩම්,දේපල සහ ගොඩනැගිලි ප්‍රමාණයන් ඉතා විශාල වූ අතර යුධ හමුද රෙජිමේන්තු වශයෙන් ව්‍යාප්ත වීමත් සමග ඒවා ක්‍රම ක්‍රමයෙන් බෙදී විසිරී ගියහ. කාලයත් සමග ඇති වූ යුධ ව්‍යවසනයත් සමග අත්‍යවශ්‍යතා වැඩිවූ නිසාත් එම ඉඩම්, දේපල වල හිමිකම් නම ඒකක අතර බෙද දෙන්නට සිදු විය. ඒ හේතුවෙන් රෙමේ ශ්‍රිලපාහ ප්‍රවාහන අංශය ඉදිරිපිට තිබූ ගොඩනැගිල්ල ශ්‍රිලවියාඉ වැඩපල ස්ථාන ගත කිරීම සඳහා යොද ගත්තේය. කාලයත් සමග එම ස්ථානයේ යාන්ත්‍රික වැඩපල ස්ථිර විය. නමුත් යුධ වාතාවරණය නිමා වීමත් සමගම අපගේ ආබාධිත සොල්දදුවන් පිරිස ඉතා විශාල වූ හෙයින් ඔවුන්ගේ සුභ සාධනය සඳහා



අපට තිබූ සම්පත් ප්‍රමානවත් නොවීය. ඒ අනුව ඉඩම් හා දේපල වල අවශ්‍යතාවය අපට දැඩි ලෙස දනෙන්නට විය. ඒ අනුව ශ්‍රිලවියාඉ වැඩපල ස්ථාන ගත කර තිබූ ගොඩනැගිල්ල නැවත අප වෙත ලබා දීමට පුරෝගාමී වී කටයුතු කළ ජ්‍යෂ්ඨ නායකයෙක් විය. එම ශ්‍රේෂ්ඨ නායකයා සිහි කිරීමට මෙය අවස්ථාවක් කර ගැනීම මගේ අරමුණයි.

**ශ්‍රේෂ්ඨ නිළධාරියකු අපගේ අවශ්‍යතාවයන් උදෙසා කළ එම උතුම් මෙහෙය ගැන අප රෙජිමේන්තුවේ සොල්දාදුවන්ගෙන් පමණක් නොව සමස්ත යුධ හමුදා සොල්දාදුවන්ගේම චිත්ත ධෛර්ය වැඩි වීමට එය රුකුලක් වනු ඇත. එසේම අනාගතයේ රෙජිමේන්තු මූලස්ථානයේ බළඇණිය ලබන ජයග්‍රහන වලට ඔබෙන් ලැබුණු සහයෝගය අපට රුකුළක් වනවා නොඅනුමානය......**

රෙජිමුබ ශ්‍රිලපාහ ආරම්භ කර වසර 4 ක් පමණ ගෙවී ගියේය. ස්ථිර තැනක් නොවූ හෙයින් තාවකාලික හට නිවාසයක ආරම්භ කරන ලදී. ක්‍රමයෙන් වැඩි දියුණු වූ බළඇණිය ජයග්‍රාහණ රාශියක් ලබා ගත්තේ ක්‍රිඩා ක්ෂේත්‍රයේ නව වාර්තා තබමිණි. ආබාධිත වූ සෙබලුන්ගේ ශක්තියෙන් දියුණුවෙන් දියුණුවට පත්වූ රෙජිමුබ ශ්‍රිලපාහ නව ස්ථානයකට පැමිණියේ 2004 පෙබරවාරි 10 වන දිනය. මෙම දිනය අප බල ඇණියට මෙන්ම රෙම ශ්‍රිලපහ වෙතටම ඉතා සුවිශේෂි දිනයක් විය. රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් එන් මල්ලවආරච්චි ආර්ඩබ්පි, ආර්එස්පි, යූඑස්පි ,එන්ඩීසී මැතිතුමා විසින් විවෘත කරන ලද නව ගොඩනැගිල්ල ඉතා අලංකාරව නිම කලේ ආබාධිත රණවිරුවන් විම රෙජිමුබ ශ්‍රිලපාහ අප සැමටම ආඩම්බර විය යුතුය. මෙම අවස්ථාවේදී අප සිහිපත් කළ යුතු ජ්‍යෂ්ඨ නායකයා වෙන අයකු නොව 11 සේනාංකයේ හිටපු සේනාංකාධිපති වර්ථමාන යුධ සේවා ලේකම් මේජර් ජෙනරාල් කේබී එගොඩවෙල ආර්ඩබ්පී, ආර්එස්පී, යූඑස්පී මැතිතුමාය. **එද ආබාධිත අපේ රණවිරුවන් වෙනුවෙන් මහගු මෙහෙවරක් කල එතුමා මේ වන විට සේනාංකයේ රාජකාරි වලින් ඉවත් වී යුධ හමුද මූලස්ථානයට අනුයුක්තව රාජකාරි කරන නිසා අපට අපේ ස්වර්ණමය අවස්ථාවට මේජර් ජෙනරාල් කේබී එගොඩවෙල ආර්ඩබ්පී, ආර්එස්පී, යූඑස්පී මැතිතුමා සහභාගි කරවා ගැනීමට නොහැකි වුවත් රෙම ශ්‍රිලපහ අධිපති තුමා ඇතුලු සියලු දෙනාම මේජර් ජෙනරාල් කේබී එගොඩවෙල ආර්ඩබ්පී, ආර්එස්පී, යූඑස්පී මැතිතුමා සිහිපත් කරන්නේ ස්තූති පූර්වකය.**

ශ්‍රේෂ්ඨ නායකයකුගේ ගුණාංග විදහා දක්වමින් ඔබ අප වෙත කල මෙහෙවර ගැන ගුණ වර්ණනා කරන්නට අපට වචන නැත. ඔබ වැනි ශ්‍රේෂ්ඨ නිළධාරියකු අපගේ අවශ්‍යතාවයන් උදෙසා කළ එම උතුම් මෙහෙය ගැන අප රෙජිමේන්තුවේ සොල්දදුවන්ගේ පමණක් නොව සමස්ත යුද හමුද සොල්දදුවන්ගේම චිත්ත ධෛර්ය වැඩි වීමට එය රුකුලක් වනු ඇත. එමෙන්ම අනාගතයේ රෙජිමේන්තු මූලස්ථාන බල ඇණිය ලබන ජයග්‍රහණ වලට ඔබෙන් ලැබුණු සහයෝගය අපට රුකුලක් වනවා නොඅනුමානය.

**මේජර් ඩබ්පීඑච් මංචනායක**
**ආර්එස්පී ශ්‍රිලපාහ**
**2 අනි- රෙජිමුබ**
**ශ්‍රිලපාහ.**

# මේජර් ජනරාල් සීජේ රණවීර
# නිත්‍ය සේවයෙ

## රෙජිම - ශ්‍රීලපාහ 2004.02.10 දින සම්මාන පෙළපාලියේ විශේෂ අවස්ථා....



සම්මාන මුරය පරීක්ෂා කරමින්...



සම්මාන මුරය පෙළපාලියේ උත්තමාචාරයට සිය සමාචාරය...



සම්මාන පෙළපාලියේ වර්ණ ධජයන්ට ආචාර කරමින්...



සම්මාන පෙළපාලියේ උත්තමාචාරය ...



සම්මාන පෙළපාලියේ උත්තමාචාරය.....



ශ්‍රීලපාහ නිළධාරී/සෙනින් ඇමතීමට පැමිණි මෙහොත...



උත්සව සභාව අමතමින්...



උත්සව සභාවට රැස්වූ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් ප්‍රමුඛ උත්සව සභාව...

# ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී
# න් සමුගැනීම



මේජර් ජනරාල් සීජේ රණවීර ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී සහ එම මැතිණිය පිළිගැනීම ...



නිළධාරි නිවස්නය ඉදිරිපිටදී කණ්ඩුලට සංග්‍රහයක්...



සාදය ආරම්භ වීමට ප්‍රථම රෙජිමේන්තු ගීතය ගායනා කරමින්...



සාදයට අසුන් ගෙන...



සාදයට අසුන් ගෙන...



රාත්‍රී භෝජන සංග්‍රහයට අසුන් ගත් මෙහොතක්.....



රෙජිමේන්තු අධිපතිගෙන් සමරු තිළිණයක්...



ශ්‍රීලපාහ ජ්‍යෙෂ්ඨතම නිළධාරීන් වර්ණ ධජයන් සමග...



නිළධාරි නිවස්නයෙන් සමුගැනීමට ප්‍රථම සිය අත්සන සමරු සටහන් පොතට...



රෙජිමේන්තු අධිපතිතුමන් සභාව අමතමින්...



සාදය අවසානයේ සමූහ ඡායාරූපයකට පෙනී සිටි අයුරු...



නික්ම යාමට පෙර...

# නිලධාරී නිවස්න භෝජන සංග්‍රහය...

**VETERAN " OLD FAITHFULS" VISIT REGIMENT**

The regiment was honoured to host Major DMC Anderson on 30 December 2004 after he retired from the army almost forty years ago. Now domiciled Australia he was on holiday with his wife Gennifer and son. He expressed a desire to visit the regiment and he was to squeeze in a few hours to already very tight schedule. He was accorded a memorable reception and was received by the centre commandant Col JS Masakkara and was escorted to the auditorium of the regiment accompanied by kandian dancer and dancer of the regiment. A film depicting activities of the regiment proceded by the regimental march" I am ninety five" and the regimental anthem was shown. After the usual introductions he made a short speech which was filled with emotion .He was taken around the unit and was greatly impressed with the development and the progress the regiment had made and was very appreciative of the steps taken to rehabilitates the disabled. He made a contribution of Rs 10000.00 towards the welfare of the disabled soldiers a gesture much appreciated .

It will be recalled that Maj. Anderson belong to the 1st batch of cadet who went to the Royal Military Academy Sandhurst in 1950 Having passed out from Sandhurst he was commissioned as a 2/ LT in 1st battalion CLI 2nd August 1951 .He was a top notch athletic having won Sandhurts athletic colours for establishing an acadamy record in the hop step & jump. He is a graduate of the staff collage in queenseliffe Australia being the 1st Sri Lankan to do so in June 1961 . He held many important staff appointments at Army HQ and other formations .He was also the chief instructor of the first jungle warfare course conducted at Rediyagama in the early sixties. He was a very professional officer liked by his superiors, equals and subordinates. Maj Anderson no doubt will keep in touch with the regiment and the regiment will be pleased to welcome him on his next visit to Sri Lanka.

30,Munja Way,
Nollamara,
W,Austraila,
**21.01.2004.**

**Maj Gen Mallawaarachchi RWP USP ndc pse**

Col of the Regt, SLLI,
Regimental Centre.
Army Cantonment,
Panagoda,
Sri Lanka.

Dear General,

I am in receipt of the letter from Maj Santhanam acknowledging my modest contribution towards the worthy cause of the disabled soldiers.We were most impressed with the work they are doing and wish them all success in their venture.

May I also take this opportunity to thank you personally for the warm an friendly hospitality accorded to us by Col Masakkara and Regiment to the Cantonment which Gen Athukorala assures me was orchestrated by you. Even though we were returning to Sri Lanka after an absence of 40 years your Officers made us feel we had never left home. I will be writing directly to the Colonel to express our sincere thanks.

May I conclude by wishing you and The Regiment the very best, and hope pray that lasting peace will prevail in this fair first which will always be my First Home.

Yours Sincerely
Maj. D.M.C. Anderson I/ CLI (Ret).

---

Major General SMA Jayawardena VSV, who joined the Sri Lanka Army on 15 December 1955 was commissioned to the First Battalion Sri Lanka Light Infantry (1SLLI) as a Second Lieutenant. After holding many appointments in the unit,he became the Commanding Officer of the 1SLLI on 01.05.1977 and commanded the Battalion until 14.01.1981. He held many important office,s in the Army before he took over the command as the Regimental Commander on 01.03.1988. He was the first Regimental Commander of SLLI and left of the office 04.04.1988. Major General SMA Jayawardena who retired from the Army on 18.03.1989 left for the USA to settle there.

During his tour to the island, this senior Officer arrived in the RHQ SLLI around 1700 hrs on 20 January 2004 for a visit. He was welcomed at the SLLI main entrance and accompanied to the auditorium No 01 in a procession preceded by the SLLI Kandian dancing team and drummers. Before he entered the auditorium ,he did not forget to fondle and feed the regimental mascot with fruits who waited at the entrance.

A short video presentation on the progress of the Regiment was shown after the Centre Commandant, Col JS Masakkara RSP delivered the welcome speech. The event was followed by a tea party during which this senior Officer shared views with those officers present. Before he left for the SLLI Officers' Mess.

Major General HV Athukorale VSV PSC FBIM (RTD) Major General UA Karunarathna RTD Regimental Comd Major General N Mallawaarachchi RWP USP ndc psc, 11 Div Comd Major General GBW Jayasundara RWP RSP USP , OCC Comd Major General TTR De Silva RWP RSP USP, 232 Brigade Comd Brigadier RMD Rathnayake RWP RSP USP psc, Centre Commandant, Col JS Masakkara RSP, Lt Col LM Mudalige RWP RSP SLLI, Major DLRV Perera RWP RSP SLLI, Major LR Santhanam SLLI attended the dinner organized by RHQ SLLI for Major General SMA Jayawardena. At the end Major General SMA Jayawardena left the RHQ SLLI in high glee and he was respectfully invited to the RHQ SLLI when he visits the island once again.

Maj General S.M.A. Jayawardena ,VSV
(Ret)
*1301 Greenmoss Drive*
*Richmond*
*Virginia 23225 -4112*
*United States of America*
*(804)560-5163*

***February 5, 2004***

*Colonel Janaka Masakkara, RSP,*
*Centre Commandant*
*Regimental Head Quarters*
*Sri Lanka Light Infantry*
*Army Contonment*
*Panagoda,*
*Sri Lanka.*

*My Dear Janaka,*

*Thank you so much for putting together an elaborate and well planned programmme during my visit to the regiment, on January 20,2004.I enjoyed every minute of it with nostalgia. Since I have a passion for my Regiment, I felt great to be back.*

*Improvements in the camp layout was noticeable and the overall picture is impressive. This achievement is commendable considering constraints in resources and the Regiment , being deployed in operational duties.*

*I am glad I had the opportunity to meet a few of the disabled Officers and soldiers. I would prefer to call them handicapped personnel .What impressed me most was their positive attitude and cheerfulness.Their lives are still young and need rehabilitation ,preferably of their choice to get on with their life. A challenging task for the regiment,the army and the nation.*

*I and my Guests enjoyed very much the reception at the Officers Mess and the opportunity afforded to meet both retired and serving officer and their wives.I thank them sincerely for their presence. It was reminiscent of all times. sans the calypso band and the ad hoc food stall,both I would say are excellent innovations.*

*Thank you for the photo album, CD and the plaque. They will remain proud possession of my heirlooms.*

*With best wishes,*
*Sincerely Yours,*
***S.M.A.Jayawardena. VSV***
*Sincerely.*
*Signature.*

# 10 වන බලඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාවේ පාදයක් අහිමි වූ රණවිරුවකුට කෘත්‍රිම පාදයක් පරිත්‍යාග කිරීම.

ශ්‍රී ලංකාද්වීපයේ භෞමික අඛණ්ඩතාවය සුරැකී මෙහිලා බෙදුම්වාදී ත්‍රස්තවාදීන්ට එරෙහිව සටන් වැදී මිය ගිය /අතුරුදන් වූ අබාධිත රණවිරුවන් අමතක වී යන මෙවන් අවධියක



රඹුක්කන මඩවල උඩදෙණිය වත්තේ පදිංචි චන්ද්‍රලතා හේරත් ගුරු මහත්මිය තමාගේ මිය ගිය ස්වාමිපුරුෂයා වන විලියම් රාජපක්ෂ මහතාට පිං පිණිස ආබාධිත රණවිරුවකු හට කෘතිම පාදයක් ප්‍රධානය කිරීමට අවස්ථාවක් සලසා දෙන මෙන් මා වෙතින් ඉල්ලීමක් කරන ලදී

ශ්‍රීලංකා පාබල හමුදාවේ 10 වන බල ඇණිය සමගින් බෙදුම්වාදීන්ට එරෙහිව වවුනියාව දිස්ත්‍රික්කයේ ඕමන්ත ප්‍රදේශයේ 2001.05.29 දින දියත් කරන ලද පසු සෝදිසි කිරීමේ මෙහෙයුමක යෙදී සිටියදී පුද්ගල නාශක බිම් බෝම්බයක් පෑගි සෙ/315584 සාසෙ අනුර කුමාර ඒඑම් ගේ වම් පාදය දන හිසට පහලින් කපා ඉවත් කරන ලදී. එම රණවිරුවා හට චන්ද්‍රලතා හේරත් ගුරු මහත්මියගේ අදහසට අනුව රාගම රණ විරු සෙවණේදී 2004.01.31 දින වැඩි දියුණු කරන ලද කෘතිම පාදයක් පරිත්‍යාග කරන ලදී.

රට ජාතිය වෙනුවෙන් සටන් වැදී මියගිය/අතුරුදන්/ආබාධිත රණවිරුවන් අමතක වී යන මෙවන් යුගයක ගුරු මවුනි ඔබ විසින් කරන්නට යෙදුනා වූ පරිත්‍යාගය ඉතා විශ්ෂ්ඨ වන අතර ශ්‍රීලංකා පාබල හමුද රෙජිමේන්තුව වෙනුවෙන් ස්තුති කරමින්, මෙයින් අත් වූ සියලු කුසල කර්මයන්



මියගිය විලියම් රාජපක්ෂ මහතාට අත් විමෙන් ඒ මහතා සසර කෙලෙවර අමා මහ නිවනින් සැනසේවායි ප්‍රාරථනා කරමි.

ච/සැරයන් විජේරත්න බීජීජී
ප්‍රධාන ලිපිකරු
රණවිරු සුභසාධක අංශය - රෙම
ශ්‍රිලපාභ.

# රස කතා........

## යුධ හමුදව කැඳවන අවස්ථාවක්..........

දේශකයා පසුගිය පාඩම් ගැන ප්‍රශ්න අසමින් සිටියා. යුධ හමුදව කැඳවන අවස්ථාව ගැන දේශකයා අහපු ප්‍රශ්න වලට සෙබලුන් පිලිතුරු දුන්නා. එක් සෙබලෙක් පාඩමට අවධානය යොමු නොකර වෙනත් කල්පනාවක සිටින බව දේශකයා දැක්කා.

**" දැන් කරුණු 4 ක් කිව්වා ..... ඔයා කියන්න බලන්න යුධ හමුදව කැඳවන තවත් අවස්ථාවක්"........**

ඔහු කලබලයෙන් නැගිටලා කල්පනා කරන්න පටන් ගත්තා ලග සිටි සෙබලෙක් රහසින් කිව්වා " **රජයක් කුමන්ත්‍රණයකින්"**

**"අනිත් අය නිශ්ශබ්ද වෙන්න ඔයා කියන්න යුධ හමුදව කැඳවන තවත් අවස්ථාවක්"**

ඔහු කලබලයෙන් කිව්වා " **මහජනතාව විසින් තෝරා පත්කර ගන්නා රජයක් කුමන්ත්‍රණයකින් පෙරලා දැමීම සඳහා යුධ හමුදව කැඳවනවා.**

## පඩුර......

නිලධාරියෙක් හා සෙබළෙක් දෙවිවරුන්ගේ හාස්කම් ගැන බොහෝ දේවල් කතා කරමින් සිටියා.

" පුල්ලෙයාර් දෙවියන්ගෙන් හරියට හාස්කම් තියෙනවා සර්.... මම මීට මාස හයකට විතර කලින් නිවාඩුව ටික දවසක් පරක්කු වෙනකොට පඩුරක් ගැට ගැහුවා...... හරියට හරි ගියා නිවාඩුව ලැබුනා..

නිළධාරියා මදක් කල්පනා කරලා කිව්වා

" මීට මාස 6 කට කලිනුත් ඔය ගොල්ලන්ගේ පැලැටූන් කමාන්ඩර් මමනේ......"

## දූවලට දන නම්.......

මදුවිතකින් සප්පායම් වුන ඔහු කිව්වා " මම කවද හරි බැන්දට පස්සේ හම්බවෙන පලවෙනි දුවට නම දනවා හවනි කියලා...දෙවෙනි දුවට දෙකොනි.....තුන්වෙනි දුවට උපානි......හතරවෙනි දුවට සිපානි...

(හවනි- හමුද චර්යා නියෝග, දෙකොනි- දෙවන කොටසේ නියෝග, උපානි- උපකරන පාලන නිලධාරි, සිපානි- සිවිල් පාලන නිලධාරි.

ලුතිනන් තරිදු වීරසිංහ
ආණ්ඩුකාර කාර්‍යාලය,
උ/නැ පළාත් සභාව,
ත්‍රිකුණාමලය.

# රෙජිමේන්තු මූලස්ථාන බළ ඇණිය නව නිවහනකට පිවිස වගයි.

ශ්‍රී ලංකාද්වීපයේ භෞමික අඛණ්ඩතාවය වෙනුවෙන් අප විරෝධාර රණවිරුවන් දශක දෙකකට ආසන්න කාලයක් උතුරු නැගෙනහිර ත්‍රස්ත වාදින් සමග සටන් කරමින් අප දේශය නිවහල් ස්වෛරී රාජ්‍යක් බවට පත් කිරීමට උරදී කටයුතු කළේය. එම කාර්යෙහි ලා ශ්‍රිලංකා පාබල හමුදව දක්වූ දයකත්වය ප්‍රශංසා කොට යුතුය. වසර 20 ආසන්න කාලයක් පැවති



උතුරු නැගෙනහිර යුද්ධයේදී අප රෙජිමේන්තු රණවිරුවන් 2700 කට ආසන්න ප්‍රමාණයක් ආබාධිත තත්වයට පත්විය. ඔවුන්ගේ පාලනමය කටයුතු, සුභසාධන හා පුණුරුත්තාපන කටයුතු සිදු කිරීම මූලික කොට ගෙන 1993.08.15 දින ආධාරක බළඇණිය ද, 1999.10.08 රෙජිමේන්තු මූලස්ථාන බළ ඇණියද ආරම්භ කරන ලදී.

අප බළ ඇණියේ ආරම්භයේ පටන් මේ දක්වා ආබාධිත රණවිරුවන්ගේ සුභසාධනය හා පුණුරුත්ථාපනය පිණිස කටයුතු රාශියක් ඉටුකර තිබේ. මෙම කාර්‍යයේදී පැන නගින මූල්‍යමය ගැටලු නිරාකරණය කරගැනීම වස් 2003.12.31 දින හෝමාගම විල්ප්‍රඩ් සේනානායක ක්‍රීඩාංගනයේදී ෆයිඩේ නයිට් නමින් සංගීත ප්‍රසංගයක් පවත්වන ලදී එමගින් අප බල ඇණියේ පැවති අඩුපාඩු රාශියක් ඉටු කර ගත හැකි විය.

බළඇණියක් ලෙස ක්‍රීඩා කටයුතු වලදී මේ දක්වා අප ලබා ගත් ජයග්‍රාහණ බොහෝය. යුධ හමුද අන්තර් ඒකක ආබාධිත ක්‍රීඩා වලිය 1999 වර්ෂයේදී අනුසුරතාවය 2000,2001,2003 වර්ෂ වලදී ද ශුරතාවය හිමිකරගෙන ඇති ජාතික ආබාධිත ක්‍රීඩාවලියේදී 1999,2001,2003 යන වර්ෂ වලදී ශූරතාවය හිමි කර ගෙන ඇති අප බළඇණි ක්‍රීඩා කණ්ඩායම පසුගිය වසරේදී පවත්වන ලද අන්තර් ඒකක ක්‍රිඩාවලියේදී ශූරතාවය හිමිකරගන්නා ලදි. එපමණක් නොව අන්තර් ජාතික මට්ටමින් අප ක්‍රිඩකයන් ජයග්‍රහණ රාශියක් ලබා ගැනීම, අප රෙජිමේන්තුවට මුලු යුධ හමුදවට මෙන්ම රටටම ආඩම්බරයකි.

රෙජිමේන්තු මූලස්ථාන බළඇණිය මගින් ආබාධිත රණවිරුවන්ගේ පුනුරුත්තාපන කටයුතු හා සුභ සාධනය උදෙසා පහත සඳහන් ව්‍යාපෘති දනට ක්‍රියාත්මක කරනු ලබයි.

1. බේකරි ව්‍යාපෘතිය.
2. වේවැල් භාණ්ඩ නිෂ්පාදනය.
3. කොණ්ඩා කැපීම
4. සිමෙන්ති ගල් ව්‍යාපෘතිය.
5. මැහුම් හල
6. යෝගට් ව්‍යාපෘතිය
7. මල් වගාව.


බළඇණියක් ලෙස ක්‍රීඩා කටයුතු වලදී මේ දක්වා අප ලබා ගත් ජයග්‍රහන බොහෝය. යුධ හමුද අන්තර් ඒකක ආබාධිත ක්‍රීඩා වලිය 1999 වර්ෂයේදී අනුශුරතාවය ද 2000,2001,2003 වර්ෂ වලදී ශුරතාවයත් හිමිකරගෙන ඇත. ජාතික ආබාධිත ක්‍රිඩාවලියේදී 1999,2001,2003 යන වර්ෂ වලදී ශුරතාවය හිමි කර ගෙන ඇති අප බළඇණි ක්‍රීඩා කණ්ඩායම පසුගිය වසරේදී පවත්වන ලද අන්තර් ඒකක ක්‍රිඩාවලියේදී ශුරතාවය හිමිකරගන්නා ලදි. එපමණක් නොව අන්තර් ජාතික මට්ටමින් අප ක්‍රිඩකයන් ජයග්‍රහණ රාශියක් ලබා ගැනිම අප රෙජිමේන්තුවට, මුලු මහත් යුධ හමුදවට මෙන්ම රටටම ආඩම්බරයකි.


**මෙ ම ප ම ණ ආ ා බ ා ධි ත රණවරුවන් පිරිසකගේ පාලන සුභසාධනමය, පුණුරුත්තාපනමය කටයුතු සිදු කරනු ලැබුයේ රෙජිමේන්තු මධ්‍යස්ථානයට අයත් ගොඩනැගිලි දෙකක වන අතර එහිදී විවිධ අපහසුතාවයන්ට මුහුණ දීමට සිදුවිය. ඒ පිළිබඳ තම අවධානය යොමු කල රෙජිමේන්තු සේනාවිධායක තුමන් ශ්‍රිලවියාගු ඒකකයේ වැඩ කටයුතු සඳහා ලබා දුන් ගොඩනැගිලි නැවත භාරදීම නිසා අප ඒකකය වෙත එම ගොඩනැගිලි සංකීර්ණය ලබාදීමට රෙජිමේන්තු අධිපති තුමා විසින් තීරණය කරන ලදි. රෙජිමේන්තු මධ්‍යස්ථානයට අයත් මෙම ගොඩනැගිල්ල ලබා දීමේදී 11 වන සේනාංකාධිපති තුමන් ලබා දුන් සහය අගය කල යුතු වේ.**



මෙම ගොඩනැගිලි අප ඒකකය වෙත භාරදීමෙන් පසු රෙජිමේන්තු මධ්‍යස්ථානයේ මුදල් සහ අප ආබාධිත රණවිරුවන් විසින් පවත්වන ලද සංගීත සංදර්ශනයෙන් උපයා ගත් මුදල් කොටසක් යොදවා නවීකරණය කරන්නට යෙදුනි. එහිදී එම ගොඩනැගිල්ලේ නවීකරණය කටයුතු ආබාධිත රණවිරුවන් විසින්ම සිදු කරන ලද අතර ,විශාල කැප කිරීමක් වෙහෙසක් සියලු දෙනාම විසින් දරන ලදී. සේනාවිධායක තුමා ,අණදෙන නිළධාරි තුමා,2 වන අණදෙන නිළධාරිතුමාගේ උපදෙස් මත නවීකරනය කටයුතු නිම කර 2004.02.10 වන දින රෙජිමේන්තු අධිපති තුමා විසින් සුභ මොහොතින් කාර්‍යාලය ගොඩනැගිලි සංකීර්ණය විවෘත කරනලදි.එම ගොඩනැගිල්ලේ දනට කාර්‍යාලීය කටයුතු සිදුකරමින් පවතින අතර ,මේ පැමිණි මගදී ආබාධිත රණවිරුවන් විදි දුක් කරදර ඉවසා කටයුතු කිරීම ඉතා අගය කළ යුතුය. මෙතෙක් පැමිණි ගමන් මගෙහි උපදෙස් හා ආධාර දෙමින් දිරිමත් කල රෙජිමේන්තු අධිපති තුමා සහ සේනාවිධායක තුමා පාබල හමුදවේ කාන්තා සංගමයේ සභාපතිතුමිය ඇතුලු සියලුම සාමාජිකාවන්ට සහ අනෙකුත් සියලු දෙනා හට අපගේ ගෞරව පූර්වක ස්තූතිය පුදකර සිටිමු. එසේම අප ආබාධිත රණවිරුවන් හට ඉදිරියේදී නොසැලි එන සියලු බාධක ජයගෙන ක්‍රීඩා සහ අනෙක් කටයුතු වලදී ද පුද්ගලික ජීවිතයේදී ද සාර්ථකත්වය කරා පියමන් කරන්නට ධෛර්ය ශක්තිය ලැබේවායි ප්‍රාර්ථනා කරමු

**බුද්ධි අංශය**
**රෙපීමුබ ශ්‍රිපාහ.**

# FOLK MEDICINES IN NEWFOUNDLAND

**STOPPING BLOOD**

The application of cobwebs, turpentine of fir Nose bleeding could be stoped by certain persons who recitde a secret prayer, or rites to achieve the desired effect.

**CURING WARTS**

Cut notches in a stick and hide the latter. Rub a piece of freshmeat to the wart, then bury the meat and as it decayed the warts, disappeared. Count the warts and make a like number of chalk marks on the back of a stove; as these burnt off the warts too disappeared.

**TOOTHACHE**

Vinegar left in the mouth gave relief. Pebbles from the grave of a pious person provides a faith cure. The magician charmed away the toothache. One way to do this was to write some words on a scrap of paper and have the afflicted one to carry the script on his person, but was forbidden to read it as the pain returned in punishment of such curiosity.

**HICCOUGHS**

Distract the attention of the suferer momentarily.

**PAIN IN THE SIDE**

Put a pebble under the tongue.

**HEADACHE**

Walk backwards, preferably around in circle .

**BOILS**

A Poultice of soap, flour and molasses on brown paper.To extract the core comes of a boil, put hot water in a bottle. Then empty the bottle and place its mouth on the boil as the bottle cooled the core comes out.

**INFECTED SORES**

Many people of Newfoundland recall some old residents of their community who were regrded as remarkable in healing festered sores. It was generally some motherly old lady who did the doctoring. Scorched linen, burnt cream, white of an egg, powdered dust of sea shells, dried and powdered seaweed, goose grease, mouldy bread- these are some of the ingredients of a good poultice.

**HERNIA**

An old custom in order to cure a child of hernia was to split a green witch hazel tree and pass the child through it.

**STOMACHE TROUBLE**

The ground Juniper boiled was supposed to be a panacea for stomach ills. Dugberry extract was also boiled and the extract was used to good effect.

**HAEMORRHOIDS**

Pine tar applied to the affected part produces relief.

**SORE EYES**

May snow was gathered and bottled for a remedy. Many old people tesfify to the efficiency of this strange cure.

**INCRETIONS**

Burn ash of tobacco, powdered resin. Still used and approved by Newfoundland fisherfolk.

**NIGHTMARE**

Locally known as the 'old hag'. Call the person's name backwards.

**INGROWING NAILS**

Drop hot tallow from a lighted candle in to the part affected, and instant relief was afforded.

**RHEUMATISM**

The great brown jellyfish was bottled, and when dissolved into fluid was rubbed to the affected parts and acted as a counter irritant. One objection to this cure was the offensive odour. The magician came to the rescue with an amulet of haddock fin which, worn on the neck, was a charm against rheumatic tendencies.

**COUGH**

The most effective home remedies were extract of wild cherry and spirits of turpentine. Kerosene oil mixed with molasses proved effective. Snake root was also steeped for a cough medicine.

(This is quoted from "HISTORIC NEWFOUNLAND AND LABRADOR", the book which was published by the Department of Development and Tourism in the province of Newfoundland and Labrador. The Newfoundland island and Labrador are belongs to Canada.)


**Lt Tharindu Weerasinghe - 2 SLLI**
**Governors secretariat**
**Northan & Eastern Provinces**
**Trincomalee.**


# ශ්‍රී ලංකා පාබල හමුද අසිරිමත් අලුයම

දීර්ඝ ඉතිහාසයකට හිමිකම් කියන අප රෙජිමේන්තුව ගැන නිතර කථා කලත් ඒ තුලත් සැඟව ඇති වටිනා මුත්, ඒ ගැන වැඩි අවධානයක් යොමු නොකලත් එහි මිහිරියාව විදගැණීමට හැකි වන්නේ සීමිත කොටසකට පමණි. එනම් දවසේ රාජකාරි කාර්‍ය මණ්ඩලයට හා අලුයම ශාරීරික සුවතාවයන්හි නිරතවන අයවලුන් හටය. මක් නිසාද යත් ඔවුන් අළුයම කඳවුරු භූමියේ ගැවසීමයි. එහෙත් එම මිහිරියාව නම් අලුයම 0300 පමණ සිට අළුයම 0630 පමණ වන තෙක් රෙජිමේන්තු මධ්‍යස්ථානය ඉදිරිපිට සෑම වර්ගයක පක්ෂීන් විශාල ප්‍රමාණයක් හඳුනා ගත හැකිය. උදසන 0630 පැයෙන් පසු මෙම පක්ෂීන් නැරඹීම තරමක් අපහසු වන්නේ රාත්‍රී කාලයේ ඔවුන් ලැගුම් ගෙන සිටි ස්ථාන වලින් කෑම සොයා නික්ම යාම නිසායි. අප නිතරම කුඩා දරුවන්ගේ අධ්‍යාපනයට අදලව විවිධ පක්ෂීන්ගේ නාද හඳුනා ගන්නා ආකාරය, මුවින් ශබ්ද නගා පෙන්නුවද මෙය නම් අප මුවින් ශබ්ද නැගිය යුතු නැත. මෙම මිහිරියාව පාසල් අවධියේ පසුවන කුඩා දරුවන්ගේ දෙසවනට මිහිරක් ලබා දීමට ඉතා වටිනා මෙන්ම ඔවුනගේ මානසික සුවතාවයටද ඉතා පිටිවහලක් වනවා ඇත.

තවද මෙම මිහිරියාව අත් විදීමට නම් අප විසින් ගහ කොල සතා සිවුපාවා ආරක්‍ෂා කළ යුතු වනවා නේද ? ස්වභාව සෞන්දර්‍ය විඳ ගැනීම මෙන්ම අප ජීවත් වන මේ ලෝකයේ ඉදිරි පැවැත්ම තකා අප සියල්ලන්ම එක්ව පරිසරය ආරක්‍ෂා කර ගනිමු. පාසල් වලට පමණක් සීමා නොකර අප රෙජිමේන්තුවේ ද පොලිතින් භාවිතය අවම කිරිමට කටයුතු කරමු. එවිට අප ඒ සදහා අමතර කාලයක් වැය කිරිම අවශ්‍ය නැහැ.


**7 ශ්‍රීලපාහ**
**සෙ/13998 කෝප්‍රල් විජේසිංහ ඩබ්පීඩබ්**
**රෙම ශ්‍රීලපාහ 'හකාස' අංශය**
**පනාගොඩ කඳවුර - හෝමාගම**

# සේවයේ යෙදී සිටියදී මියගිය අයට ගෞරව දැක්වීම සඳහායි

# IN HONOUR OF THOSE WHO DIED IN SERVICE

1983 වසරේ සිට මව්බිමේ ඒකියගාවය වෙනුවෙන් දිවි පුදකළ ශ්‍රීලපාහ වීරෝධාර රණවිරුවන් හට ගෞරව දැක්වීමක් වශයෙන් මියගිය අයගේ නාම ලේඛණය 1999 ජනවාරි කලාපයේ සිට කොටස් වශයෙන් පහත සඳහන් පරිදි පළ කරනු ලැබේ.

| SRL No. | REGT. NO. | RANK | NAME | UNIT | LOCATION | DATE |
|---|---|---|---|---|---|---|
| 1935 | S/307634 | L/Cpl | Priyantha GDD | 8SLLI | Oddusudan | 03/01/99 |
| 1936 | S/303229 | L/Cpl | Ajith EAG | 8SLLI | Oddusudan | 13/01/99 |
| 1937 | S/5D01355 | Cpl | Sanath Hemakumara WHM | 5(V)SLLI | Oddusudan | 15/01/99 |
| 1938 | S/15152 | Sgt | Sirisena WA | 10SLLI | Mankulam | 23/01/99 |
| 1939 | S/305863 | Cpl | Kumara GPW | 6SLLI | Mankulam | 23/01/99 |
| 1940 | S/308741 | L/Cpl | Maithripala KV | 6SLLI | Mankulam | 23/01/99 |
| 1941 | S/311821 | L/Cpl | Padmasiri RM | 6SLLI | Mankulam | 23/01/99 |
| 1942 | S/5D00863 | L/Cpl | Kusum Weerasinghe WM | 5(V)SLLI | Mankulam | 23/01/99 |
| 1943 | S/312762 | L/Cpl | Darmasena DM | 7SLLI | Elephant Pass | 25/01/99 |
| 1944 | S/5D00641 | Cpl | Karunathilaka KPSP | 5(V)SLLI | Koopai | 25/01/99 |
| 1945 | S/00474 | L/Cpl | Jagath Jeewananda DM | 9(V)SLLI | Koopai | 09/02/99 |
| 1946 | S/310096 | L/Cpl | Ariyapala AJ | 12SLLI | Mankulam | 15/02/99 |
| 1947 | S/131949 | Rec | Jayasinghe JA | 10SLLI | Oddusudan | 11/03/99 |
| 1948 | S/131973 | Rec | Daya Ruwan B A | 10SLLI | Oddusudan | 11/03/99 |
| 1949 | S/302318 | Cpl | Priyantha JWP | 3SLLI | Palanpiddi | 22/03/99 |
| 1950 | S/285147 | L/Cpl | Dissanayake DMWN | 4SLLI | Mankulam | 30/03/99 |
| 1951 | S/303731 | L/Cpl | Pushpakumara HAS | 3SLLI | Mana | 14/05/99 |
| 1952 | S/305910 | Cpl | Prasanna RB | 3SLLI | Periyamadu | 14/05/99 |
| 1953 | S/311070 | L/Cpl | Sunil Chandrasiri GGA | 3SLLI | Periyamadu | 14/05/99 |
| 1954 | S/311653 | L/Cpl | Sanjeewa WANK | 3SLLI | Periyamadu | 14/05/99 |
| 1955 | S/7112 | L/Cpl | MahindaWeerasiri RM | 3SLLI | Periyamadu | 14/05/99 |
| 1956 | S/7135 | L/Cpl | Werakoon Banda SM | 3SLLI | Periyamadu | 14/05/99 |
| 1957 | S/15059 | Sgt | Premarathne DSM | 3SLLI | Periyamadu | 14/05/99 |
| 1958 | S/2D01256 | L/Cpl | Wijedasa HG | 2(V)SLLI | Batticaloa | 20/06/99 |
| 1959 | S/2D02944 | Cpl | Thilakarathne SP | 2(V)SLLI | Batticaloa | 20/06/99 |
| 1960 | O/62147 | Maj | RK Hatanachchi RSP | 6SLLI | Mannar | 26/06/99 |
| 1961 | O/62878 | Capt | HBJ Harithppriya,RSP | 6SLLI | Mannarama | 26/06/99 |
| 1962 | S/306475 | Cpl | Ranathunga MGN | 4SLLI | Mannar | 26/06/99 |
| 1963 | S/308772 | L/Cpl | Weerasinghe WMSB | 6SLLI | Mannar | 26/06/99 |
| 1964 | S/311772 | L/Cpl | Rajapakshe RMA | 4SLLI | Mannar | 26/06/99 |
| 1965 | S/15934 | Cpl | Darmasiri GW | 4SLLI | Irattaperiyakulam | 27/06/99 |
| 1966 | S/301870 | Sgt | Pushpakumara RPA | 4SLLI | Iratteperiyakulam | 27/06/99 |
| 1967 | S/307867 | Cpl | Dissanayake MWS | 4SLLI | Irattaperiyakulam | 27/06/99 |
| 1968 | S/285181 | L/Cpl | Upul PW | 12SLLI | Kanagarayamkulam | 06/07/99 |
| 1969 | S/306368 | Cpl | Gamini Upul GM | 12SLLI | Mankulam | 06/07/99 |
| 1970 | S/302009 | L/Cpl | Dayawansha SGP | 7SLLI | Parantan | 18/07/99 |
| 1971 | S/126049 | L/Cpl | Kumara MP | 12SLLI | Mana | 23/07/99 |
| 1972 | S/5D01887 | L/Cpl | Ranjan De Silva S | 5(V)SLLI | Kuchchaweli | 03/08/99 |
| 1973 | O/2413 | LtCol | TPKB Karunanayake | 2(V)SLLI | Wakarei | 09/08/99 |
| 1974 | S/308598 | Cpl | Wijesundara WMAT | 7SLLI | Paranthan | 21/08/99 |
| 1975 | O/61962 | Maj | GGBN Gamage | 12SLLI | Mannar | 12/09/99 |
| 1976 | S/14824 | Sgt | Samarakoon DM | 12SLLI | Mannar | 12/09/99 |
| 1977 | S/275512 | L/Cpl | Rajapakshe TACS | 12SLLI | Mannar | 12/09/99 |
| 1978 | S/285337 | L/Cpl | Karunatilaka D | 6SLLI | Periyamadu | 12/09/99 |
| 1979 | S/285447 | L/Cpl | Jayathunga HG | 12SLLI | Mannar | 12/09/99 |
| 1980 | S/285454 | L/Cpl | Tikiribandara HM | 12SLLI | Mannar | 12/09/99 |
| 1981 | S/302456 | C/Sgt | Wijapala WMH | 1SLLI | Mannar | 12/09/99 |

| SRL NO. | REGT NO. | RANK | NAME | UNIT | LOCATION | DATE |
|---|---|---|---|---|---|---|
| 1982 | S/302554 | L/Cpl | Samantha Kumara EWG | 1SLLI | Mannar | 12/09/99 |
| 1983 | S/307193 | Cpl | Piyatissa PV | 12SLLI | Mannar | 12/09/99 |
| 1984 | S/308167 | L/Cpl | Ratnayake RMAK | 1SLLI | Mannar | 12/09/99 |
| 1985 | S/310687 | L/Cpl | Weerasekara WMN | 6SLLI | Mannar | 12/09/99 |
| 1986 | S/311633 | L/Cpl | Pradeep KAG | 3SLLI | Mannar | 12/09/99 |
| 1987 | S/311696 | L/Cpl | Wijekumara BAS | 6SLLI | Mannar | 12/09/99 |
| 1988 | S/313962(226888) | L/Cpl | Rajakaruna RKN | 1SLLI | Mannar | 12/09/99 |
| 1989 | S/285219 | Pte | Wijerathna JMD | 12SLLI | Mannar | 12/09/99 |
| 1990 | S/285223 | Rec | Wijesinghe Banda DMS | 12SLLI | Mannar | 12/09/99 |
| 1991 | S/308281 | Pte | Nandasena J | 12SLLI | Mannar | 12/09/99 |
| 1992 | S/310629 | Pte | Dissanayaka DMA | 12SLLI | Mannar | 12/09/99 |
| 1993 | S/313659 | Pte | Kumarasiri HC | 12SLLI | Mannar | 12/09/99 |
| 1994 | S/305432 | L/Cpl | Sugathapala UGT | 1SLLI | Batticaloa | 24/09/99 |
| 1995 | S/285174 | L/Cpl | Chandra Kumara VG | 12SLLI | Mannar | 25/09/99 |
| 1996 | S/304635 | Cpl | Premathilake PGGR | 8SLLI | Batticaloa | 27/09/99 |
| 1997 | S/89781 | L/Cpl | Ajith Kumara SG | 11SLLI | Jaffna | 07/10/99 |
| 1998 | S/13120 | L/Cpl | Fernando PNS | * | * | 08/10/99 |
| 1999 | S/304241 | Sgt | Wijesuriya HM | 4SLLI | Nedunkerni | 14/10/99 |
| 2000 | S/311113 | L/Cpl | Rupathunga RMN | 4SLLI | Nedunkerni | 14/10/99 |
| 2001 | S/311680 | L/Cpl | Chaminda Kumara HMS | 4SLLI | Nedunkerni | 14/10/99 |
| 2002 | S/312465 | L/Cpl | Sisira Kumara LW | 4SLLI | Nedunkerni | 14/10/99 |
| 2003 | S/285516 | L/Cpl | Kumara WMSN | 8SLLI | Ampakamam | 15/10/99 |
| 2004 | S/305650 | Sgt | Jayantha Kumara GA | 4SLLI | Ampakamam | 15/10/99 |
| 2005 | O/63689 | Lt | AAW Alahakoon | 8SLLI | Ampakamam | 22/10/99 |
| 2006 | S/131111 | L/Cpl | Abeyrathne BHP | 8SLLI | Mankulam | 23/10/99 |
| 2007 | S/132040 | L/Cpl | Prabash KNGG | 8SLLI | Oddusudan | 28/10/99 |
| 2008 | S/301536 | Sgt | Jayanandana HHU | 8SLLI | Nedunkerni | 28/10/99 |
| 2009 | S/304583 | Sgt | Gunarathne GK | 8SLLI | Nedunkerni | 28/10/99 |
| 2010 | O/63554 | Lt | TGL Ranjith SLLI | 8SLLI | Vavuniya | 28/10/99 |
| 2011 | S/307993 | Pte | Jayatilake JN | 10SLLI | Oddusudan | 29/10/99 |
| 2012 | S/5D01842 | L/Cpl | Atapattu SWP | 5(V)SLLI | Nilaweli | 29/10/99 |
| 2013 | S/304126 | Cpl | Welideniya WNW | 8SLLI | Olumadu | 30/10/99 |
| 2014 | S/308915 | L/Cpl | Sarath Kumara RM | 1SLLI | Olumadu | 30/10/99 |
| 2015 | S/310106 | L/Cpl | Anura A | 1SLLI | Periyamadu | 30/10/99 |
| 2016 | S/310795 | L/Cpl | Karunarathne TDR | 3SLLI | Palampiddi | 30/10/99 |
| 2017 | S/310813 | L/Cpl | Upul Kumara AHC | 3SLLI | Palampiddi | 30/10/99 |
| 2018 | S/311023 | L/Cpl | Jayasanka KG | 1SLLI | Olumadu | 30/10/99 |
| 2019 | S/312103 | L/Cpl | Thushara Priyantha HP | 3SLLI | Periyamadu | 30/10/99 |
| 2020 | S/315157 | L/Cpl | Amila Prapath | 1SLLI | Mana | 30/10/99 |
| 2021 | S/15843 | Sgt | Karuna Sunadara DM | 3SLLI | Olumadu | 31/10/99 |
| 2022 | S/285499 | L/Cpl | Jayawardana HMC | 3SLLI | Olumadu | 31/10/99 |
| 2023 | S/303294 | Sgt | Chandrarathne RM | 3SLLI | Olumadu | 31/10/99 |
| 2024 | S/304208 | Cpl | Bandara PMP | 3SLLI | Olumadu | 31/10/99 |
| 2025 | S/308439 | L/Cpl | Karunarathne HM | 3SLLI | Olumadu | 31/10/99 |
| 2026 | S/310125 | L/Cpl | Perera RPR | 3SLLI | Olumadu | 31/10/99 |
| 2027 | S/309278 | L/Cpl | Silva WSL | 4SLLI | Olumadu | 02/11/99 |
| 2028 | S/131957 | L/Cpl | Sumanarathne J | 10SLLI | Oddusudan | 03/11/99 |
| 2029 | S/132010 | L/Cpl | Padmakumara DP | 8SLLI | Oddusudan | 03/11/99 |
| 2030 | S/300743 | Sgt | Dissanayake DMS | 3SLLI | Olumadu | 04/11/99 |
| 2031 | S/302740 | Sgt | Sanjeewa RL | 12SLLI | Olumadu | 04/11/99 |
| 2032 | S/303260 | Cpl | Pradeep Kumara DMT | 3SLLI | Olumadu | 04/11/99 |
| 2033 | S/303395 | Sgt | Piriyantha Kumara W W | 4SLLI | Oddusudan | 04/11/99 |
| 2034 | S/306328 | Cpl | Dissanayake PHA | 3SLLI | Olumadu | 04/11/99 |
| 2035 | S/310183 | L/Cpl | Jayalath NA | 6SLLI | Oddusudan | 04/11/99 |

# ජීවිතයට එක් විවාහයක්..............

දෙදෙනෙකු එක් වන්නේ එක්ව ජීවිතයක් ගෙන යාමට තරම් ඔවුන් දෙදෙනා අතර බැඳීමක් ඇති වූ පසුවය. එහෙත් කොතරම් ගැලපීම් තිබුනද එක්ව ජීවිතයක් ගෙන යන විට එකිනෙකාගේ ක්‍රියාකාරකම් වල නොගැලපීම් තේරුම් යාමට පටන් ගනී.එවිට බොහෝ විට සිදු වන්නේ කුඩා බහින් බස් වීමක් හෝ දුර දිග ගිය රන්ඩුවකි. මෙම කුඩා බහින් බස් වීම සැමියාගේ හෝ, බිරිඳගේ ජීවිත, ජීවිත කාලයටම අදුරේ දමන්නක් විය හැකියි. **"ගෑනිගෙයි මිනිහගෙයි රණ්ඩු බත් හැලිය ඉදෙනකම් විතරයි"** යනුවෙන් අපේ පැරැන්නෝ කියා තිබෙනවා අප අසා තිබේ.එහෙත් රණ්ඩුව ඉවර වීමට බත් හැලිය ඉදෙන වේලාවට වඩා වේලාවක් ගතහොත් එය දෙදෙනෙකුගේ විවාහ ජීවිතයට තදින්ම බලපෑ හැකියි.

මෙසේ විවිධ හේතු නිසා රණ්ඩු සරුවල් ඇති වීම සාමාන්‍ය ලක්ෂණයකි. රණ්ඩු සරුවල් ඇති වුවත් දෙදෙනෙකුට සතුටින් පවුල් ජීවිතය ගෙන යාමේ හැකියාව ඕනෑ තරම් තිබේ. සතුටින් පවුල් ජීවිතය ගෙන යාමට කැමති අය දැන ගත යුතු කරුණු දෙකක් තිබේ. එනම් පවුල හා විවාහය යන්න සමාජ සංස්ථාවක් යන්නයි. එහි වාසි මෙන්ම අවාසි ද තිබේ. දෙවැන්න විවාහ වූ දෙදෙනෙක් එකිනෙකා විසින් පිළිගත යුතුය.

සතුටින් පවුල් ජීවිතය ගෙන යාමට කැමති අය දැන ගත යුතු කරුණු දෙකක් තිබේ.

එකිනෙකාට අවංක විය යුතුය. එමෙන්ම විශ්වාස වන්ත විය යුතුය. පවුල් ජීවිතයේ ප්‍රශ්න ඇති වීමට හේතු රාශියක් ඇත. එනම් මුල් කාලයේ තිබූ නිර්භීත බව හිතෛෂීවන්තබව දක්ෂකම, ශක්තිවන්ත කම පසුව හීන වි යාමයි. පසු කාලින ණය වීම් නොසැලකිලිමත් ඉවුම් පිහුම්, අනික් අයගේ පවුල් ජීවිතය සමග තමන්ගේ පවුල් ජීවිතය සන්සන්දනය කිරීම වැඩිවේ.

යුග දිවියක් ගත කරන විට ධෛර්ය හීන වී ඇති බව දෙදෙනාට දැනෙනවා නම් ඔවුනට ඕනෑ තරම් ධෛර්වන්ත වීමට හැකියාව තිබේ. ඒ




තුලින් ඕනෑ දෙයක් දරා සිටීමෙ හැකියාව තිබේ. විවාහ ජීවිතයේදී දරා සිටීමේ හැකියාව ඉතාමත් අත්‍යවශ්‍යයි.

සමහර අවස්ථාවලදී ආත්මාර්ථකාමී අදහස් එකිනෙකාට පහල වේ. එවිට එසේ ආත්මාර්ථකාමී අදහසක් පහල වූයේ ඇයි දැයි සොයා බලා එම සිතුවිල්ල පහල කර ගත යුතුද නැද්ද යන්න පිළිබඳව කල්පනාකාරී විය යුතුයි. එවිට ආත්මාර්ථකාමී වීම නිසා ඇති වන රණ්ඩු සරුවල් අවම කර ගත හැකිය.

මිනිසුන්ට ඊර්ෂ්‍යා සහගත කරුණාබර වැනි විවිධාකාර සිත් පහල වන්නට හැකියාව තිබේ. මෙවන් තත්ව වලදී එකිනෙකා අතර විවිධ ගැටළු පැන නැගීමට ඇති හැකියාවත් වැඩියි. එවන් අවස්ථාවක කතා බහ කර දෙදෙනාගේම අදහස් එක් කොට ක්‍රියාත්මක කිරීම වඩා වටී.

බොහෝ විට විවාහයක ප්‍රශ්න ඇති වන්නේ දැඩි ආදරය නිසා කීවොත් යැයි නිවැරදියි. විවාහ ජීවිතයේදී ආදරය නිසා එකිනෙකා ඕනෑවට වඩා සීමාව ඉක්මවා කටයුතු කරන්නට යාම අවශ්‍ය වන්නේ නැහැ. විවාහ ජීවිතයේදී "ඕනෑම දෙයක් ඕනෑවට වඩා ඕනෑ නැහැ" යන මතයේ එල්බගෙන කරන කටයුතු සාර්ථකයි. එයින් අදහස් කරන්නේ ආදරය ඕනෑවට වඩා ඕනෑ නැහැ යන්න නොවේ. ආදරය පෙන්වීමට ඕනෑවට වඩා එකිනෙකාට එපා වෙන අයුරින් කටයුතු නොකළ යුතුයි.

අප්‍රසන්න වචන භාවිතයෙන් ඈත් වීමට කටයුතු කළ යුතුයි. අප්‍රසන්න වචන පිට වෙන්නේ තරහ ගිය විටය. එනිසා තරහ ගිය අවස්ථාවල නිශ්ශබ්ධව තරහ නිවාගෙන කටයුතු කිරීමයි වැදගත් වන්නේ තරහ ගොස් එක් අයෙක් අදහස් දක්වන කොට අනෙකා එයට එකට එක කීවොත් රණ්ඩුව කෙළෙවර වන්නේ ඇණ කොටා ගැනීමකින් විය හැකියි. එවන් අශෝභන දේ සිදු නොවන්නට කටයුතු කිරීමට හොඳම ක්‍රමය වන්නේ නිශ්ශබ්දව සිට තරහ නිවුන පසු කරුණු කාරණා තේරුම් බේරුම් කර ගැනීමයි. ප්‍රශ්නයක් ඇති විට එය විසඳිය යුත්තේ ප්‍රශ්න වලට මැදි වී නොවේ. එය එකිනෙකාගේ ආදරයෙන් සිටින විට කතා බහ කොට විසඳ ගත හැකිය.

කෙසේ වෙතත් ජීවිතයට එක් විවාහයක් ඇති කර ගැනීම ප්‍රමාණවත්.එනිසා එය රැක ගත යුතුයි. එකිනෙකා තම තමන්ට ගැලපෙන ලෙස තම සිතුවිලි අදහස්, ප්‍රතිපත්ති යම් යම් වෙනස් කම් වලට භාජනය කල යුතුයි. මෙසේ කිරීමෙන් විවාහ ජීවිතය අපහසුවකින් තොරව ගලා යාමට සැලැස්විය හැකිය. එවිට විවාහ ජීවිතය සතුටින් ගත කළ හැකිය......

(පුවත් පතක් ඇසුරැනි)

නි/63714
ලුතිනන් ඩබ්.එස්. වීරසිංහ ශ්‍රිලපාභ
ආ:සේ:මු (නැගෙනහිර)
යුධහමුද කඳවුර,
මහසෙන් පුර ,
මින්නේරිය.

ආදරය සොඳුරුයි ජීවිතය ගැඹුරුයි

## දසුනේ හසුන්



වෙරළළඟ නුඹ වුවන හස හරිම සොඳුරුයි
දුර ඈත දිවි සයුර නම් බොහොම ගැඹුරුයි

දසුන : FEMINA සහරාව අනුග්‍රහයෙනි.
හසුන : ලුතිතන් තරිදූ වීරසිංහ - 2 ශ්‍රීලපාහ

---

## සෙබලියකගේ දරු සෙනෙහස

| | | | |
|---|---|---|---|
| සටන් බිමේ යුධ වදිද්දි නුඹ සිහිවී නෙත | තෙමුනා | කිරි සුවදට නුඹ හැඩුවත් කිරි දෙන්නට කෙනෙකුන් | නෑ |
| දරු සෙනෙහස හද පතුලේ සිරවී සුසුමන් | නැගුනා | මගේ ළයේ කිරි එරුනත් නුඹට දෙන්න විදියක් | නෑ |
| කිරි දරුවන් අඩන හඩින් මටත් හොරා සිත | ඇදුනා | මව් තුරුලේ සුව නින්දේ සතපන්නට පින් කර | නෑ |
| නුඹ හින්ද මගේ පුතේ ළය මඩලේ කිරි | එරුනා | සටන් බිමෙන් නුඹ සොයාන එන දින වැඩි ඈතක | නෑ |
| වෙහෙර මහා දේවිය මෙන් මගේ හිතේ තියන | එඩිය | එක පැටවකු ඉපදුනාම ඈත් රෑනක | වනන්තරේ |
| සයුරේ මහ රළට වඩා මගේ ගතේ තියන | සවිය | ඇතිනියත් සැමදෙනාට කිරි එරේලු | නිරන්තරේ |
| මතු දවසක මගේ අතින් නුඹට පුදම් මගේ | අවිය | ඒත් ඉතින් එහෙම පිනක් කොයින්ද මේ | මිනිස්පුරේ |
| අත් පා දිගහැර නිදන්න ගොළු මුහුදත් දැන් | නිසලය | පුතේ නුඹව සිහිවෙනවා යුධ වදිද්දි | උතුරුකරේ |

උතුර කරේ සටන් බිමේ සිටින සෙබළ තරුණියක මවක වූ කලෙක ඇය නැවත උතුරටම යා යුතු වේද ? එවැනි මොහොතක ඔවුන්ගේ මානසිකත්වය තේරුම් ගැනීම අප සැම සතු වගකීමකි. එහෙත් දින ගනනකින් නැවත ඇයට යුධ බිමට යෑමට සිදුවුවහොත් දෙතනේ කිරි බිළිදුට දිය හැකි වේද ? මව් සෙනෙහසින් රුහිරු කිරට හැරෙන බව සැබැවකි. එහෙත් මව් සෙනෙහස පිළිබදව බිදකුදු උණු නොවන හදවතක්ද අප අතර ඇත. මේ නිර්මාණය සෙබළ මව්වරුන් වෙනුවෙන්ම ලියවුණකි.

නිර්මාණය:- ලුතිතන් ඒඩී ගුණරත්න ආර්එස්පී ශ්‍රීලපාහ
මූලස්ථානය - 9 ශ්‍රීලපාහ පොට්පදි - නගර්කෝවිල්

# ශ්‍රීලංකා පාබල හමුද සංගමයේ 53 වන වාර්ෂික මහා සභාව.

ශ්‍රී ලංකා පාබල හමුද සංගමයේ 53 වන වාර්ෂික මහා සභා රැස්වීම මේජර් ජෙනරාල් ඒඑම්යූ සෙනෙවිරත්න ආර්එස්පී යූඑස්පී එන්ඩීසී ගේ ප්‍රධානත්වයෙන් වර්ෂ 2004 ක් වූ ජනවාරි මස 25 වන ඉරු දින 0900 පැයට ශ්‍රීලපාහ රෙජිමේන්තු මධ්‍යස්ථානයේ අංක 01 දේශණ ශාලාවේදී පවත්වන්නට යෙදුනි. මෙම රැස්වීම සඳහා යුධ හමුද මාණ්ඩලික ප්‍රධාන මේජර් ජෙනරාල් එච්එස්එස් කොට්ටේගොඩ ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සීඑන්ඩීඑී සහ ශ්‍රීලපාහ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් එන් මල්වආරච්චි ආර්ඩබ්පී යූඑස්පී පීඑස්සීඑන්ඩීසී ප්‍රමුඛ සේවයේ නියුතු විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ නිළධාරීන් /නිළධාරීන් සහ සෙසු නිළයින් සහභාගි වන ලදී.

මෙම රැස්වීම පැවැත්වෙන අතරතුර 2003 වසරේ ශ්‍රී ලංකා පාබල හමුද සංගමයේ සාමාජිකත්වය ලබා ගත් දනට සේවයේ නියුතු නිළධාරීන් /සෙසු නිළයින්ගේ සාමාජික මුදල් වශයෙන් රු 14600.00 ක වටිනාකමකින් යුතු ජේෂණ පත රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් එන් මල්වආරච්චි ආර්ඩබ්පී යූඑස්පී පීඑස්සීඑන්ඩීසී විසින් සංගමයේ සභාපති මේජර් ජෙනරාල් ඒඑම්යූ සෙනෙවිරත්න ආර්එස්පී යූඑස්පී එන්ඩීසී හට භාර දෙන ලදී

මෙම වාර්ෂික මහා සභාව අවසානයේ ජ්‍යෙෂ්ඨ නිළධාරීන් ප්‍රමුඛ රැස්ව සිටි නිළධාරී සෙසු නිළයින් වෙනුවෙන් දර්ශනීය සරඹ සංදර්ශනයක් සංවිධානය කර තිබූ අතර, මෙම සරඹ සංදර්ශනය මධ්‍යස්ථාන සේනා විධායක කර්නල් ජේඑස් මාසක්කාර ආර්එස්පී ගේ උපදෙස් මත එවකට රෙජි ශ්‍රීලපහ රෙසැමේ බනි 1 ජේ එම් ජයසිංහ බණ්ඩාගේ මග පෙන්වීම යටතේ රෙජිමේන්තු සරඹ උපදේශක බනි11 දිසානායක ජීඑම්යූ ගේ සහ බනි11 වේලාරත්න බී, බනි11 අබේසිංහ එස්ඩී ගේ උපදේශකත්වයෙන් ඔවුන්ගේ ඇපකැපවීම මත ශ්‍රීලපහ ඒකකයන්ට අයත් සෙසු නිළයින්ගේ නොපසුබට උත්සහයෙන් යුතුව කෙටි කාල සීමාවක් තුල පුහුණුවීම් සිදු කර එදින ඉදිරිපත් කරන ලද අතර , අවි ප්‍රදර්ශනය සඳහා පැරණිතම මෙන්ම නවීණතම අවි ආයුධද ඇතුලත් වන ලදී. ඊට අමතරව ශ්‍රී ලංකා ඉන්ජිනේරු රෙජිමේන්තුව වෙතින් ඉදිරිපත් කරන ලද විවිධ වර්ගයේ බෝම්බ සහ බෝම්බ නිශ්ක්‍රිය කටයුතු සඳහා උපයෝගි කර ගන්නා උපකරණද ප්‍රදර්ශනය කර තිබූ අතර , ශ්‍රී ලංකා සංඥා බලකාය වෙතින් විවිධ වර්ගයේ පණිවුඩ හුවමාරු යන්ත්‍රද ප්‍රදර්ශනයට එක් කරන ලදී.

ඉන් අනතුරුව සෙසු නිළ භෝජනාගාරයේ සියළුම නිළයින් වෙනුවෙන් සංවිධානය කර තිබූ බීම සාදය සහ දිවා භෝජන සංග්‍රහය අවසානයේ එදින 1400 පැයට පමණ සභාතමෝ සතුටින් විසිර ගියහ.

*(එදින ලබා ගත් ඡායාරූප 31 වන පිටුවේ පල කර ඇත.)*

**වයිට් හැකල් ප්‍රකාශණ අංශය**
**රෙපීම- ශ්‍රීලපාහ.**

# ශ්‍රීලපාහ රෙජ්මේන්තු මධ්‍යස්ථානයේ රෙසැමේ තනතුර භාරදීම්/භාරගැනිම්

ශ්‍රී ලංකා පාබල හමුද රෙජිමේන්තු මධ්‍යස්ථානයේ 08 වන රෙජිමේන්තු සැරයන් මේජර් වශයෙන් 2003 මාර්තු මස 05 වන දිං සිට රාජකාරි කල සෙ/11617 බනි1 ජේඑම් ජයසිංහ බණ්ඩා වසර 22 ක යුධහමුද සේවා කාලය නිම කර තුදුරේදී විශ්‍රාම යාමට නියමිතව ඇති බැවින් රෙම ශ්‍රීලපාහ රෙසැමේ තනතුර සහ රාජකාරීය 2004 පෙබරවාරි මස 27 වන දින සෙ/11766 බනි1 එම්පී වර්ෂකෝන් හට භාර දෙන ලදී.

බලලත් නිළධාරී1 ජේඑම් ජයසිංහ බණ්ඩා රෙජිමේන්තු මධ්‍යස්ථාන ශ්‍රීලපාහ හි රෙසැමේ වශයෙන් වසරකට ආසන්න කාලයක් රාජකාරියේ යෙදී සිටි අතර, මෙම කාල සීමාව තුල රෙජිමේන්තුවේ උන්නතිය මෙන්ම සෙසු නිළයින්ගේ විනය සහ පැවැත්ම උසස් මට්ටමක තබා ගැනීම පිණිස මහත් ඇප කැපවීමෙන් යුතුව තම උසස් නිළධාරීන්ගේ නියෝග වලට අනුව අපක්ෂපාතිව සිය රාජකාරී මැනවින් ඉටු කල බව සඳහන් කල යුතුව ඇත.

2004.02.27 වන දින ශ්‍රීලපාහ රෙජිමේන්තු මධ්‍යස්ථානයේ නව වන රෙසැමේ වශයෙන් වැඩ භාරගත් සෙ/ 11766 බනි1 එම්පී වර්ෂකෝන් 1983.01.17 වන දින ආධුනික සෙබෙලකු වශයෙන් ශ්‍රලංකා යුධ හමුදවට බැදී සිය මූලික පුහුණු කටයුතු නිමාවෙන් අනතුරුව 1 වන බල ඇණිය ශ්‍රීලංකා පාබල හමුදව වෙත ඇතුලත් කරන ලදුව එහි බී කණ්ඩායමත් සමගත්, පසුව සී කණ්ඩායමත් සමගත් ක්ෂේත්‍ර රාජකාරියේ නිරතවීමෙන් පසුව එම ඒකකයේ පාලන කණ්ඩායම වෙත ඇතුලත් කර රෙආස කාර්යාලයේ ලිපිකරුවකු වශයෙනුත් පසු කාලයේ ජන අවන්හල් රාජකාරින්හිත් නිරත වන ලදී.

පසුව 4 වන බලඇණිය ශ්‍රීලපහ වෙත ඇතුළත් කොට එහි රෙආස සහ ඒගනි කාර්යාල වල සිය රාජකාරියේ නිරත වෙමින් සිටියදී 7ශ්‍රීලපාහ ඒකකයේ රෙඋපාසැමේ වශයෙන් පත් කරන ලදී.එම ඒකකයේ රෙඋපාසැමේ වශයෙන් කටුයතු කරමින් සිටියදී සිය ජ්‍යෙෂ්ඨතාවය මත ශ්‍රීලපාහ 12 වන බළඇණියේ රෙසැමේ වශයෙන් පත් කරන ලදී.

ඉන් අනතුරුව ශ්‍රී ලංකා යුධ හමුද සෙවිච්ඡා බල සේනා මූලස්ථානයේ ආධුනිකයන් බඳවා ගැනීමේ ශාඛාවේ (නිළධාරි/සෙසුනිළ) ප්‍රධාන ලිපිකරු වශයෙන් වසර 02 කට අධික කාලයක් රාජකාරින් ඉටු කිරීමෙන් අනතුරුව වසරකට අධික කාලයක් 9 ශ්‍රීලපාහ ඒකකයේ රෙසැමේ (උපදේශක) වශයෙන් රාජකාරීන් ඉටු කර ඇත. පසුව යුධ හමුද පුහුණු පාසල- මාදුරු ඔය හී පුහුණු අංශයේ රෙසැමේ වශයෙන් පත් කර රාජකාරියේ යෙදී සිටියදී ශ්‍රීලපාහ ජ්‍යෙෂ්ඨතාවය මත ශ්‍රීලපාහ රෙජිමේන්තු මධ්‍යස්ථානයේ රෙසැමේ වශයෙන් පත් කිරීමෙන් අනතුරුව 2004.02.27 වන දින සිය තනතුරේ වැඩ භාර ගන්නා ලදී.

**බනි 11 ගොඩකන්ද කේඑස්**
**වයිට් හැකල් ප්‍රකාශන අංශය.**

# පාබල හමුදා සංගමයේ 53 වන මහා සභා රැස්වීම මතක සටහන්



පාබල සංගමයේ ජ්‍යෙෂ්ඨ සාමාජිකයන් ප්‍රමුඛ සාමාජිකයින් දේශණ ශාලාව වෙත කැඳවාගෙන ඒම.



ආබාධිත රණවිරුවෙකු විසින් මල්දමක් පලඳු පාබල හමුදු සංගමයේ සභාපතිතුමන් පිලිගනිමින්.



යුධ හමුදු මාණ්ඩලික ප්‍රධානී මේජර් ජනරාල් එස්.එච්.එස් කොට්ටේගොඩ ඩබ්ඩබ්ව් ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී සම්ප්‍රදායානුකූලව පොල්තෙල් පහන දැල්වීම.



රෙපී අධිපති මේජර් ජෙනරාල් එන්.මලලවආරච්චි ආර්ඩබ්ජී යූඑස්ජී එන්ඩීසී පීඑස්සී විසින් සම්ප්‍රධායානුකූලව පොල්තෙල් පහන දැල්වීම.



රැස්වීම ආරම්භ කිරීමට ප්‍රථම විනාඩි 2ක නිශ්ශබ්දතාවයක්



රැස්වීමට සහභාගි වු ජ්‍යෙෂ්ඨ නිළධාරීන් ප්‍රමුඛ නිළධාරි/ සෙනිින්ගේ කොටසක්.



පාබල සංගමයේ සභාපති මේජර් ජනරාල් ඒ.එම්.යූ සෙනෙවිරත්න ආර්එස්පී යූඑස්පී එන්ඩීසී සභාව අමතමින්.



රෙපී අධිපති විසින් 2003 වසරේ පාබල සංගමයේ සාමාජිකත්වය ලද අයවලුන්ගේ සාමාජික මුදල් භාරදීම.



පාබල සංගමිය වෙනුවෙන් සංවිධානය කළ සරඹ සන්දර්ශනය නරඹන ජ්‍යෙෂ්ඨ නිළධාරීන් ප්‍රමුඛ සංගමයේ සාමාජික පිරිස.




සරඹ සන්දර්ශනයේ අවස්ථාවක්.



අවි ප්‍රදර්ශනය නරඹන අවස්ථාවක්..



දිවා ආහාරය භුක්ති විඳිමින්




සැකසුම :-
වයිට් හැකල් ප්‍රකාශන අංශය
රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රීලපාහ

**හිතවත් පාඨකය !**

ඔබගේ සංකල්පනා අතරට නිරතුරුවම ගලා එන කවි සිතුවිලි හා සංකල්පනා සඳහා මෙම පිටු කිහිපය වෙන්ව ඇත.

ඔබගේ උසස් නිර්මාණයන් " තල් අරඹේ සිට" පිටුවේ පල කිරීමට පහත සඳහන් ලිපිනයට තැපැල් කරන්න.

**සංස්කාරක " තල් අරඹේ සිට" , වයිට් හැකල් සඟරාව**
**රෙමශ්‍රීලපාහ යුධ හමුද ජනපදය, පනාගොඩ, හෝමාගම.**

## පූජානි............



නොපැතූ විරාමයක
නිවසට මිණි පහනක් ලෙසින්
ආලෝකය විහිදුවා
දෙවියන් අපට තිළිණ කල
දයාදය ඔබයි සුදු දුවනී......

සිප් සතර නිසි කලට
අකුරු කර නිවැරදිව
පිය නගන්න යහ මගට
මගේ පුංචි සුදු දුවනී......

යහපත් සිතුවිලි තුලින්
සැමට සෙත සලසමින්
ලොව දනන් සුවපත් කරන
වෙන්න වෙද ඇදුරියක්
මගේ දුව පූජානි...........

සමරසේකර කේ.එස්.ජී
බලලත් නිළධාරි 11.

## සුදු දුවණීට සුභ උපන් දිනයක්......

නෙලුම් මානෙල් පීපි විල මැද
දස අතම සුවඳින් විදාලයි.
උදෑසන හිරුගේ සිනාවෙන්
නැවුම් දිනයක් වෙත ලගා වෙයි..........




අපේ හද තුල පිපී සැම දින
සුවඳ දෙන කුසුමක් විලාසෙයි
මගේ දියණිය "**ත්‍රිශාලා**" නුඹ
අපේ නිවසේ පහණ සේ මැයි..

ගේ පුරා දුව ගොසින් සැම තැන
වැටී රිදිලා නුඹ හඬාලයි
සැනින් ඒ සැම අමතකව ගොස්
දසන් පෙන්වා දූ සිනාවෙයි......

පාලුවට තිබූ අපේ හදවත්
වලට සතුටක් නුඹ ගෙනාවයි
මිලානව ගොස් තිබූ ගහ කොළ
පවා දැන් හරි අලංකාරයි.........

තබන හැම පියවරක් පාසා
වාසනාවේ මල් පිපීලා
"**ත්‍රිශාලා**" මගේ දියණියට දෙවි
රැකවරණය නිරතුරු ලැබේවා........

සෙ/311621 සාසෙ ගනේගොඩ එච්.ඒ
වයිට් හැකල් අංශය.



# මව්බිම ජයගෙන එන්න මතු දිනේ

මැදියම් මහ රැ
සීත සුළං මැද
හුදකලාව වෙළුන සිතින්
ගිනි අවිය තුරුළු කරන්
දුර ඈතක ඔබ ඉන්නේ

සණ අඳුර පැතිරෙනා
නිසංසල යාමයේ
පන්හිඳ තුඩගින්
අකුරු කරන්නට
මා වෙත බැඳි පෙම නමින්
අව්ධි කරන් හද
හෙලනා සුසුමන්
ඈත සිටන් විත්
මා හද දෙවොලේ ලැගුම් ගනී

පාළුව තනිකම ඔබ මා වෙලුවද
අද රෑයේ නොව
හෙට ගැන සිතලා
ඉවසමු කුමරුනි
හද සනසාලා
මව්බිම ජයගෙන
එන්න මා වෙතේ
ඉන්නම් මා නෙතු දල්වා පෙර මඟ

**සෙ/303011 කෝප්‍රල් මංගල අමරකෝන්ගේ**
**බිරිඳ**
**වජිරා ගීතානි**

# ඒඩ්ස්

..... කාසි කොල මලු සොයා නගරයට — මම එමි
ඇසිල්ලක ඇරයුමින් ඉල්ලන්න — සපයමි
ජීවිතය ලද පවින් ජීවිතය — ගෙනයමි
බෙහෙත් නැති රෝගක් ලාභයට — මම දෙමි .....

**නි/3414 මේජර් ඊඑම්එච්බී අල්විර ශ්‍රීලපාහ**
**නිලධාරි අණදෙන**
**5 ශ්‍රීලපාහ බී කණ්ඩායම**
**වැලිඹිය සම්පත්නුවර**

# අහිමි වූ සෙනෙහස

දහසක් පැතුම් හද පතුලේ — තබාගෙන
තල්වැට මායිමේ ගිනි අවි — දරාගෙන
දෙනෙතින් වැටෙන කඳුලැලි — පිසදමාගෙන
ලිව්වේ මෙහෙම තැන සෙනෙහස — සොයාගෙන

අසරණ වෙලා සිටියත් අද කෙල්ලෙ — මම
නොකරමි වෛර සුදු කෙල්ලේ නුඹට — මම
නුඹ වෙන්වුනා මිස නැත වෙන්වුනේ — මම
අමතක වෙන්නෑ මැරුනත් නංගියේ — නම

මතකද සැදෑවක නුඹ හා — පියමැන්නා
සෙබලෙකු නිසා එවූ ලිපියෙන් නුඹ — බැන්නා
පුරහඳ වගේ ඉමු අයියේ කී — නැනා
කියූ නුඹ මගේ පෙම දසමසකින් — මැන්නා

රංකද මගේ පොඩි අයියා — කිවාට
ලියන ලිපිය රත්තරනින් — ලීවාට
නැහැ ලංවුනේ වෙන කෙල්ලෙකුගේ — සිතට
'නෙළුම්' නිසා මම සෙබලෙක් — වූවාට

**සෙ/313937 ලාකෝ ආරියරත්න ආර්පී**
**1 ශ්‍රීලපාහ "ඩී" කණ්ඩායම**

# සාමය සහ සොල්දාදුවා


දසක දෙකක යුද්ධය දැන් නිමා — වෙලා
මේ වසරේදි සාමයෙ මල් දලු — දමලා
ස්ථිර අදිටනින් ආවා මෝදු — වෙලා
නැවතත් නොයන්නට යුධයට සමු — දීලා

දසක දෙකක් කොටියෝ යුද්ධය — කරලා
දහස් ගණන් ජීවිත උන් පුද — කරලා
දැන් කොටි රෑළමක් ඕනේ නැහැ — කියලා
පාරම් බාන්නේ මොනවා ගැන — හිතලා

එද සමගි වෙලා — සැම
විසඳුනි නම් වේය — සාම
දෙපසට ඇද්දම — මේම
දෙතැහැකි වෙද සාමේ — කෝම

අවි ආයුධ හදන — අයට
යුද්ධෙ නැතොත් වදියි — බඩට
එ නිසා යුද ගිණි ඇති — කොට
අවි බිස්නස් කරයි — ජයට

**සෙ/13363 ලාකෝ බන්දුලවංශ එම්**
**3ශ්‍රීලපාහ - සී කණ්ඩායම**




## උදා වේවා සාමය

රුදුරු ගිනි අවියට
සුන්දර සමනල් දිවිය කැපකොට
දිවා රෑ නොතකා හරි හැටි
නින්දක් නොලැබ
නිමක් නොපෙනෙනා
තල් වැට අද්දර බංකරයක සිට
සතුරා ඩැහැගන්නට
මාන බලමින් සිටින ඔබ ...................
යෞවනයේ සුන්දර කාලය
ගෙවා දමයි උතුරේ
රුදුරු ගිනි අවි හඬ සමග ...........
එහෙත් දයාබර සොයුරනේ
එළඹේවි ඔබ අප සැමට
සාමයේ අරුනළු නුදුරු දිනකදීම ........
එදවසට අප සැම
සාමයේ අරුනළු සමගින්
එක්වෙමු නිදහස් නිවහල්
ලොවකදී ...................

සෙ/306406 සාසෙ ෆෙන්ංදෙණිය එච්ංකේඑ
7 ශ්‍රීලපාහ ගේ
නැගණිය සන්ධ්‍යා සුභාෂිණී

## සෙබල පුතුනට මවගෙන් ආසිරි

හෙල දිවයිනත් ආගම නිති සුරකින් ට
උතුරේ සිටින සැම සතුරන් නසන්න ට
දිව රෑ දෙකෙහි වෙහෙසී නිදි මරන්න ට
මගේ පුතු දෙපල ගියෙ දිනයක යුධ බිම ට

ඉපදුන රටට පුතුනේ සේවය දෙන් න
සතුරන් පරදවා යුධ බිම ජයගන් න
එඩිතර බවත් ශක්තිය සුරතට රැගෙ න
කිසිවිට එපා පුතුනේ පස්සට යන් න

මගේ පුතු දෙදෙන රට රැකුමට එක්වේ වා
යුධ බිම සිටින විට මව් ගුණ සිහි වේ වා
ඉපදුන දැයට ආදරයක් ඇති වේ වා
බුදු සමිඳුන් ගෙ පිහිටෙන් ජය ජය වේ වා

රණ බිමේ සිටින සැමගේ සිත් දිනාගෙ න
නොබියව සටන් කෙරුමට පෙරමුන ගන් න
ඉඩලද විටදි ආගම සිහි කරලන් න
මගේ පුතු ඇතුලු විරුවන් සැම රැක දෙන් න

රෑ කලුවරේ වන වදුලේ සැතපෙන් නේ
අව් වැසි පවා නොතකා සටන යන් නේ.
සතුරන් නිතර ලුහුබැද පසු පස එන් නේ
තෙරුවන් සරන ලැබ නිදුකින් සැරදෙන් නේ

දහසක් පැතුම් පොදි බැද ගෙන ඔබ දෙදෙ න
මේ ගිය ගමන ජය පිට ජය අත්වෙන් න
සතුරන් පරදවා රට බේරා ගන් න
එඩිතර පුතුන් වී ලක් බිම මියයන් න

සෙබල පතිරනගේ මව
සුමනා කහවත්ත

## සොඳුරු හෙටක්

සිතිජ ඉමේ සැඟවී යන
රන්වන් හිරු මඬලක් සේ
සැභව යන්න ඉඩ හරින්න
සාමයෙ රන් වන කිරණට
එපා කිසිදු ඉඩ හරින්න
හෙට උපදින අරුණ උදයේ
සාමයේ සොදුරු අරණක
එකම ධජය යට
විදින්නට සැප සුවහසේ
සිත් විලේ පිපුණු
සාමයේ සුවද සියපතේ
සුවද රැගෙන හමාපන්
මද සුව සවන්

එරන්දි චතුරිකා ජනානි විතානගේ
පිටබැද්දර
කොටගල

## ඔබ ද මා ද විය

නුඹ, රෝස කැකුලක් වූ විට
මා නුඹට රැකවරණය ලබාදන
විෂ කටුවක් වෙමි
නුඹ, පුන්සදක්ව ගගනත දිලෙද්දී
නුඹට තනිරකින කොඳ මලක්ව පිපෙමි
නුඹ,
ගංගාවක් සේ ගලා බසිද්දී
ඔබව දේතින්ම වැළඳගන්නා
මහ සයුර වෙමි
නුඹ
සුන්දර වත මඬලක් වෙද්දී
මා, නුඹ නළල් තලයේ
තිලකයක් වෙමි

සෙ/00677
ලා/කො සමන් ප්‍රේමසිරි ආර්පී
රෙපීමුඛ ශ්‍රීලපාහ - පනාගොඩ

## "සංකල්පනා"

පුත නුඹ හෙට දින
ලොකු මිනිසෙකි ලොව
එනමුත් මගේ පුත
තව බොහෝ දේ ඇත
ඉගෙනීමට ලොව නුඹ

පතනෙමි නුඹ හට
බුදු හිමිගේ පිහිට
නුඹගේ පියා
උතුරුකරේ සිට............................

සෙ/14ඩි00599 සාසෙ විමලසිරි ඩබ්එ
14(සෙව්) ශ්‍රීලපාහ "බී" කණ්ඩායම
යුද හමුද කදවුර
කෙට්පේලි - මිරුසුවිල්
යාපනය

## සාමය ඔබයි

යුධ ගිනි නිවී සාමයෙ අරුණළු ජේන
හේතුව ඔබ සැමයි එය හැම දැනගත් න
විරුවනි ඔබල හට තුති දෙන්නට ඕන
දැය රැකගන්න ඉදිරියටත් ඔබ ඕන

ලස්සන යොවුන් විය බංකරයේම සිට
ඔබ කැප කලා සිංහල රට ජාතියට
අන් සැම දෙනා ඒ බව ගත්තොත් සිතට
විරුවන් සැනසෙනවා ඇත යුද බිමේ සිට

දිවි කැප කෙරුවෙ ඔබ අපගේ රට දැයට
ඔබ ණය නොමැත මේ සිංහල මව් බිමට
නිකමුන් අතර නිකමෙක් නොවනා ඔබට
උපහාරයක් වේවා ඔබේ විරු කමට

අතපය අහිමි හෙළ විරුවකු දුටු විටක
අප සැලකිය යුතුයි ඔහු හට ගුණ ගරුක
ඉටු කර වගකීම රට නිති ගත්ත රැක
දුක්වෙනු එපා ඔබ හෙළ විරුවනි කිසි දක

විරුවනි ඔබලා ඉදිරියට රට රැකගන්න
සාමය රැදි හෙට දිනයක් එළඹෙන්න
හැකිවෙනු ඇති එදිනට සතුටින් ඉන්න
දෙවියනි අපේ රණවිරුවන් රැක ගන්න

සාමය රැඳුන හෙට දිනයක් එළඹේවා
මියගිය සියලු දෙන නිවනින් සැනසේවා
රණවිරු සියලු දෙන සතුටින් වැජඹේවා
සාමය ලැබී රටටම සෙත සැලසේවා

**රෝ මාවඩවිලගේ**
**ජයසිකුරු මෙහෙයුමේ දී දිවිදුනි**
**සැරයන් තිලකරත්න එම් (ශ්‍රීලපාහ)**
**ගේ බිරිඳ**

## යා යුතු මග දුරයි

ජීවිතේ නම් දුරයි
නුඹේ පුංචි දෙපා පොඩි
රිදුම් දෙන දිනක් එයි
ඒ උනත් නොනවති
යන්න .........ඔබ
නුඹට මෙතුවක් එන්න
නැවුම් මං පෙත් තැනූ
කඳුලු දහඩිය හෙලු මිනිසුන්ව.........
පුංචි හසරැල් බිඳක් පමණ හෝ
මේ මිටියාවතේ ඉතිරි කර
නොනවති යන්න ඔබ.....
විඩාබර මනසට
සැනසුමක් විඳින්නට
අගුල් වූ මුව පුරා
සිනා මල් වහින්නට
රතු වූ නෙත් කෙවනි අග
තුටු කඳුලු පිරෙන්නට
රිදුම් දෙන හදවතේ
පැතුම් මල් පිපෙන්නට
පතම් පිවිතුරු හදින්
සද ජය ලබන්නට

**චින්තා විදුමනි**
**බටාදුර දෙනියාය**

## සාමයේ පරවියාණනි ...

"මහා සාගරයෙන් වට වූ
දර්ශණීය වූ ලංකාද්වීපයේ
අසුන්දර වූ සිත් ඇත්තන්
ඉපදුනේ කෙලෙස ද
අපේ මේ සොදුරු රට
බිලිගත් මෙම කුරිරු යුද්ධය
නිමා වන්නේ කෙදිනක ද?
සාමයේ පරවියාණනි
ඉන්දියන් සාගරයෙන් වට වූ
මේ සොදුරු ලක් මැණියන්
වෙත පියා සලන්න
සාමයේ මල් පුබුදන්න"

**ඩීපී නිශාන්ති යාපා**

## යුධ බිමේ පියෙකුගෙන් ආදරණීය දුවනියට

ගිනි අවිය අත දරා
තල් අරණ දෙස බලා
මහවැස්සේ තෙමී තෙමී
සිටින විට මා දියණියේ


සිහි වන්නේ නුඹවමයි
සැම තත්පරයකම
එහෙත් නැහැ දුකක් මගේ සිතට
කැප කරමි සදකල් දිවය මගෙ
නුඹ නමට .....

**සෙ/306163 සාසෙ ප්‍රියංකර යූඑච්ලුවන්**
**"බී" කණ්ඩායම - 3 ශ්‍රීලපාහ**

## THE NAVIGATOR

The Noise was heard
Far away leaving the yard
All under his Command
The vessel was sailing
It had sailed miles that day
Had given as the right way
The people dusk calls to stay
Even at midnight He won't stay
The moon was so bright
Sapphires were his right
By the blessing! of all Mighty
Has led him at right
Swashing lapping of water
As given by the Creator
The one who gives life to it
Can be called the Navigator

**O/64787**
**LT BLIS Balasooriya SLLI**
**D Coy - 6 SLLI**
**Nagarlovil**
**Jaffna**



## විරුවකු සේ

යොවුන් බව පුද දෙමින්
මව්පදවිය ලබා
රෑ දහස් නිදි වරා
හැදූ ඒ පුතු
විරුවෙකු සේ මළහොත්
මව් කඳුළු නොසැලුවොත් නමස්කාරය ලබයි
ඒ පුතු
තම ජනිත කල පියාගෙන් ............

නි/6021
2/ලුතිතන් කේ අසිත ප්‍රභාත් එදිරිසිංහ ශ්‍රීලපාහ
"ඒ" කණ්ඩායම
14 (සේවී)ශ්‍රීලපාහ
කෙට්පෙලි මීරුසුවිල් යාපනය

## සෙනෙහසින් අමතමි

බිරිඳ නුඹයි සවිය මගේ
සඳදර කුමරියේ
තාරුණ්‍ය ලස්සනයි කොතරම්ද කීවොත්
උදේට පිපුනු සූරියකාන්ත මලක් මෙන්
එද අප හමුඋනා නොසිතුව විලසින්
පෙම්වතුන් උනා ප්‍රාර්ථනා කල විලසින්
සත්තකින්ම ඒ ආදරයයි
ගැහැනියකුට ලොව ලැබිය හැකි
ඉහලම පදවිය මව් පදවියයි
දැන් ඔබ මවකි
අප දැන් දෙමාපියන්ය
ලස්සන වේවි තවත් අපේ පුංචි කැදැල්ල
ඒත් යුද්ධය කුරිරුයි එද වගේම
රකින්න ඔබ මගේ චූටි පුතු
මලක් මෙන් මැණික නුඹ
ආදරයේ නාමයෙන්
ආරක්‍ෂා කරන්න ඔබ මා වෙනුවෙන්
මෙලොවට ජනිත කල
ඔබගේත් මගෙත් චූටි පුතු
ආදරයයි සැමද කුමරියේ ඔබ හට
සිටියත් ගෙදර දින දහයක් සතුට විද
යලි එන විටදි දුක ඇවිලුනා පපුව මැද
තනිකම හුරු වුවත් සැමියෙක් ලෙසට අද
සැනසීමකට මගක් කවද සොයනවද

සෙ/14ඩී 00096
කෝප්‍රල් චමින්ද කුලසිරි ජේජී
516 බංසමු යුහකඳවුර මයිලඩි පලාලි

## දූවට පුතුට රටක් තියමු

මොංගොලොයිඩ නීගරොයිඩ කොකේසොයිඩ යන
තුන් වරිගෙක මිනිසුන් මේ ලොව ජීවත් වන
කෙස් වල නාසයේ දෙතොලෙ සොබාවයන් ගෙන
බෙදනු ලැබ තිබේ මානව විදූ නැණ ඇති දෙන

මෙහේ වසන සිහල දමිල මුසල්මාන් දන
කොකේසොයිඩ වේ එක වරිගයට අයිති වන
තුන් වර්ගෙක කියමින් ඇයි නොදැන කතා වෙන
කණ්ඩායම් තුනකුයි මානව අප තුන් දෙන

ඉංගිරිසියෙන් හියුමන් රේස් නමින් කියන
ජන වර්ගය වේ සිංහල බාසාවන් දෙඩන
ඒත්නිසිටි නැමති වචනය ඇසෙනා විට සවන
එහි තේරුම මානව කණ්ඩායම වෙයි කලණ

ආගමේ හා සිරතෙ විරිතෙ යම් වෙනසක් ඇතේ
බාසාවද මුළුමනින්ම සමාන වී නැතේ
එහෙම වුනත් අප තුන් දෙන තබා ගන්න සිතේ
වෙනසක් මානව විදූ සාධක වල නම් නැතේ

සිහල දමිල මුස්ලිම් සුවිසුද්ද රුහිරු නැත
පොරණෙ සිටම ලොව හැම දන මුහුන් වෙලා ඇත
අප මේ ගැන මතු යහපත ගැන යොමලා නෙත
හැමගේ හැකි විගසින් පිරිසිදු විය යුතු සිත

ලොව ගැන දැන ගැනුම තකා ඉංගිරිසි යොදමු
සිහල දෙමල හැමට නියම කර සැලසුම හදමු
හඳුනා අප අප සාහික ගසට පොහොර යොදමු
පුබුදු වන්න සාමයෙ මල් සමගි දමෙන් බැදෙමු

මිනිසුන් ලෙස හිතන පරිදි සිතිවිලි ඇති කරමු
පැමිණිය මග ඇත වැරදුනු තැන් නිවැරදි කරමු
යුද ගිනි මේ නිවාලන්න හැකි හැම වෙර දරමු
අප තිදෙනගේ දූවට පුතුට රටක් තියා මැරෙමු


ලුතිතන් තරුඳු වීරසිංහ - 2 ශ්‍රීලපාහ
ආඥාධිකාර කාර්යාලය
උ/නැ පළාත් සභාව - ත්‍රිකුණාමලය.

## බුදුගුණ වන්දනා

පන්සල බුදු මැදුර දගැබ බෝමළුව
සඳහම් සිසිල ඇත තවමත් ගොස් විහිද
ගිලගෙන සිය ධජය අරගෙන රන් කඩුව
මව්බිම රැක ගන්න යුධ අවි අත දැරුව

බුද්ධ ධම්ම සඟ රුවනින් සිත පැහැදි
සිටින පෙර දිනේ බුදු සමිදුන් නැමදි
මව්බිම නමින් සටනට ගොස් දිවි පුදදි
සම්දුනි සෙබලුන්ට දෙව් ලොව දෙමු ඉඩදී

සෙ/313497 සාසෙ වනිගසූරිය සිකේ
බී කණ්ඩායම 7 ශ්‍රීලපාහ




## ඇයි ගියෙ පියා මා හට නොකියා පාර

පොඩි කල පටන් මගෙ දුක සැප බැලුව පියා
ලොකු වන විටදි මට ඔවදන් දුන්න පියා
මම සහ මගේ සොහොයුරියද මෙලොව තියා
ආදර පියා අප අතරින් වෙන්ව ගියා

සිදුවිය බලන්නට මට දැන් ගෙදර සුව
පියකුගෙ අගය මට දැනුනේ ඉන් පසුව
සිහිනෙන් පෙනෙනවා සැමද ඔබගෙ රුව
පතනෙමි ඔබට අජරාමර නිවන් සුව

අම්මා සමග අක්කා මට දී භාර
ඇයි ගියෙ පියා අප හට නොකියා පාර
දැන සිටියනම් මරුවට නොදෙනෙමි භාර
වේවා ඔබට මේ කවි පද උප භාර

සෙ/316690 සාසෙ ජයලත් ඩබ්ඩ්ඩබ්
පාලන කණ්ඩායම 10 ශ්‍රීලපාහ
යුධ හමුද කදවුර ඕමන්තේ

## තුඹ නැති දුක දරාගන්න

උදයේ සුපිපුනු මලක් වගේ
හසරැලි අරගෙන
වඩින්න හෙට උදෑසනම
මගේ නෙත් දෙරකඩට
මේ රෑ මට ඉන්නට බෑ
ඔබ රුව නොදැක
මේ සීතල දරන්න බෑ
ඔබ ලග නැතිව
දෙඩමලු වන දෑස් වලින්
මට ප්‍රේමය කියා දුන්නු
මගේ රන් කද දෙනෙත් විද
ඒ සෙනෙහස කියා යන්න
එතකොට මට හැකිවෙයි
තුඹ නැති දුක දරාගන්න

සෙ/02375 ඩයස් පීපීඑස්ඩබ්
5 ශ්‍රීලපාහ සී කණ්ඩායම වැලිඔය
ආදර බිරිඳ ෂාමා තිලකරත්න
ගම්පල

## "ප්‍රියයාණනේ ඔබ සුරකිම් බැතින්"

මාගේ ජීවන ගමනේ
අනෙක් විධ බාධා කම්කටොලු
හමුවේ මං වටා ඉදිවු
විසල් පවුර ඔබයි .....

පතිතියක හද මන්දිරේ
පැතුම් ඉටු කල
දෙවියන් ඔබය ......

මට ලැබුණු අමිල වස්තුව නම්
ඒ ඔබයි ..... ඔබේ ආදරයයි ...
සසර සරණ තුරාවට
ඔබය මාගේ දෙවිදුන් ....

දයාබර බිරිඳ කල්පනා සංජීවනි පෙරේරා
සෙ/305310 කෝප්‍රල් වීරසිංහ එස්එස්
1 ශ්‍රීලපාහ බී කණ්ඩායම
211 බාසේමු
මැද මූලය - වව්නියාව

## අම්මේ එපා මා වෙනුවෙන් දුක්වෙන්න

හමුදවට බැදී මව්බිම ගැන සිතලා
මව්බිම බෙදූ තල් අතු වැට ලගට වෙලා
ඉදිරිය බලා සිටියෙමු අවියක් අතලා
තනිකම මකා ගන්නම් කවියක් ලියලා

අම්මේ එපා මා වෙනුවෙන් දුක් වෙන්න
යුද්දෙට යනව ඔබෙ පොඩි පුතු දිරි දෙන්න
ගිනි අවි රැගෙන සතුරා වන සා ලන්න
මම මිය ගියත් අද දින ඔබ සැනසෙන්න

හෙල විරුවන් සැමදෙන අපි සිහිකරමු
යුද්ධය නවතලා අපි හෙට ගැන සිතමු
ගිනි අවි පසෙක ලා සාමෙය සුභ පතමු
ගිනි අවි පසෙක ලා දෙවිදුට මල් පුදමු

සෙ/315426 සාසෙ වීරසිංහ ඩබ්ඩ්එන්ඒ
ඒ කණ්ඩායම 10 ශ්‍රීලපාහ

## එද මෙන් අදත් ... හෙටත් ...

රණ බිම දස්කම් පෑ විරුවනී
ගුවනෙහි දස්කම් පෑ විරුවනී
සයුරෙහි විස්කම් පෑ විරුවනී
සිවිල් පාලනය කල විරුවනී
සතුරු උවදුරින් .....
සිරි ලක මුද ගන්නට
එකමුතු වූ ත්‍රිවිධ හා පොලිස් දැත් ...
සවියෙන් සවිය වූවා සැමද නිබඳින් ...
සිහල වීරත්වයෙන් ...
අපමන වූ වෙහෙස් දරා දහස් දුර පා යුගගෙවා
කටුක වනයේ ... මංමාවත් ... ගිරිදුර්ග තුලින්
රුදුරු සයුරේ නොපෙනෙන අහස් ගව් දුර..
විවිධ වූ මෙහෙයුම් හරහා.
වෙහෙසුනු තුඹලා
අගයමු සෙනෙහසින් සද
එදවස දැය තමින්
මිල කල නොහැකි දිවි මල් පුද කල
ත්‍රිවිධ හමුද පොලිස් විරුවණි
තුඹලා කල මෙහෙවර සද අමරණීයයි
තුඹලාගේ ගත වත සුවද
නොමයාවි සිත් තුලින් නොමැකීම
එසවිය තව තවෙත්
යදම් සේ සවිමත්ව
සදකල් හෙල බිමෙහි
ජය කෙහෙලි නංවන්න

සෙ/11896 බනි 11 සුජීව බීවී රෙළපාසැමේ
ඒකාබද්ධ මෙහෙයුම මූලස්ථානය




## යුද්ධය හා සාමය

රුදුරු වූ යුද්ධයෙන්
ගිණි  අරන් ලක් දෙරණ
සෙබළ ජීවිත මියැදුණි
අකාරුණික වූ යුද්ධයෙන් .....

ජීවිතයක අගය නොදන්නා
ගිනියම් වූ උණ්ඩයක්
සෙබලු අහිංසක යැයි සිතා
සිසිල් වේද ?.....

සාමයේ මං පෙත් විවර කරන්නට
ජීවිත අත් පා දන්දුන් විරුවන්
කොතෙක්ද මේ දෙරණ තුල
එහෙත් .....

යුද්ධයේ විරාමය ලද මෙවන් සමයක
අහිංසක සෙබලුන් කල මෙහෙය
මතකයෙන් අමතකව ගොස්ද ?
යුද්ධයට යන විට දේවත්වයෙන්
වර්ණනා කල සෙබලුන්
සාමය ලැබුනු විගස
අමතක වුනිදේ ........ සිහලුනේ .....

සෙ4314071 ලා/කෝ බංඩාර බීඑම්එස්
රෙජිමුබ ශ්‍රීලපාහ
පනාගොඩ - හෝමාගම

## සිතුවිලි කල්පනා

අහිංසක ඔය දෙනෙත්
නෙත් කෙවෙනි බොද කරයි
සත්තමයි මගේ දිවියේ
හිමි කාරිය ඔබ තමයි
ඔබ නැතිව මගේ සිත
හැමදම දුක් බරයි
ඔබ දන්නේ නැතිමුත්
ඔබට මා ආදරෙයි

සෙ/316028 සාසෙ ප්‍රශාත් එස්ඒඑම්
බී කණ්ඩායම 1 ශ්‍රීලපාහ
තල්ලඩි - මන්නාරම

## සෙබල සිතුවිල්ලක්

වැස්සට තෙමෙනවා අව්වට          කරවෙනවා
මේකයි ජීවිතේ මෙලොවට          උපදිනවා
මරණය කියන එක කාටත් හිමි          වෙනවා
සේවය සදහ මම යුධ සෙබලෙක්          වෙනවා

යුධ පෙරමුනේ ඇයි දේවල්          පෙනෙන්නේ
සිතා බලන විට කාටත්          තේරෙන්නේ
හැඩය සෙවනැල්ල සිතිජය          සමගින්නේ
මතුපිට පරතරය චලනය          දිස්වෙන්නේ

යුද්ධය කියන වචනය මට          ඇසෙනවිට
දෝංකාර දෙනවා මගෙ          හදවතට
සාමය පැතුවෙ  ඒකයි අපි සැම          ලොවට
ජාති බේදයෙන් තොර ලොව හදමු          හෙට

සෙ/315001 සාසෙ සෙනවිරත්න එම්එම්
ඒ කණ්ඩායම 4 ශ්‍රීලපාහ
යාපනය

## සාමය නසන්නන් නැසීම පවක්ද ?

උත්තරීතර මිනිසත් බව දුර ඇතක
ඉකි ගසයි සැඟවිලා
මිනිස් හදවත් බල තන්හාවෙන්
වියරුව ලේ වගුරයි පිල් බෙදි
ජාතිය ආගම භාෂාව මුල් කරගෙන
මෙසේ සහෝදරත්වය වනසනු කිම
ජාතියත් ආගමත් හෝ භාෂාවක්
නොමැත ලියවී මිනිසෙකු තුල
සැම සිරුරකම දුවන ලේ එකම පැහැතිය
අප සැවොම අයත් එකම ජාතිය
මනුෂ්‍ය ජාතියමය
සම්බුදු හිමිද ජේසු ස්වාමීන්ද
සැම ආගමික නායකයෙකුම පවා
ආදරය කරුණාව දයාව අනුකම්පාව
අපට ඉගැන්නුවා මතකද?

එසේ නම් සොයුර සොයුරිය මෙලෙස මිණී මරා ගැණිමෙන් අපි ජාතියකට ආගමකට නැති නිකමුන් වෙමුද ? නැත. සමගියේ යදමින් වෙලී උතුරත් දකුණත් යා කරමු. එම සත් ක්‍රියාවට එරෙහි වන්නන් නසා දැමීම පවක් නොව රටක අනාගතය වෙනුවෙන් එවන් නරුමයන් වැනසිය යුතුමය.

සෙ/15965 කෝප්‍රල් මැදවත්ත එම්එම්පීකේ ගේ නැගණිය
සඳමාලි මැදවත්ත



## වී 56 මගේ බිරිද

රුසියන් රටේ දිනකදි ඔබ හමුවූවා
නිකාඉල් ටිමොපියෝ කැසින්කොව්
ආදරයෙන් හැදූවා
කොරියන් යුධ කාලෙදි අප වෙත ආවා
චීන රටෙදි මතකද මල් වරවූවා

ඔබ ලස්සනයි දැක්කට දැන් හිතට වදේ
ලොව අන්යුවතියන් මැද්දේ ඔබ එඩිතරය
රට රටවල් සොයන්නේ ඔබේ නිවහනය
පෙරටත් වැඩිය ඔබ දන් ලස්සනය

ඔබේ අත ගන්න මම හමුදවට ආවා
මතකද දියතලා කදවුරෙ අපි පෙම් කෙරුවා
පාසින් අවුට් එකේදි ඔබ මගේ තුරුලට ආවා
තුරුලේ සගවා උතුරට ආවා

සෙ/306635 ලා/කෝ අත්තනායක එච්එම්එම්බී
ආධාරක කණ්ඩායම 4 ශ්‍රීලපාහ
යාපනය

# The melancholy night

The moon and stars shine in the sky
You come to my mind, so I have to sigh
In this night too, I'm in a sad plight
Tomoarrow will also be a melancholic night


The cool breeze tries to give rest to my mind
But so many questions run through the mind
My dear please nurse my wounded heart
Do come to me and make my next day pleasant

Lt Tharindu Weerashnghe - 2 SLLI
21 Division
Gajasinhapura - Cheddikulam

## සොදුරු ලොවකට ........

ගුවනේ පාවී ආවේ ඔබේ හඩ
මගේ සවනට එක් කරන් ..............
සිතා ගන්නත් බැහැනේ අද මට
ඇයිද හදවත් ලං කරන්............
විඩා බර වී ලතැවුලෙන් පිරි
සිතට සැනසුම ඇති කරන්............
සොදුරු ලොවකට පාර තැනුවද
යන්න අද අත් වැල් බැදන්.........
සුරන්ජිත්.

වයිට් හැකල් ප්‍රහේලිකාව - අංක 21



හරහට
1. පේරාදෙනිය මල් වත්ත විවෘත කල වර්ෂය.
3. ලංකාවට මුලින්ම ගුවන් යානයක් ගොඩ බැස්සු වර්ෂය
6. පෘතුගීසින් ලංකාව ආක්‍රමණය කල වර්ෂය.
7. ඩී.එස් සේනානායක මහතා ව්‍යවස්ථාදායක මන්ත්‍රණ සභාවට මිගමුවෙන් පත්වූ වර්ෂය.
8. පන්සිය පනස් ජාතක කතා පොතේ ජාතක ගණන.
11. ස්වදේශීය වෛද්‍ය විද්‍යාලයේ ආරම්භය.
12. රවීන්ද්‍රනාත් තාගෝර් තුමාගේ උපත 1841 විපත .......
14. ලෝකයේ රූපවාහිනී නිල වශයෙන් ආරම්භ වූ වර්ෂය .
16. ඉන්දිරා ගාන්ධී නායිකාව මිය ගිය වර්ෂය.
18. අවුකන බුදු පිළිම වහන්සේගේ උස අඩි....

පහලට
1. වික්ටෝරියා රැජින මිය ගිය වර්ෂය.
2. රුසියාව ලොව මුල් වරට න්‍යෂ්ටික බලාගාරය පිහිටවන ලද වර්ෂය.
3. ලංකාවේ මුල්ම තැපැල් මුද්දරය නිකුත් කල වර්ෂය.
4. ලෝක බැංකුව පිහිට වූ වර්ෂය.
5. අශෝක - කාලිංග යුද්ධ සිදුවුයේ ක්‍රි.පූ:
6. පැරණිම ජාතික කොඩිය හිමි රට වන්නේ ඩෙන්මාර්කයයි. එය නිෂ්පාදිත වර්ෂය.
9. පන්ඩු නම් ද්‍රවිඩයා ලංකාව ආක්‍රමණය කර රාජ්‍ය පැහැරගත් වර්ෂය.
10. ලංකාවේ රූපවාහිනිය නිල වශයෙන් ආරම්භ වූ වර්ෂය.
11. ශ්‍රී ලංකාවට නිදහස ලද වර්ෂය.
12. නැපෝලියන් බොනපාට්ගේ උපත 1769 සිදු වූ අතර විපත සිදු වුයේ ..........
13. න්‍යෂ්ටික ආයුධ සැදීමේ පදනම දමා දුන් වර්ෂය.
14. ලංකාවේ ජාතික උද්‍යාන ගණන.
15. මේ දක්වා නිකුත් කර ඇති වයිට් හැකල් සඟරා ප්‍රමාණය.
16. කෝලී රජවරුන්ගෙන් රට මුදවාගෙන ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කලේ ක්‍රි.පූ:

ප්‍රහේලිකා අංක 21 හි නිවැරදි විසඳුම් 2004 ජුලි මස 15 දිනට පෙර එවිය යුතුයි.
තරග කූපනය සහ තරග කොන්දේසි පසු පිටෙහි ඇතුලත් කර ඇත.

තරග කූපනය සහ තරග කොන්දේසි පසු පිටෙහි ඇතුලත් කර ඇත.

# ප්‍රහේලිකා අංක 18 නිවැරදි විසඳුම් හා ජයග්‍රහණය කළ අයවලුන්

වයිට් හැකල් ප්‍රහේලිකාව- අංක 18

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 චි | 2 ය | වු | 3 ල | ■ | 4 නි | ■ | ■ | ■ | 5 ප |
| ■ | ම | ■ | ද | ■ | ය | ■ | 6 ය | ප | ස් |
| 7 ති | ■ | 8 අ | ප | ම | න | ■ | වු | ■ | ව |
| ස් | ■ | ■ | ස් | ■ | ■ | ■ | ල | ■ | රු |
| 9 ස | රි | ග | ම | ප | 10 ධ | 11 නි | ■ | 12 ත | ව |
| ක | ■ | ■ | ල් | ■ | 13 ම | ල | ■ | ගු | ■ |
| ■ | 14 ක | 15 දු | ■ | ■ | න | ■ | 16 ව | ල | ලු |
| 17 මා | න | ව | යා | ■ | ය | ■ | ශු | ■ | ■ |
| ර | ■ | න | ■ | ■ | ■ | ■ | 18 රි | ය | 19 න |
| 20 ක | න | වා | ■ | 21 කි | රි | ල | ය | ■ | ය |

### 1 වන ස්ථානය

සෙ/305828 සැරයන් රංජිත් ජයන්ත ආර්පී
රෙජිමුබ ශ්‍රීලපාහ
යුද හමුද කඳවුර
පනාගොඩ.

### 2 වන ස්ථානය

සෙ/307327 කෝප්‍රල් ප්‍රේමනාථ
ඩබ්පීඩීජීසී
මූලස්ථානය- 10 ශ්‍රීලපාහ
යුද හමුදා කඳවුර
ඕමන්තේ.

### 3 වන ස්ථානය

එස්.එම් සෝමලතා මහත්මිය
බිසෝවෙල
ගලිගමුව නගරය.

---

## වයිට් හැකල් ප්‍රහේලිකාව
## අංක 21

තරග කොන්දේසි:

1. ප්‍රහේලිකාව පිටුපස ඇති අයදුම්පත සම්පූර්ණ කර පහත ලිපිනයට **තැපැල් කළ** යුතුයි.
2. මෙම තරගයට වයිට් හැකල් සගරාවේ කාර්ය මණ්ඩලයට සහ ඔවුන්ගේ පවුල් වලට සාමාජිකයන් හට සහභාගී විය නොහැක.
3. පළමුවන, දෙවන හා තුන්වන ජයග්‍රහණ හිමි කර ගන්නා ජයග්‍රාහකයින් පිළිවෙලින් රු. 1000/=, රු. 750/=, රු. 500/= වශයෙන් මුදලින් තෑගි ලබා දීමට තීරණය කර ඇත.
4. විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසාන තීරණය ලෙස සැලකේ
5. ප්‍රහේලිකා අංක 21 හි නිවැරදි විසඳුම් 2004 ජුලි 31 දිනට පෙර එවිය යුතුයි.
6. නිවැරදි පිළිතුරු එකකට වඩා ඇත්නම් කුසපත් ඇදීමෙන් තෝරාගනු ලබන ජයග්‍රාහකයින් තිදෙනෙකු සඳහා පමණක් තෑගි ලබා දීම සිදු කෙරේ.
7. පිළිතුරුපත් එවන ලියුම් කවරයේ වම්පස උඩ කෙලවරේ "වයිට් හැකල් ප්‍රහේලිකා අංක 21" යනුවෙන් සඳහන් කළ යුතුයි

ලිපිනය : වයිට් හැකල් කර්තෘ
වයිට් හැකල් ප්‍රකාශන අංශය
රෙම ශ්‍රීලපාහ
පනාගොඩ
හෝමාගම

## කූපනය

අංකය : ..............................

නිලය : ..............................

නම: ..............................

රාජකාරී ලිපිනය: ..............................

..............................

..............................

ඒකකය: ..............................

හැ.පත් අංකය: ..............................

# අන්තර් රෙජි කබඩි තරඟයේ විශේෂ අවස්ථා



ප්‍රධාන අමුත්තා වූ මේජර් ජනරාල් පී.බී.ඩබ් ජයසුන්දර ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී තරඟ කරුවන් හඳුනා ගැනීම__



ප්‍රතිවාදියකු ග්‍රහණයට නතු කරගැනීමට සැරසෙමින්...



අනුශූරතාවයේ කුසලානය ලබා ගත් මොහොත...



අනුශූරතාවය හිමිකරගත් ශිල්පාභ කණ්ඩායම මඩ්‍යස්ථාන සේනාවිධායක මානි1(පාලන/භකාස) සහ ක්‍රීඩා භාර නිළධාරී සමග.....

# රෙජි ශිල්පාභ-රෙසැමේතනතුර භාරදීම්/ භාරගැනීම් 2004.02.27 දින.



බනි1 ජේ.එම් ජයසිංහ බන්ඩා විසින් රෙසැමේ තනතුර භාර දීමට ප්‍රථම පොල්තෙල් පහන දැල්වීම....



රෙසැමේ තනතුර භාරදීම සඳහා සිය අත්සන තබමින්.....



නව රෙසැමේ සිය තනතුරේ වැඩ භාර ගැනීම....



බනි1 ජේ.එම් ජයසිංහ බන්ඩා විසින් රෙසැමේ තනතුරේ සංකේතය වූ යෂ්ඨිය (කෙන්මලක්කා) භාර දෙමින්....



මේජර් ජනරාල් සීජේ රණවීර ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී සමුගැනීමේ සාදයේදී
රෙජිමේන්තු අධිපති ඇතුළු ශ්‍රීලපාහ මේජර් ජනරාල් වරුන් සමග ඡායාරූපයකට පෙනී සිටි අවස්ථාව .